**2025.11.11 වන දින පැවති ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ.**

**සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව.**

මෙදින පෙ.ව 9.30 ට සාමාන්‍ය මහා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා | ගරු සභාපති |
| 02. | ගරු මන්ත්‍රී යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | ගරු උප සභාපති |
| 03. | ගරු මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා | සභික |
| 04. | ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා | සභික |
| 05. | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා | සභික |
| 06. | ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා | සභික |
| 07. | ගරු මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය | සභික |
| 08. | ගරු මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය | සභික |
| 09. | ගරු මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා | සභික |
| 10. | ගරු මන්ත්‍රී කේ.ජී.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා | සභික |
| 11 | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා | සභික |
| 12 | ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා | සභික |
| 13 | ගරු මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා | සභික |
| 14 | ගරු මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය | සභික |
| 15 | ගරු මන්ත්‍රී කේ.ඩබ්.ජී.නදුන් සමීර මැතිතුමා | සභික |
| 16 | ගරු මන්ත්‍රිනී එස්.ජී.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය | සභික |
| 17 | ගරු මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා | සභික |
| 18 | ගරු මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා | සභික |
| 19 | ගරු මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා | සභික |
| 20 | ගරු මන්ත්‍රී ජී.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා | සභික |
| 21 | ගරු මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා | සභික |
| 22 | ගරු මන්ත්‍රී ජී.එස්.එම්.මිස්බාහ් මැතිතුමා | සභික |
| 23 | ගරු මන්ත්‍රී ජී.ටී.සී.අතුරලිය මැතිතුමා | සභික |
| 24 | ගරු මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා | සභික |
| 25 | ගරු මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය | සභික |
| 26 | ගරු මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා | සභික |
| 27 | ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා | සභික |
| 28 | ගරු මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක් මැතිතුමා | සභික |
| 29 | ගරු මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා | සභික |
| 30 | ගරු මන්ත්‍රිනී පී.ජී.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය | සභික |
| 31 | ගරු මන්ත්‍රී.ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා | සභික |
| 32 | ගරු මන්ත්‍රී.එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා | සභික |
| 33 | ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා | සභික |
| 34 | ගරු මන්ත්‍රිනී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය | සභික |
| 35 | ගරු මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා | සභික |

**නොපැමිණීම්:-**

*ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා

01.ඩී.බී.මනොජ්තිවංක මයා සභාවේ ලේකම් ලෙස සහභාගීවිය.

**සභාපතිතුමා :-**
2025.11.11 වන දින පැවැත්වීමට නියමිත මහා සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරිමට තමා අපි මේ සූදානම් වෙන්නේ.පැමිණ සිටින උපසභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන්, ඉතාම ආදරයෙන් පිළි ගන්නවා. ඒ වගේම ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඒ වගේම ප්‍රාදේශීය සභාව නියෝජනය කරන නිලධාරීන් දෙපල ඒ වගේම මාධ්‍යවේදී සහෝදර හිතවතුන් සියලු දෙනාටම සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරමින් අපි සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීමට සූදානම් වෙනවා.

**සභාපතිතුමා :-**
ප්‍රථමයෙන් ම තිබෙන්නේ පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

**01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.**

**01.01.**2025-10-14 වන දිනපැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සභා සම්මත කිරීමටයෝජනා කරමි.

සභා වාර්තාවේ සංශෝධන තිබේ නම් මේ අවස්ථාවේ සංශෝධන ඉදිරිපත් කරන්න.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,මම 2025-1.-14 වන දින පැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සභා සම්මත කරමි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025-10-14 වන දින පැවති සාමාන්‍ය මහා සභා වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**02.සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන විශේෂ නිවේදන.**

කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**03.මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා එවා ඇති ලිපි සභා ගත කිරීම.**

**සභික ඩී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමා අසනීප තත්වයේ පසුවන නිසා අද දින මහ සභාවට පැමිණිය නොහැකි බව දන්වා එවා තිබෙනවා.එම නිසා මම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමාට නිවාඩු අනුමත කරන ලෙස ගරු සභාවට යෝජනා කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව විජේසූරිය මැතිතුමාට නිවාඩු අනුමත කරන ලෙස කළ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**04.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.**

කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**05.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**06.යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**සභාපතිතුමා :-**
06.01. සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
**06.01.වැවිල ට්‍රාන්ස්ෆෝමරය අසල මහ කුඹුර දක්වා යන මාර්ගයේ ආරම්භක ස්ථානයට හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගැටහැත්ත සිට කුඩගම දක්වා මාර්ගය පසුගිය රජයන් විසින් කාපට් අතුරා සංවර්ධනය කර තිබෙනවා.වැව්ල ට්‍රාන්ස්පෝමරය අසල සිට මහ කුඹුර දක්වා දිවෙන මාර්ගයත් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කරල තියෙන්නේ.නමුත් කාපට් අතුරපු මාර්ගයේ සිට කොන්ක්‍රීට් කරල පාර පටන් ගන්න තැන ඒ දෙක අතර ප්‍රදේශයේ අඩි 04 ක පමණ ප්‍රමාණයක කාණුවක් හැදිලා තිබෙනවා.එතනින් වැහි කාලයට ගමන් කිරීම ගොඩක් අපහසුයි. එතනට මම යෝජනා කරන්නේ හියුම් පයිප්ප 02ක් දාල,පොඩි ප්‍රමාණයක් තියෙන්නේ.ලොකු වියදමක් යන් නැ.එතන සංවර්ධනය කරල දෙන්න කියල මං යෝජනා කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමාගේ 6.1 යෝජනාව, වැව්ල ට්‍රාන්ස්ෆෝමරය අසල මහ කුඹුර දක්වා යන මාර්ගයේ ආරම්භක ස්ථානයට හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.02.සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණියගේ යෝජනාව.

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය:-**
**06.02.ඇහැලියගොඩ වත්ත අංක 01 කොටසේ ක්‍රීඩාපිටියේ සිට අංක 13 ලැයින් කාමරය දක්වා යන මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.(මීටර් 200 ක් පමණ දුරට,අඩි 08 ක් පමණ පළලට)**

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය :-**
ගරු සභාපතිතුමනි, මෙම මාර්ගය වතු කම්කරු පාසල් ළමුන් ගමන් කරන මාර්ගයක්.එම මාර්ගයේ වලවල් හැදිලා වතුර පිරිල, කැඩිල තියෙන්නේ. දැනට වාහනයක්වත් යන්න බැරි තත්වයක් තියෙන්නේ. රාත්‍රී කාලයේදී පවා වාහනයක යන්න බැහැ. ගමන් කරන්නත් ගොඩක් අපහසු තත්වයක් තිබෙන්නේ. වීථි පහන්වත් නැති පාරක්. එම නිසා ,එම පාර ඉක්මනින් හදල දෙන්න කියල මම යෝජනා කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණියගේ 06.02 යෝජනාව, ඇහැලියගොඩ වත්ත අංක 01 කොටසේ ක්‍රීඩාපිටියේ සිට අංක 13 ලැයින් කාමරය දක්වා යන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව (මීටර් 200 ක් පමණ දුරට,අඩි 08 ක් පමණ පළලට) මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.03.සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණියගේ යෝජනාව.

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය:-**
**06.03.ඇහැලියගොඩ වත්ත අංක 01 කොටසේ රොෂාන් මහතාගේ නිවස අසල සිට කෝවිල දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.(150m)**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ වත්ත අංක 01 කොටසේ රොෂාන් මහතාගේ නිවස අසල සිට කෝවිල දක්වා මාර්ගයේ මීටර් 150ක් පමණ තිබෙනවා.පාසල ළඟම තිබෙන පාරක්. ඒ පාර තියෙන්නේ ලයින් දෙපැත්තෙ.මැදින් කියෙන්නෙ පාර.පොඩි පාරක් .වාහන 02ක් මාරු වෙන්න ඉඩක් නැහැ.එහි තිබෙන කෝවිලට ජනතාව ගමන් කරන්නේ එම මාර්ගයෙන්.කෝවිලේ උත්සව දවසට විශාල ජනතාවක් එම මාර්ගයෙන් කෝවිලට එනවා. එම පාර කැඩිල නිසා ජනතාවට කෝවිලට යන්න බැහැ. වැසි කාලයට වලවල් හැදිල වතුර පිරිල ,ලිස්සන ගතියක් තිබෙනවා.එම නිසා එම පාරත් හදල දෙන්න කියල මම යෝජනා කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණියගේ 06.03 යෝජනාව, ඇහැලියගොඩ වත්ත අංක 01 කොටසේ රොෂාන් මහතාගේ නිවස අසල සිට කෝවිල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව (150m) මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.04 සභික එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.04.යාය පාර පළමු පටුමග ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, යාය පාරට යන පාර කොන්ක්‍රීට් කරල තියෙනවා.එතනින් අතුරු පාරක් මේක. පවුල් 40 ක් පමණ ජීවත් වෙනවා. වැසි කාලයට මඩ වෙලා යන්න අපහසුයි.එම නිසා එම මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ 06.04 යෝජනාව, යාය පාර පළමු පටුමග ඉතිරි කොටස සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.05 සභික එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.05.ශ්‍රී සුමන පිරිවෙන අසල ඇති කාණු පද්ධතිය මත කොන්ක්‍රීට් ලැලි දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, බුළුගහපිටිය ශ්‍රී සුමන පිරිවෙන අසල වංගුවත් සමඟම ඇති කාණු පද්ධතිය කොන්ක්‍රීට් කරල තියෙන්නේ. මෙම කාණු පද්ධතිය ලැලි දමල සංවර්ධනය කළහොත් එම ස්ථානයෙන් ගමන් කරන පදිකයන් හට යාමට අවස්ථාවක් ලැබෙනවා.මේ වංගුව අවධානම් තැනක් මේ වංගුව.පිරිවෙනේ ලොකු හාමුදුරුවොත් මේක යෝජනා කළා. එම නිසා මෙය ක්‍රියාත්මක කරන ලෙස මම යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ 06.05 යෝජනාව**,** ශ්‍රී සුමන පිරිවෙන අසල ඇති කාණු පද්ධතිය මත කොන්ක්‍රීට් ලැලි දමා සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.06 සභික එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.06.ඉහළ බුළුගහපිටිය මෛත්‍රී මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඉහළ බුළුගහපිටිය මෛත්‍රී මහතාගේ නිවස අසල සිට පාර අබලන් තත්වයේ තියෙන්නේ.පවුල් 30 ක් 40 ක් ප්‍රමාණයක් මෙම මාර්ගය භාවිතා කරනු ලබනවා. එම නිසා මෙය සංවර්ධනය කර දෙන ලෙස මම යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ 06.06 යෝජනාව**,** ඉහළ බුළුගහපිටිය මෛත්‍රී මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.07. සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර :-**
**06.07.කිරිපෝරුව මැල්වත්ත හරහා වැල්කන හේන්යාය පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කිරිපෝරුව මැල්වත්ත සිට වැල්කන හේන්යාය පාරෙ තැනින් තැන කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කර තිබෙනවා.නමුත් වැසි කාලයට ජලය ගලාගෙන ගොස් වාහන ගමනාගමනයට අපහසු තත්වයක් ඇති වෙලා තිබෙනවා. තේ ඉඩම් රාශියක් තිබෙනවා .පවුල් සෑහෙන ප්‍රමාණයක් එම ප්‍රදේශයේ ජීවත් වෙනවා.එම නිසා එම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස මම යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ 06.07යෝජනාව, කිරිපෝරුව මැල්වත්ත හරහා වැල්කන හේන්යාය පාර කොන්ක්‍රිට් කර සංවර්ධන කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.08. සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර :-**
**06.08.කිරිපෝරුව දොළේ කඩේ අසල පාලමේ පැති ඇඳි ගැලවී ඇති බැවින්, පළාත් සභාව මඟින් එම පැති ඇඳි දෙකක් සවි කිරිමට යෝජනා කරමි.**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,දැන් සැහෙන කාලයක පටන් කිරිපෝරුව දොළේ කඩේ අසල, අපේ තුෂාරී මන්ත්‍රිතුමියගේ කඩේ අසල එම පාලමේ ඇඳි දෙක ගැලවී තිබෙනවා. එය කරන්නට හැකියාව ලැබෙන්නේ පළාත් සභාව හරහා පමණයි. ප්‍රාදේශිය සභාව හරහා පළාත් සභාව දැනුවත් කර, එම පැති බැමි දෙක සවි කිරීමට මම යෝජනා කරනවා. එය ඇත්ත වශයෙන් ම ඉතාමත් අවශ්‍යම දෙයක් .එම මාර්ගය පිළිබඳව නොදන්නා අයෙක් ගමන් කිරීමට ගියහොත් ඇළට වැටෙනවා. එම නිසා එම කටයුත්ත කඩිනමින් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය :-**
ගරු සභාපතිතුමනි, දොළේ කඩේ අසල එම පාලමේ ඇඳි දෙකම අබලන් තත්වයේ තියෙන්නේ. මීරිපොල, ගැටහැත්ත ප්‍රධාන මාර්ගයක්.ප්‍රධාන පාරේ බස් යන කොට ඒ ඇළටත් ළමයෙක් වැටුණා.පළාත් සභාවට යෝජනාවක් හැටියට දාල හරි සකස් කර දෙන උදව් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ 06.08 යෝජනාව, කිරිපෝරුව දොළේ කඩේ අසල පාලමේ පැති ඇඳි ගැලවී ඇති බැවින්, පළාත් සභාව මඟින් එම පැති ඇඳි දෙකක් සවි කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.09. සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර :-**
**06.09.නෑදුරන වෙලේ බෝධිය මාර්ගය සංවර්ධනය කර කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරමි.**

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිනිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, වෙලේ බෝධිය කියන එම පූජනීය ස්ථානයේ සැහෙන පිරිසක් ආගමික කටයුතු සිදු කරනු ලබනවා. එම නිසා එම ප්‍රදේශයේ ජනතාව ඉල්ලා සිටියා එම මාර්ගය කොන්ක්‍රීට් කිරීමට අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියලා.ඒ වගේ ම එම ප්‍රදේශයේ ජනතාවගේ ලිපියක් ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා වෙත ලබා දෙන්න මම පොරොන්දු වුණා.එම මාර්ගය කොන්ක්‍රීට් කරල සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ 06.09 යෝජනාව, නෑදුරන වෙලේ බෝධිය මාර්ගය සංවර්ධනය කර කොන්ක්‍රිට් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.10. සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
**06.10.කිරිපෝරුව පන්සල පිටුපස වලව්වත්ත ප්‍රදේශයේ වෙල අද්දර ඇති (අතහැර දමා ඇති) ළිඳ ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම ළිඳ බීමට හා නෑමට භාවිතාකර තිබෙනවා .දැනට අවුරුදු 10ක විතර කාලයක සිට අතහැර දමා තිබෙනවා.මෙය පාරිසරික ප්‍රශ්නයක් බවට පත්ව තිබෙනවා. ඩෙංගු උවදුරට සෘජුව බලපෑ හැකියි ඉදිරියට. වැස්සේ ස්වභාවයත් සමඟ.මෙය මම ඉඩම් අයිතිකරුවන් සමගත් සාකච්ඡා කළා.ඔවුන්ගේත්

විරෝධතාවයක් නැහැ ප්‍රතිසංස්කරණය කරනවට. එමනිසා ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 06.10.යෝජනාව, කිරිපෝරුව පන්සල පිටුපස වලව්වත්ත ප්‍රදේශයේ වෙල අද්දර ඇති (අතහැර දමා ඇති) ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.11. සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
**06.11.වඩුගංගොඩ මාර්ගයේ කාණු පද්ධතියේ ඉතුරු කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, වඩුගංගොඩ මාර්ගය සෘජුවම විජේනායක විද්‍යාලයේ පාසල් ළමුන් භාවිතා කරන මාර්ගයක්.පනාවල පාරට සම්බන්ධ වෙන.එහි විශාල සංවර්ධන කටයුත්තක් සිදුවෙලා තිබෙනවා. තව මීටර් කිහිපයක් එම කාණු පද්ධතිය සකස් කරල, කොන්ක්‍රීට් කැලි දැම්මොත් ළමුන්ට අපහසුතාවයකින් තොරව එම මාර්ගය භාවිතා කරන්න විශාල පිටුවහලක් වෙනවා. එම පාර පටුයි.කාණුවත් පාරට සම්බන්ධ කරගන්න පුළුවන් විදිහට සකස් කර ගතහොත්, වාහන අයින් කිරීමේ හැකියාවත් ළමයින්ට මාර්ගයේ ගමන් කිරීමේ හැකියාවත් සෘජුවම බලපානවා. විශාල වශයෙන් ප්‍රදේශවාසීන් මම හිතන්නේ දෛනිකව 500 කට වැඩි පිරිසක් භාවිතා කරන මාර්ගයක්.එය පිළිසකර කිරීම කාලෝචිතයි කියලා මම හිතනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 06.11.යෝජනාව, වඩුගංගොඩ මාර්ගයේ කාණු පද්ධතියේ ඉතුරු කොටස සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.12. සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
**06.12.කොහිලදෙනිය ජල ව්‍යාපෘතිය අළුත් වැඩියා කිරීම යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කොහිලදෙනිය ජල ව්‍යාපෘතිය සකස් කරලා දීර්ඝ කාලයක් වෙනවා.දැන් ඒක නඩත්තු කටයුත්තක් සිදු නොවුනහොත් ප්‍රතිලාභ ලබන පිරිසට පවා පානීය ජලය ලබාගැනීමේ අපහසුතාවයට භාජනය වෙමින් පවතිනවා මේ වෙන කොට. එම නිසා එය ක්‍රමානුකූලව ප්‍රතිසංස්කරණය කරලා නැවත ප්‍රවේයක් ගන්න පුළුවන්නම් පානීය ජල ප්‍රශ්නයට එම ප්‍රදේශයේ අයට ලොකු පිටුවහලක් වෙනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 06.12.යෝජනාව, කොහිලදෙනිය ජල ව්‍යාපෘතිය අළුත් වැඩියා කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.13. සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ යෝජනාව.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
**06.13.උඩදෙනිය මාර්ගය සංවර්ධනය කිරීමට (200 m බටහිර කලටුවාව) යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, බටහිර කලටුවාව අඹගස්යාය මාර්ගයේ අතුරු මාර්ගයක් මෙය.ගෙවල් 14ක් පමණ තිබෙනවා.මීටර් 200ක පමණ ප්‍රමාණයක් කොන්ක්‍රීට් කිරීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමාගේ 06.13.යෝජනාව, උඩදෙනිය මාර්ගය (200 m බටහිර කලටුවාව) සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.14. සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ යෝජනාව.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
**06.14.බටහිර කලටුවාව හල්දොල මාර්ගය සංවර්ධනය කිරීමට (200 m) යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, හල්දොල මාර්ගයත් අතුරු මාර්ගයක්.ගෙවල් 19 ක් පමණ තිබෙනවා. ඉතා ඉක්මනට ලබන වසරේදීවත් සංවර්ධනය කරදෙන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ 06.14.යෝජනාව, බටහිර කලටුවාව හල්දොල මාර්ගය (200 m) සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.15. සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ යෝජනාව.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
**06.15.බදුවත්ත හන්දියේ සිට කොස්වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට (200 m) යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම බටහිර කලටුවාව මාර්ගය දෙපස අතුරු මාර්ග බොහොමයක් තියෙනවා. එම නිසා මෙම මාර්ගයත් එම මාර්ගවලට අයත් මාර්ගයක් .එය සංවර්ධනය කිරීම කාලෝචිතයි කියල හිතනවා සභාපතිතුමනි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමාගේ 06.15.යෝජනාව**,** බදුවත්ත හන්දියේ සිට කොස්වත්ත මාර්ගය (200 m) සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
මේක මගේ යෝජනාවක්.

**සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා:-**
**06.16.කොත්තිල ගොඩැල්ල මාර්ගයේ පැති බැම්ම (දෙතැනක පාර කැඩී ඇත) 200 m ක් පමණ බැඳීම සඳහා යෝජනා කරමි.**

**උපසභාපතියූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා:-**
ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීතුමියනි, මෙම කොත්තිල ගොඩැල්ල මේ අවට කවුරුත් දන්නවා, පවුල් 20 ක් පමණ ප්‍රමාණයක් සිටිනවා. නමුත් එහි දෙපැත්ත පාරක් තිබුණට පාර සංවර්ධනය කරන්නත් යෝජනා කරල තිබුණත් කොන්ක්‍රීට් දාන්න ඉස්සර වෙලා පැති බැම්ම අපිට හදන්න තියෙනවා . කඩල ගිහින් තියෙනවා.එහෙම වුණොත් යන්න එන්න අමාරුයි. ඒ නිසා මෙය කාලෝචිත ඇතැයි මම විශ්වාස කරලා තමා මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.16.යෝජනාව, කොත්තිල ගොඩැල්ල මාර්ගයේ පැති බැම්ම (දෙතැනක පාර කැඩී ඇත) 200 m ක් පමණ බැඳීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.17. සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
**06.17.අලියමලහේන උඩ කොටස (වෙලින්ටන් මහතාගේ නිවසට යන පාරේ ආරම්භයේ සිට ) පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, දැඩි ලෙස අබලන් වූ අතුරු මාර්ගයක් මෙය. නිවාස 10 ක් පමණ තිබෙන අතුරු මාර්ගයක්. පයින්වත් ගමන් කරන්න නොහැකි අතුරු මාර්ගයක් නිසා මෙය සංවර්ධනය කිරීමට මම යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ 06.17.යෝජනාව, අලියමලහේන උඩ කොටස (වෙලින්ටන් මහතාගේ නිවසට යන පාරේ ආරම්භයේ සිට ) පාර සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.18. සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ යෝජනාව.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
**06.18.මැල්වත්ත ස්ටෝරුව ළඟ සිට ජී.ලීලාවතී මහත්මියගේ නිවස දක්වා අක්කර 15 මාර්ගය හියුම් පයිප්ප බෝක්කු දෙකක් ඇතුළුව මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මෙම මැල්වත්ත මාර්ගය පිහිටලා තියෙන්නේ දම්මුල්ල, කරඳන ප්‍රධාන මාර්ගයේ වමට තියෙන අතුරු පාරේ.රබර් වගාව වගේම තේ වගාවත් සිදුවන පළාතක්.ප්‍රතිලාභීන් බොහොමයක් ප්‍රතිලාභ ලබා ගැනීමට අපහසුවෙන් මෙම මාර්ගයේ ගමන් කරන්නේ. ලොකු වලවල් තියෙනවා. මැල්වත්ත රබර් ස්ටෝරුවත් තියෙන්නේ මේ පාරේ. ගොඩක් ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවයක් නිසා මෙම මාර්ගය සංවර්ධනය කිරීමට මම යෝජනා කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම එය කාලෝචිත යෝජනාවක්. සැහෙන පිරිසක් එයින් ප්‍රතිලාභ අත්විඳිනවා.එම නිසා එම කටයුත්ත කරල දෙන්න කියල ඉල්ලා සිටිනවා. ගියපාර මම එම යෝජනාව කොන්ක්‍රීට් කර සංවර්ධනය කර දෙන්න කියල යෝජනා කරල තිබුණා.

**සභාපතිතුමා :-**
යෝජනාව ඒ විදිහටම ද දාල තිබුණේ.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නෑ මම හියුම් පයිප්ප දාන්න කියලා තිබ්බෙ නෑ.

**සභාපතිතුමා :-**
මන්ත්‍රීවරයෙක් දාපු යෝජනාවක් නැවත දානවනම් නැවත මාස 06 ක ට වැඩි කාලයක් තියෙන්න ඕනි. ඒක ඔබතුමා පිළිගන්නව ද වෙනස් කියලා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
හියුම් පයිප්ප දෙකක් කියලා මන්ත්‍රීතුමිය දාල තියෙන්නේ.

**සභාපතිතුමා :-**
එහෙනම් කමක් නැහැ.ඔයාගේ පාර, මන්ත්‍රීතුමිය හියුම් පයිප්ප.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, සංවර්ධන කරන්න පක්ෂ පාට භේදයක් නැහැ. අපි එකතු වෙලා කරමු.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
එම මාර්ගයේ ආරම්භක කොටසත් දැන් පළුදු වෙමින් පවතිනවා.හියුම් පයිප්ප යොදා ඉදිරියට යන්න මුල ටිකත් හදලම යන්න තියෙනවනම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

**සභාපතිතුමා :-**
අපි එහෙම කරමු මන්ත්‍රීතුමා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ 06.18.යෝජනාව, මැල්වත්ත ස්ටෝරුව ළඟ සිට ජී.ලීලාවතී මහත්මියගේ නිවස දක්වා අක්කර 15 මාර්ගය හියුම් පයිප්ප බෝක්කු දෙකක් ඇතුළුව මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.19. සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ යෝජනාව.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
**06.19.කිරි අතුල මාර්ගය සංවර්ධනය කිරීම (පැති බැම්මක් සහිත 100m) මාර්ගය මීටර් 400 ක් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, කිරි අතුල මාර්ගය සංවර්ධනය කිරීම ගොඩක් කල් ඉඳලා මේ යෝජනාවල් අපිට ප්‍රදේශවාසීන්ගෙන් ඉල්ලීම් විදිහට ඇවිල්ලා තියෙනවා.එම මාර්ගය මීටර් 400ක් තියෙනවා. මීටර් 100ක් දුරට පැති බැම්මක් යොදල සංවර්ධනය කළහොත් සංවර්ධන කටයුතු සාර්ථකයි කියලා මම හිතනවා.එම සංවර්ධන කටයුත්ත කරලා දෙන්න කියලා යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ 06.19.යෝජනාව, කිරි අතුල මාර්ගය සංවර්ධනය කිරීම (පැති බැම්මක් සහිත 100m) මාර්ගය මීටර් 400 ක් සංවර්ධනය කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.20. සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව:-**
**06.20.ඉලුක්පිටිය සිට කැටම්රිස්පිටිය සිට මාර්ගය ඉදිරියට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.
**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම යෝජනාව ග්‍රාමීය සංවර්ධන කමිටු සැලැස්මේ ඇති අතර ගම්වාසීන්ගේ ඉල්ලීම පරිදි, මෙම සභාවට ඉදිරිපත් කරනු ලබනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ 06.20. යෝජනාව, ඉලුක්පිටිය සිට කැටම්රිස්පිටිය සිට මාර්ගය ඉදිරියට සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.21. සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව:-**
**06.21.වලව්ට දහම් මාවත ප්‍රදේශය වරිපනම් සීමාවට ඇතුළත් කිරිමට යෝජනා කරමි.**

**සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂබණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 122 ප්‍රධාන පාරට ආසන්නව පිහිටා ඇති මෙම ගම්මානය වෙන්දේසි ඉඩම් ලෑන්ඩ් සේල් එකක් තියෙන්නේ.පර්චස් 10 හා 15 වගේ ඉඩම් තියෙන්නේ.එම නිසා එම ජනතාව වරිපනම් සීමාවට ඇතුළත් කරන්න සුදුසු යැයි මම යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම දැනගන්න කැමතියි මෙම දහම් මාවත වරිපනම් ප්‍රදේශයක් ලෙස නම් කරන කොට එකිනෙක යාබද වෙන්න ඕනිනෙ.දැනට තියෙන වරිපනම් ප්‍රදේශයට එකතු වෙන්න ඕනි .එහෙම එකතු වෙලා ද තියෙන්නේ? එහෙම නැත්නම් හුදකලා ප්‍රදේශයක්ද ?

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂබණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේක වලව්ට පොල්අත්ත කඩේ ළඟ උඩ යාබදව තියෙන්නේ වරිපනම් සීමාව තුළ.

**සභාපතිතුමා :-**
වරිපනම් එකතු කරන කොට වෙනම කොන්දේසි ටිකක් තියෙනවා ගරු මන්ත්‍රීතුමා. ඒකත් එක්ක ගළපලා බලලා දැනට ගන්න මීටර් ප්‍රමාණයත් එක්ක බලලා දියුණු ගම් ප්‍රදේශයක් කියන පදනමින් තමයි එම කටයුතු සිදු කරනු ලබන්නේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ 06.21. යෝජනාව, වලව්ට දහම් මාවත ප්‍රදේශය වරිපනම් සීමාවට ඇතුළත් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.22. සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව:-**
**06.22.ප්‍රාදේශීය සභාව විසින් කරගෙන යන කසළ කළමණාකරණ වැඩසටහන විධිමත් කිරීම සඳහා වරිපනම් සීමාව ඇතුළත කසළ කළමනාකරණය පිළිබඳව සම්පත් දායිකයින්ගේ අනුග්‍රාහක දායකත්වය ලබා ගෙන ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂබණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දැනට ප්‍රාදේශිය සභාව විසින් කසළ කළමනාකරණය විධිමත්ව සිදු කර ගෙන යනවා. එම වැඩසටහන සාර්ථක කර ගැනීමට වරිපනම් සීමාවේ සිටින ජනතාවගෙනුත් සහයක් ලබාගැනීම සඳහා යම් දැනුවත් කිරීමේ වැඩසටහනක් එම ජනතාව වෙනුවෙන් සභාව විසින් අත්පත්‍රිකා බෙදා දීමක් සිදුකර හෝ දැනුවත් කිරීමේ වැඩටහනක් අදියර වශයෙන් කරගෙන යමු කියා මම අදහසක් ලෙස ඉදිරිපත් කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම දැන ගන්න කැමතියි ඒ වෙනුවෙන් එතුමා කුමක් හෝ ව්‍යාපෘතියක් ඉදිරිපත් කරල තියෙනවද? ඒක අපි දැන ගන්න අවශ්‍යයි. ප්‍රාදේශිය සභා මැතිවරණයට කලින් මම දැක්කා විශේෂයෙන් සමාජ මාධ්‍ය තුළ ඔබතුමන්ලා විසින් ඒ කසළ කළමනාකරණය පිළිබඳ වැඩසටහනක් තියෙනවා කියල කිව්වා.නමුත් අද අපි දකිනවා බෝගහ ළග ඉදන් පනාවල පාරෙ යන කොට විශේෂයෙන්, ඊට අමතරව මෝරගල ඉදන් ටවුන් එකට එන බයිපාස් එකෙත් තැනින් තැන කුණු දාල තියෙනවා.ඒක නිසි පරිදි මාස 06ක් ගිහිල්ලත් කළමනාකරණය වෙලා නැහැ. හැබැයි ඡන්දෙට කලින් තිබ්බ වැඩපිළිවෙල ක්‍රියාත්මක වුණා නම් ඒ කියපු විදිහට මේවනවිට පිරිසිදු නගරයක් අදවන විට නිර්මාණය වෙලා තියෙන්න ඕනි.නමුත් අපිට ප්‍රශංසා කරන්න පුළුවන් මට්ටමට ඒ කසළ කළමනාකරණ ක්‍රියාවලිය තවදුරටත් සිද්ධ වෙන්නේ නැහැ. ඒ වෙනුවෙන් එතුමා කියපු යෝජනාව ව්‍යාපෘතියක් විදිහට ඉදිරිපත් වෙලා තියෙනවද? ඒ ව්‍යාපෘතිය මේ සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්නම් අපිටත් පුළුවන් ඒ වෙනුවෙන් අදහස් දක්වල මේ සඳහා සහයෝගය දෙන්න.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානයට,දිලීන් මන්ත්‍රීතුමා කිව්වා වගේ ව්‍යාපෘතියක් අපි යෝජනා කරල තියෙනවා. පසුගිය පරිසර කමිටුවෙදි කසළ කළමනාකරණය සඳහා කමිටුවක් කැඳෙව්වා. ඒක පුළුල් කරල කැඳෙව්වේ. වෙළඳ ප්‍රජාව ඇතුළු සියලුම ආයතන සම්බන්ධ වුණා. ඒකෙදි ගත්ත තීරණයක් තමයි. සියලුම කසළ එකතු කිරීමක් වෙන්නේ නැහැ. ඒ නිසාම තමයි මිනිස්සු තැන් තැන්වල කුණු දාල යන්නේ. ඒ නිසා කොළඹ -රත්නපුර A4 මාර්ගයේ අපිට අයිති සීමාවෙ දෙපැත්තෙ තියෙන වසම් වල මාසෙට එකපාරක් ප්ලාස්ටික් සහ පොලිතීන් එකතු කරන්න ට්‍රැක්ටර් යවල,එකතු කරගෙන ඇවිල්,බේල් කරල ඊට පසුව විකිණීම සඳහා අපි දැනට ව්‍යාපෘතියක් සකස් කරල තියෙනවා. සම්පත් දායකයන් එකතු කරගෙන ඒ ගැන දැනුවත් කිරීමට.කසළ කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ අපිට ප්‍රශස්ථ අදහසක් තියෙනවා.ඒක කොතෙන්ට එනකන් නිවැරදි වෙන්න ඕනිද? ජපානය තරම් නිවැරදි වෙන්න පුළුවන්නම් තවත් හොඳයි. ජපානය වගේ කසළ කළමනාකරණය දියුණු වෙන්න තමයි අපේ බලාපොරොත්තුව.නමුත් එතෙන්ට යන්න අපිට අඛණ්ඩ ක්‍රියාවලියක් තියෙනවා. ඒක දිනපතා දෛනික ක්‍රියාවලියක් .එයට ප්‍රතිපත්ති සම්පාදකයන් වන අපි,සෞඛ්‍ය කාර්යමණ්ඩලය,මහජනතාව යන මේ තුන්ගොල්ලන්ම ඒකාබද්ධව කරගෙන යා යුතුයි. ඒ නිසා ඒ ගැන දැනුවත් කිරීමට තමයි අපේ අමිල් නිමේෂ මන්ත්‍රීතුමා ඒ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට තමා මේ යෝජනාව ඉදිරිපත් කළේ. කමිටුවෙදි දා ගත්ත යෝජනාවම තමයි ඌණ පූර්ණයක් ලෙස මහ සභාවට ඉදිරිපත් වෙන්නේ. ඒකෙදි අපි බලාපොරොත්තු වෙනවා දිවුරුම්පිටියේ ඉදන් මාහර දක්වා පාර දෙපැත්තෙ වන සියලුම වසම් වල එය ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කසළ කළමනාකරණය ඇත්තටම සිදු විය යුතු දෙයක් .තෝරාගත් වසම් 15ක් . දිවුරුම්පිටිය සිට මෙතුමා නියෝජනය කරන වියලගොඩ වසම දක්වා තමයි එය සීමාව දක්වලා තියෙන්නේ.මං වරදි නම් නිවරදි කරන්න.සෑම වසමකම ප්‍රාදේශිය ලේකම්තුමියට ඉදිරිපත් කරල තියෙනවා ග්‍රාම නිලධාරී හරහා කසළ එකතු කරන ස්ථාන හඳුනා ගෙන දැනුම් දෙන්න කියලා.වැරදි නම් නිවැරදි කරන්න. අදාළ වසම්වල කසළ එකතු කරන්න ස්ථාන හඳුනාගෙන දැනුම් දෙන්න කියලා.එවිට එයින් අපේක්ෂා කරන්නේ මොකක්ද? දීර්ඝ කාලයක් එතන තියල තියෙනවද ? වැඩපිළිවෙල මොකක්ද? පැහැදිලි කරන්න පුළුවන්නම් වඩාත් හොඳයි.මගෙනුත් කිහිපදෙනෙක් ඇහුවා ස්ථානයක් දෙන්න.දුන්නාම ඒක කළමනාකරණය වෙන විදිහ සම්බන්ධව ගැටළුව නිසා දෙන්න පොඩි මැලිකමක් දක්වනවා. අපිටත් හොඳයි ඒ යෝජනාව. දෙන්න පොඩි දායකත්වයක් පොඩි පැහැදිලි කිරීමක් අවශ්‍යයි එය ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, එතුමා කිවුව එක හරි.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් එක්ක ඒකාබද්ධව තමා මේ වැඩේ කෙරෙන්නේ.වසම් 16 ම ග්‍රාම නිලධාරීවරුන් සම්බන්ධ කර ගෙන. එයාලගෙ Whats app Group තියෙනවා ජනතාව දැනුවත් කරන්න. එයාලව සම්බන්ධ කර ගන්න. ඒවටත් මේ පණිවිඩය යවනවා. උදාහරණයක් ලෙස දිවුරුම්පිටිය ගත්තොත් අපි දිවුරුම්පිටියට යනවා එක දවසක .ගෙවල් වල එකතු කර ගන්න කියල ප්ලාස්ටික් පොලිතීන් වෙන වෙනම අපද්‍රව්‍ය රහිතව.ඒව අපි ට්‍රැක්ටරය යන දවස හා පාර කලින් දැනුවත් කරනවා.එවිටග්‍රාම නිලධාරීතුමා වෙන්කර දෙනවා ස්ථානයක් .එක දවසකට විතරයි එතන තියෙන්නේ. එතනට ගිහින් අපි ඉක්මනින් ලබා ගන්නවා. මොක ද සෑම නිවසකටම ට්‍රැක්ටරය අරන් යන්න බැරි නිසා. දිවුරුම්පිටිය ගත්තොත් අපිට පාරවල් දෙකක යන්න වෙනවා. වික්‍රමසිංහගම පැත්තට හා රාජ්‍ය සේවක ගම පැත්තට යන්න වෙනවා.ප්‍රධාන පාර දෙපැත්තේ පාරවල් දෙකක් තිබෙනවා. ඒ අනුව යන පාර කෙතනද තියන්නේ කියන එක ගැන ග්‍රාම නිලධාරීතුමාගෙන් විමසලා ඒකාබද්ධව යන වැඩක් විදිහට තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ. එවිට Whats app Group එකක් මෙයට හදල තියෙනවා .ඉදිරියේදී සම්පූර්ණ ව්‍යාපෘති සැලැස්ම සභික මණ්ඩලයේWhats app Group එකට දාන්න බලාපොරොත්තු වෙනවා.

**සභාපතිතුමා:-**

කසල ගැන කතා කළොත් එකක් තමයි, යන්ත්‍රෝපකරණ වල අඩුපාඩුවක් තියෙනවා. ට්‍රැක්ටර් රථ 05 ක් තිබුණට 03 යි ක්‍රියාත්මක තත්වයේ තියෙන්නේ. ට්‍රැක්ටර් රථ 02ක් හදන්න දාල තියෙනවා ගරාජ් වලට.රාජ්‍ය තන්ත්‍රියේ වැඩ යනකොට ප්‍රසම්පාදන ක්‍රියාවලිය යනකොට යම් කිසි කාලයක් යනවා.මම ඊයෙත් මැදිහත් වුණා විශේෂයෙන ම මීන්නාන ප්‍රදේශයේ කසළ යනවා .එතන කසල දාල යන්නේ ඉද්දමල්ගොඩ පාරෙ අය, නගරයෙ අය නෙමෙයි. ඉහළ ගම්වල අය දාල යනවා. කැමරා වෙක් කළා .ඒ ස්ථානයට කැමරාවක් නැහැ.එම නිසා අපි යෝජනාවක් කළා.එක මහත්මයෙක් අපිට කැමරා වගයක් දෙනවා කිවුවා.හඳුනාගත්ත තැන් තියෙනවා මේ වැඩේ කරන්න. දිලීන් මන්ත්‍රීතුමා කිවුවා වගේ අපිට ආකල්ප වශයෙනුත් ප්‍රචාරයක් කරන්න වෙනවා. නිමේෂ් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව අනුව, අපි කසළ අංගනයේත් ඉදිකිරීම් වගයක් කරනවා.කොම්පෝස්ට් එකක් සහ වෙනත් යන්ත්‍රෝපකරන වගයක් ලබාගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයට ඉල්ලීම් වගයක් කරල තියෙනවා. අපිට ලොකු විශ්වාසයක් තියෙනවා ඒවා ඉක්මනින් ලැබෙයි කියලා.ඊට අමතරව Whats app Group එකක් හදල ට්‍රැක්ටරය යන වෙලාව නිසි ලෙස කළමනාකරණය කරනවා. සමහර ඒව තියෙනවා ට්‍රැක්ටරය යන්න බැරි පාරවල් .ඒවා අපිට ලොකු ගැටළුවක්.උදාහරණයක් ලෙස කොත්විල පාරට ට්‍රැක්ටරය යන්න බැහැ. ඒ නිසා ට්‍රැක්ටරය තියෙද්දී ඔබතුමන්ලා දැකල ඇති මහ නගර සභා වල තියෙනවා පොඩි කරත්ත. ඉතින් අපි කරත්ත 10ක් ඉල්ලා තිබෙනවා. මම හිතන්නේ මේ අවුරුද්ද අවසාන වීමට පෙර දෙසැම්බර් මාසයේදී ඒ කරත්ත 10ත් ලබාගන්න පුළුවන් වෙයි.එහෙම උනොත් අපිට පුළුවන් මෙය නිවැරදිවම කළමනාකරණය කර ගෙන මේ වැඩේ කරන්න.එතෙක් අපිට පොඩි කාලයක් යාවි. බොහොම ස්තුතියි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ 06.22. යෝජනාව, ප්‍රාදේශීය සභාව විසින් කරගෙන යන කසළ කළමණාකරණ වැඩසටහන විධිමත් කිරිම සඳහා වරිපනම් සීමාව ඇතුළත කසළ කළමනාකරණය පිළිබඳව සම්පත් දායිකයින්ගේ අනුග්‍රාහක දායකත්වය ලබා ගෙන ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් අදියර වශයෙන් ක්‍රියාත්මක කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය

**සභාපතිතුමා :-**

06.23. සභික ආර්. වත්සලා නිශාන්ති ධනරත්න මැතිණියගේ යෝජනාව.

**සභික ආර්. වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**

**06.23. ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග දෙපස වැවී ඇති මාන පඳුර ඉවත් කිරීම සඳහා බෙහෙත් ගැසීමට යෝජනා කරමි.**

**සභික එච්.එල්.දීපාල් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ආර්. වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශිය බල ප්‍රෙද්ශය පුරා ගොවිතැන් කරගන්න බැරි වෙලා තියෙන්නේ,පාරක ගමන් කරන්න බැරි වෙලා තියෙන්නේ මෙ මාන පඳුරු නිසා.හොරගොඩ ප්‍රදේශයේ මෙම මාන පඳුරු ඉවත්කර දෙන්න කියලා මම සභාවෙන් ඉල්ලපු වෙලේ, පාර දෙපැත්තේ තියෙන මාන පඳුරු ඉවත් කරල, පාරේ යන්න පුළුවන් තත්වයට හදල දුන්නත්,මේ වන විට නැවත ඒක පඳුරු දාල ඉවර වෙලා ලියලමින් පවතිනවා. මේ සම්බන්ධව මම එක් ස්ථානයකදී කථා කළ විට එක් මහත්මයෙක් කිවුවා ඇඹිලිපිටිය ප්‍රදේශයේ තියෙයි කියලා ඉලුක් තෙල් කියලා වර්ගයක් .ඇත්තටම මෙය යුද්ධය නවත්වනවා හා සමානව කුඩු වලට පිළියම් හොයනවා හා සමානවම, ලොකුවටම ව්‍යාප්ත වන වැඩක් නැති පඳුරු විශේෂයක්.මේ හේතුව හින්දම හොරගොඩ ,දීගල්ල,විලේගොඩ ප්‍රදේශයේ මේ මාන පඳුරු වැවිල හින්දම ගොවිතැන් කරගන්න බැරි වෙලා තියෙනවා. එම නිසා මම හිතනවා ඉලුක් තෙල් කියන එක එම ප්‍රදේශයේ භාවිත කරනු ලබන්නේ උක් ගස් ගලවා විනාශ කරන්න.එවිට ඒවා මැරෙනවලු. මේක නිකන් කෙනෙක් කියපු එකක් පමණයි.ඊට අමතරව වෙනත් බෙහෙත් වර්ගයක් හරි යොදල මෙම මාන පඳුරු ඉවත් කරලම දාන්න කටයුතු කරනව නම් සුදුසුයි කියල මම යෝජනා කරනවා.

**ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, වල් බෙහෙත් ගහන එකනම් අනුමත කරන්න බැහැ. වෙන විකල්පයක් ගන්න වෙනවා. සතුන් ඉන්නවා සහ ජල මූලාශ්‍ර තිබෙන නිසා කුමක් හෝ පියවරක් ඉදිරියට ගත යුතු වෙනවා.වල් බෙහෙත් කියන එක අපිට අනුමත කරන්න පුළුවන් දෙයක් නෙමෙයි.මොකක් හරි පියවරක් ඉදිරියට යන්න වෙනවා.පරිසර පද්ධතියත් එක්ක ගැටෙන නිසා.යෝජනාවට විරෝධතාවයක් නෙවෙයි. අපි වෙනත් ක්‍රමයටකට මෙය සිදු කරමු.මෙය අසීරු කාර්යයක් විය හැකියි. නමුත් වල් බෙහෙත් වලට සීමාවක් නැහැ.වල් පැළ අතරෙ වෙනත් පැළෑටි තියෙනවා.සභාවක් ලෙස තීරණයක් ගන්න අමාරුයි මම හිතන්නේ.ළිං තියෙනවා.ඒ යෝජනාවේ තියෙන ගැටළුව තියෙන්නේ, වල් බෙහෙත් කියන එකේ ගැටලුව තියෙන්නේ රසායනික ද්‍රව්‍ය කොහොමද පරිසරයට මුදා හරින්නේ.ප්‍රමිතිය පිළිබඳව සැලකිලිමත් වෙන්න වෙයි කියල හිතෙනවා. සභාව වගේ තැනකදී ගන්න තීරණ ඉතා වැදගත් වන නිසා.

**කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒකෙම දිගුවක් කරන්න කැමතියි. පළාත් සභාව මගින් පාර දෙපසත් ඒ වගේ කැලේ කපනව මැෂින් දාල.ඒකෙදි පහුගිය කාලෙක බෙහෙත් ගහල තිබුණ. මම ඒ ගොල්ලන්ගෙන් ඒ ගැන ප්‍රශ්න කළා. ප්‍රශ්න කරන්න හේතුව උනෙත් ඒ මිනිස්සු මගෙන් ප්‍රශ්න කළා ඇයි එහෙම කරන්නේ ඒක වැරදි වැඩක් බෙහෙත් ගහන්න දෙන්න එපා පාර දෙපැත්තෙ කියල.අර වජිර මන්ත්‍රීතුමා කියපු දේ ම තමා. මම නැවත පැහැදිලි කල යුතු නැහැ. පරිසර විනාශ වෙනවා. ජල මූලාශ්‍ර වලට එකතු ඉඩ තියෙනවා. පාර දෙපැත්තේ බෙහෙත් ගැහුවහ ම එහි අනතුරුදායක තත්වයක් තියෙනවා. අපේ මන්ත්‍රීතුමිය කරපු යෝජනාව හොඳ යෝජනාවක් .බෙහෙත් නොගසා වෙන විකල්පයකට යන්න පුළුවන්නම් හොඳයි. ගම්වල මිනිස්සුන්ගේ අප්‍රසාදය ඇති වෙනවා. බෙහෙත් ගහන්න දෙන්නෑ. මම ඒක නැවැත්තුවා. ගම්වල ජනතාව කැමති නෑ ඒකට.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම තණකොළ වර්ගය අපේ රටේ එකක් නෙමෙයි. පිටරටින් මෙහෙට ගෙන්නපු කිරි ගවයන් සඳහා ඒ කිරි ගවයන්ට ආහාර සඳහා ගෙන්වපු තණකොළ එකක්. වැසි කාලයට ඒවයේ ඇට හැමතැනම ව්‍යාප්ත වෙලා තමයි දැන් මෙම පරිසර හානියට ලක්වෙලා තියෙන්නේ. මෙය මැඩපවත්වා ගන්න ඉතාමත් ලේසි කාරණයක් නෙවෙයි.ඒ ඇට කොහේ තිබුණත් පැළ වෙනවා. වත්සලා මන්ත්‍රීතුමිය කිව්වා වගේ ගහ ගලවල අයින් කරන්න ගියොත් වෙන්නේ, ඔකෙ තනිතරම තියෙන පස වැලි.ඒ පස වැලි මට්ටමට පත් වෙනවා. ඒකෙ දෙපැත්තක් හිතලා තමා පිටරටින් එවලා තියෙන්නේ.පස නිසරු කරන්න තමා ඕක එවල තියෙන්නේ මෙහෙට. එහෙම බලද්දි මෙය සම්පූර්ණයෙන්ම විනාශ කරන්න නම් ඉලුක් තෙල් කියලා බෙහෙත් එකක් තියෙනවා.ඒකට තව ඇට්ටාරා කියන ද්‍රව්‍ය මුසු කරල ඒකෙ ප්‍රභලතාවයත් එක්ක තමා ඕක විනාශ වෙන්නේ. එහෙම නැත්තන් පැළේ ගලවන්න ගියොත් එතන තනිකර වැල්ලක් තියෙන්නේ බොල්.පාර අයිනෙ තියෙන ගස් ගැලෙව්වොත් ඒ නිසා හේදිලා ගිහින් පාර කැඩෙනවා.ඒ වගේ තත්වයක් තමා තියෙන්නේ. මෙයට හොඳම විසඳුමක් හරි විදිහටම බලල කළොත්, ඒ තණකොළේ විනාශ කරන්න බලාගෙන ම කරනව මිසක් වෙන යෝජනාවකට ගිහින් පරිසර හානියක් වෙන්න පුළුවන්.ඒ ගැනත් බලන්න.

**සභාපතිතුමා:-**
අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල හා ගොවිජන සේවාදෙපාර්තමේන්තුවෙන් නිර්දේශයක් ලබාගෙන ක්‍රියාත්මක කරමු. මමත් දන්නා තරමින් ඒ වගේ නිර්දේශයක් ආවොත් මේ තෙල් එක භාවිතා කරන්න පුලුවන් වේවි. එහෙම නැත්තන් අඟා පනතේම තියෙනවා පොදු ස්ථාන වලට වල් බෙහෙත් ඉසීම තහනම් කියන එක. ඒ නිසා ගොවිජන එකෙන් නිර්දේශයක් ලබාගෙන අපි ඉදිරියට යමු.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ආර්. වත්සලා නිශාන්ති ධනරත්න මැතිණියගේ 06.23. යෝජනාව, ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග දෙපස වැවී ඇති මාන පඳුර ඉවත් කිරීම සඳහා බෙහෙත් ගැසීමට වු යෝජනාවසඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.22. සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
**06.24.බටුහේන මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරීම යෝජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මෙම පාර අපි මේ අවුරුද්දේ වැඩ අවසන් කළා කොටසක්. මාර්ග සංවර්ධන අධිකාරියේ මුදල් වලින්.මම හිතන්නේ ඒ වෙලාවේ ඔබතුමා ඒ ස්ථානයට ගියා බලන්න. ඒ ගිය වෙලේ ගමේ ජනතාව ඉල්ලීමක් කළා ඒ මාර්ගයේ තව පොඩි කොටසක් තියෙනවා, ඒක කොටස හදල දෙන්න කියල .එම නිසා ඒ ඉල්ලීම අනුව තමයි මම ඒ යෝජනාව ඉදිරිපත් කළේ.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මාර්ගයේ මුල කොටස සකස් කරල තියෙනවා. ඒකට ප්‍රණාමය පුද කරනවා පවතින රජයට.ඒත් එක්කම ඒකෙ දෙපැත්ත අහල් 06 ට වඩා ඉස්සිලා තියෙන පාරක්.බයිසිකලයක් හරි පොඩ්ඩක් ලිස්සල ගියොත් එහෙම, එය පස් පුරවා සකස් කරන්න පුලුවන් නම් එහි වටිනාකම තවත් වැඩි වෙනවා. බටුහේන මාර්ගය ඉස්සරහට සංවර්ධනය කළොත්,මං ගිය සැසිවාරයකදී යෝජනා කරලා තියෙනවා, මම

සමන්සිරි මන්ත්‍රීතුමාගේ යෝජනාවම දිගුවක් ලෙස.දෙහිඕවිට මාර්ගය දැඩිව නාය යන මාර්ගයක් විකල්ප මාර්ගයක් ලෙස භාවිතා කරන්න පුළුවන් මෙම බටුහේන මාර්ගය, සංවර්ධනය කරලා ගත්තොත්.ඒ නිසා ඒ සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන මෙන් මම යෝජනා කරනවා.

**සභිකආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිනිය:-**
ගරු සභාපතිතුමනි,මම හිතන්නනේ මම කතා කළ යුතුම කාරණයක් තමයි .මම වසර 08 කට වැඩි කාලයක් සේවය කරල තියෙන වසමක් බටුහේනට යන්න පාරක් තිබුනේ නැහැ. රු.15000.00 ක් 10000.00 ක් ලැබෙන කාළේ ප්‍රජා දායකත්වය ඇතුව බටුහේනට පාර කැපුවේ මම. මට ඒ ගැන ආඩම්බරයි.බටුහේනට යන්න පාරක් තිබුනේ නැහැ. ඇත්තටම ඒ පාර හැදෙන්න ඕනි පාරක්. පවුල් 30 ක් 35 ක් විතර ජීවත් වෙනවා. අතුරු මාර්ගයක් විදිහට කරන්නත් පුලුවන් .ඒ වගේම බටුහේන ප්‍රදේශයේත් නාය යන තර්ජනයක් තිබුණා. නමුත් මේවන විට එහෙම නැහැයි කියල තමයි කියල තියෙන්නේ. ඒ පාර සංවර්ධනය කළ යුතු පාරක් එම පාරට මුදල් යෙදීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ 06.24. යෝජනාව, බටුහේන මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.25. සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
**06.25.විලේගොඩ වසමේ ගොරොක්ගහ වත්ත පොදු නාන ළිඳ සංවර්ධනය කිරීම යෝජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මෙම නාන ළිඳ වසර කිහිපයක් තිස්සේ පවත්වාගෙන යන නාන ළිඳක්. ඒක දැනටත් තියෙනවා.මේක පොදු ස්ථානයක තියෙන්නේ. කාගෙවත් පෞද්ගලික ඉඩමක නෙමෙයි. සංවර්ධනය කරගන්න පුළුවන් ලොකු මුදලක් යන්නේ නැහැ. සාමාන්‍ය සුළු මුදලකින් සංවර්ධනය කර ගන්න පුළුවන්.මෙහි විශාල ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් ප්‍රයෝජනයට ගන්නවා. එම නිසා ඒ යෝජනාව ඉටුකර දෙන මෙන් මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම ගොරොක්ගහ වත්ත පොදු නාන ළිඳ පායන කාලයට විශාල ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් භාවිතා කරන ළිඳක්. පායන කාලයටත් හිඳෙන්නේ නැති ළිඳක්. දීර්ඝ කාලයක සිට මෙහි ප්‍රවේශ මාර්ගය ගැටළුවක් වෙලා තියෙනවා. ඒකත් දැන් නිරාකරණය වෙලා තියෙනවා. ප්‍රදේශවාසීන්ම එකතු වෙලා මේක සංවර්ධනය කරල දුන්නොත්, මම හිතන්නේ නාන ළිඳක් වශයෙන් ප්‍රාදේශයේ විශාල ප්‍රමාණයක් භුක්ති විඳිනවා. මෙම ළිඳ ගොවිතැන් සඳහා ද භාවිතා කරන්න පුළුවන්. පුරන් වෙලා තියෙන්නේ කුඹුරු යායම. ඉස්සර ගොවිතැන් සඳහා භාවිතා කරා. මේකත් එක්ක ම ඒ ප්‍රවේශ මාර්ගයත්, පටු මාර්ගයක් තියෙන්නේ. සංවර්ධනය කරලා මේ ළිඳ ප්‍රතිසංස්කරණය කරනව නම් ගොඩක්ම කාලෝචිතයි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ 06.25. යෝජනාව, විලේගොඩ වසමේ ගොරොක්ගහ වත්ත පොදු නාන ළිඳ සංවර්ධනය කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.26. සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
**06.26.නැ/විලේගොඩ ප්‍රජා ජල ව්‍යාපෘතිය අලුත්වැඩියා කර පානිය ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු කිරීමට යෝජනා කරමි.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව ඉදිරිපත් කරන්න කලින් අතුරලිය මහත්මය ඉදිරිපත් කළා. කොහිලදෙනිය ජල ව්‍යාපෘතිය අලුත්වැඩියා කිරීම කියල. මං හිතන්නේ එතුමා මේ නැ/විලේගොඩ ප්‍රජා ජල ව්‍යාපෘතියනෙ ඔබතුමා යෝජනා කළේ? මම හිතන්නේ මම මේ යෝජනාව කරන්න අවශ්‍ය නැහැ.යෝජනා දෙකක් අවශ්‍ය නෑ.මම හිතන්නේ මේක ප්‍රජා ජල ව්‍යාපෘතියක් කලින් ක්‍රියාත්මක වුණා. එතුමා යෝජනා කරපු නිසා මේ යෝජනාව කරන්න අවශ්‍ය නැහැ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. සමන්සිරි මන්ත්‍රීතුමා යෝජනා කළ බුළුව ප්‍රජා ජල යෝජනා ක්‍රමයත් සම්බන්ධ කරලයි මම යෝජනා කළේ. ගරු උප සභාපතිතුමා න්‍යාය පත්‍රය සකස් කරන කොට ව්‍යාපෘති දෙකක් ලෙස අර්ථකථනය කළ.මං ඒක නිසා තමා කොහිපදෙනිය විතරක් දැම්මේ.මේකට බුළුව ජල යෝජනා ක්‍රමයත් සම්බන්ධ කරගත්තොත්, විශේෂයෙන් නැ/විලේගොඩ විශාල කොටසකට පානීය ජල ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් අඩු වියදමකින්. දැනටත් නළ මාර්ගය සකස් කරල තියෙන්නේ.ඒක අලුත් වැඩියා කිරිමෙන් ටැංකිය ඇතුලු නළ මාර්ගය අලුත්වැඩියා කළොත් එම ජල ප්‍රශ්නයට සෘජුව විසඳුමක් ලබා ගන්න පුළුවන්. එම නිසා සමන්සිරි මහත්මය කිව්ව වගේ අපට පක්ෂ පාට අදාළ නෑ මිනිස්සුන්ට ප්‍රතිලාභ ලැබෙනව නම්, අපි හැම විටම හිටගන්නව.බොහොම ස්තූතියි.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඒක ප්‍රජා ජල ව්‍යාපෘතියක්. වතුර ටැංකි දෙකක් තියෙනවා.මාර්ගය දෙපස කාපට් කරල මාර්ගය පුළුල් කරද්දි ,ඒ බට ටික ගලවල අයින් කළා. එහිදී අපි මාර්ග සංවර්ධන අධිකාරියට මුදල් ගෙවල තමයි දෙපැත්ත අරගෙන තිබුණකාණු කපලා. එතුමල පොරොන්දු උනා අපිට බට ටික ලබාදෙන්න. ඒ වගේම අපිට බට ටික ලබල දුන්නා.පසුව ප්‍රතිලාභීන්ගෙන් දැඩි හදිස්සියක් තිබුණා මේක කාණු කපනකන්වත් ඉන්නෙ නැතුව බට සවි කරන්න.එම නිසා පාර උඩින් නළ ටික දැම්මා. මාස දෙක තුනක් යනකොට වාහන ගිහින් හැපිල කැඩිල ගියා. ඉතුරු බට ටික කට්ටිය ගෙවල් වලට ඇදගෙන විනාශ උණා. බුළුව සහ කොහිලදෙනිය යෝජනා ක්‍රම සඳහා හොඳ ටැංකි දෙකක් තියෙනවා. අපිට බට ටික ගන්න තමයි අවශ්‍ය වන්නේ. එකපාරක් කැඩුන පසු අපි සම්පත්දායක මහත්මයෙක් අරගෙන බට බැම්මා. නමුත් එයත් සාර්ථක උනේ නැහැ. පාරේ කාණු කපල යට කරගන්න තිබ්බොත් හොඳයි. අතුරු මාර්ග වල බට කැඩිලා නැහැ. ප්‍රශ්නය තියෙන්නේ කොහිලදෙනියේ සිට බිසෝ උයනට එනකන් මහා මාර්ගය අයිනේ තියෙන මාර්ගයේ බට ටික තමයි කැඩිලා තියෙන්නේ .එම නිසා ඒ ටික කරල දෙන්න පුළුවන් නම් බොහොමත්ම ස්තූතියි.

**සභාපතිතුමා :-**
තම තමන්ගේ වසම්වල කොට්ඨාශවල ප්‍රශ්න සංවර්ධන යෝජනා දන්නේ ඔබතුමන්ලා.ඒක නිසා ඇත්තට ම බොහොම ප්‍රසංසනීයයි.දෙන්න ඒ වැඩේ කරන්න.කාගෙන්වත් ප්‍රශ්නයක් එන් නෑ.අපි ඒක අතුරලිය මහත්තයාගේ යෝජනාවක් විදිහට ක්‍රියාත්මක කරමු නේ ද?

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ 06.26. යෝජනාව, නැ/විලේගොඩ ප්‍රජා ජල ව්‍යාපෘතිය අලුත්වැඩියා කර පානිය ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු කිරීම සඳහා වු යෝජනාව ඒ.ටී.සී අතුරලිය මැතිතුමාගේ 6.12 යෝජනාව හා සම්බන්ධ බැවින් එ සඳහා මහා සභාවේ තිරණයක් අවශ්‍ය නොවන බවත්, එම යෝජනාව ඉවත් කර ගන්නා බවත්, සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන්නට විය.

**සභාපතිතුමා :-**
06.26. සභික එච්.එල්.ජයසේකර මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.එල්.ජයසේකරමැතිතුමා:-**
**06.27.හිඳුරංගල තැපැල් කාර්යාලය අසලින් රජ මාවත් සම්බන්ධ වන හන්දිය හියුම් පයිප්ප දෙකක් යොදා බෝක්කුවක් ඉදි කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එල්.ජයසේකරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, රජ මාවත කියන්නේ විකල්ප මාර්ගයක්, පානදුර -රත්නපුර පාරට සම්බන්ධ වන මාර්ගයක්.ඇරැපොලින් යන මාර්ගය මේ රජ මාවතට සම්බන්ධ කරද්දී මෙම කාණුව වහල තමයි කොන්ක්‍රීට් කරන්න වෙන්නේ. හිඳුරංගල පාරෙන් එන වතුර පාර මේ පාරෙන් තමා බැහැල යන්නේ. ඒ නිසා හියුම් පයිප්ප දෙකක් යොදා බෝක්කුවක් ඉදි කර සංවර්ධනය කිරීම ඉතා වැදගත් කියල මම හිතනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ 06.27. යෝජනාව, හිඳුරංගල තැපැල් කාර්යාලය අසලින් රජ මාවත් සම්බන්ධ වන හන්දිය හියුම් පයිප්ප දෙකක් යොදා බෝක්කුවක් ඉදි කර සංවර්ධනය කිරීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.28. සභික එච්.එල්.ජයසේකර මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.එල්.ජයසේකරමැතිතුමා:-**
**06.28.ඇරැපොල මල් සිත්පාදන පෙර පාසල් මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම යෝජනා කරමි.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එල්.ජයසේකරමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මෙය කුඩා දරුවෝ යන පාසලක්.වලවල් හැදිල තියෙන්නේ ඒ මාර්ගය.අඩි 30 ක් වගේ තමා තියෙන්නේ, එක සංවර්ධනය කරලා දෙන්න කියලා තමා මං යෝජනා කරන්නේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ 06.28. යෝජනාව, ඇරපොල මල් සිත්පාදන පෙර පාසල් මාර්ගය කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.29. සභික පී.එම්.චන්ද්‍රදාසමැතිතුමාගේ යෝජනාව.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
**06.29.බෝපැත්ත හරහා උඩුමත්තට යන මාර්ගයේ ඇති මහ අමුණ පාලම අබලන් වී ඇති අතර එය සංවර්ධනය කිරීම මම යෝජනා කරමි.**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,බෝපැත්ත මහා විද්‍යාලය ඉදිරිපිට ඇති මාර්ගයේ කඳු ගැට්ටෙන් තමා බෝපැත්ත දිය බෙත් ම ආරම්භ වෙලා තියෙන්නේ.මීන්නාන ප්‍රදේශයට ඇති බෑවුමෙන් ගලා එන ජලය කැළෙණි ගඟටත්, ඇහැලියගොඩ පැත්තට ඇති බෑවුමෙන් ගලා එන ජලය කළු ගඟටත් තමයි ගලාගෙන යන්නේ.එම නිසා මේ දිය බෙදුමෙන් ඇහැලියගොඩ පැත්තට ගලාගෙන එන සියලුම ජලය මෙම මහ අමුණ කියන ඇළට තමයි ගලාගෙන යන්නේ.දිය පාරවල් වලිනුත් ,වර්ෂා කාලයේත් ,ඒ සියලුම ජලය ගලාගෙන යන්නේ මහ අමුණ ඇළට.මේ ඇළට තමයි අමුණක් සකස් කරල තියෙන්නේ. ඒ ප්‍රදේශයේ කුඹුරු වල වී වගා කිරීම සඳහා ජලය ලබා ගැනීමට. මේ අමුණ සකස් කරල තියෙන්නෙත් ,මේ ඇළේ ඉවුරු දෙකට අඩි 40 ක් පමණ දිග අඩි 12 ක් පමණ පළල් කොන්ක්‍රීට් එකක් උඩින් දාල යටින් ලෑලි හරස් කරල , අමුණ හරස් කරන්න පුළුවන් විදිහට ඉඩ තියෙනවා. ඉතින් මේ ජලය ගලාගෙන යන කොට මේ පාලම උඩින් වර්ෂා කාලයේදී මගීන්ට යන්නත් බෑ. වාහන වලට යන්නත් බෑ. මේ පාලම උඩින් විශාල මගීන් ප්‍රමාණයක් ගමන් කරනවා. වර්ෂා කාලයේදී මේ පාලම උඩින් ජලය පිටාර ගලා යනවා. ජලය කුඹුරට ලබා ගැනීම සඳහා අමුණ දැම්මට පස්සේ වැඩි ජලයත් මේ පාලම උඩින් යනවා.

මේ පාලමේ එක කෙළවරකින් වම් පැත්තට උඩුමත්ත හරහා මෝරගලට යන මාර්ගයත් වම් පැ.ත්තට,දකුණු පැත්තෙන් අක්කර 50, බෙරුවාන හරහා මෝරගලට යන මාර්ගයත් තමයි තියෙන්නේ.උඩුමත්ත පාසලට යන ළමයිනුත් යන්නේ, මේ පාලම උඩින්.මේ පාලමේ එක තැනක ලොකුවලකුත් තියෙනවා මේ කොන්ක්‍රීට් එක කැඩිලා.සභාවේ කසළ ට්‍රැක්ටරයත් යන්නේ මේ පාලම උඩින්. මම අදහස් කරන්නේ තව අඩි 1½ක් විතර උඩට උස්සල කොන්ක්‍රීට් එකක් දාල ,යටින් වර්ෂා කාලයේත් අමුණ දැම්මට පස්සේ, වැඩි ජලයත් ගලාගෙන යන විදිහට සකස් කර දෙන ලෙසට මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාගේ 06.29. යෝජනාව, බෝපැත්ත හරහා උඩුමත්තට යන මාර්ගයේ ඇති මහ අමුණ පාලම අබලන් වී ඇති අතර එය සංවර්ධනය කිරීම මම යෝජනා සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.30. සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.30.2025.08.31 දින සිළුමිණ හා තිණකරන් පුවත්පත් වල පහත සඳහන් අප ප්‍රාදේශිය සභාව සතු දේපල බදු ලබා දීමට ලංසු කැඳවුව ද ලංසුපත් ඉදිරිපත් නොවූ නිසා ලංසු කැඳවා වාර්ෂික වටිනාකමෙන් 10% ක් අඩු කර නැවත ලංසු කැඳවීමට මම යෝජනා කරමි.**

| අනු අංක | දේපල | ලංසු කැඳ වූ වාර්ෂික වටිනාකම රු. | 10% අඩු කළ ලංසු වාර්ෂික වටිනාකම රු. |
|---|---|---|---|
| **01** | ඇහැලියගොඩ සතිපොළ හා පදික බදු | **2,000,000.00** | **1,800,000.00** |
| **02** | ගැටහැත්ත සතිපොළ | **402,000.00** | **361,800.00** |
| **03** | ඇහැලියගොඩ එළු සහ කුකුල් මස් වෙළෙඳසැල | **2,521,000.00** | **2,268,900.00** |
| **04** | ඇහැලියගොඩ සතිපොළ භූමියේ පොදු වැසිකිලිය | **150,000.00** | **135,000.00** |

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව සතු ගොඩනැගිලි කිපයක් හා වෙළෙඳසැල් කිපයක්, මේක අපි 08.31 ලංසු කැදෙවුවත්, මීට සමගාමීව තව කිපයක් කැඳෙවුවා.ඒවා වෙන්දේසි කරුවන් ඉදිරිපත් වෙලා ඒවා මිළ දී ගත්තා.නමුත් මේ ටිකට වෙන්දේසිකරුවන් ඉදිරිපත් වුණේ නෑ.ඒක හින්දා ඒකෙ ඊළඟ පියවර හැටියට 10% ක් අඩු කරලා තමා මීළඟට ලංසු කැඳවන්න වෙන්නේ මේ දාල තියෙන මිල ගනන් අනුව තමා දාන්න වෙන්නේ.මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටින්නේ මේ 10% අඩු කර නැවත වතාවක් ලංසු කැඳවන්න සිදුවෙනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ප්‍රාදේශිය සභාවේ පොදු උපයෝගීතා සේවාවන් දැනට පවත්වා ගෙන යාම සඳහා අපේ කාර්ය මණ්ඩලය තමයි බදු එකතු කිරීම සඳහා යොද වන්නේ. සතිපොළ, ගැටහැත්ත සතිපොළ භූමියේ බදු එකතු කිරීම හා ඇහැලියගොඩ සතිපොළ භූමියේ පොදු වැසිකිලියේ බදු එකතු කිරීම. මේවා ටෙන්ඩර් කරලා පෞද්ගලික අංශය සම්බන්ධ කර ගන්න පුළුවන්නම් හොඳයි. එතකොට අපේ කාර්ය මණ්ඩලය අපිට එලදායී විදිහට යොදව ගන්න පුළුවන් . කාර්ය මණ්ඩලයේ හිඟතාවන් තියෙනවා.කාර්ය මණ්ඩලය මේකට යොදවලා මේ වැඩේ භාර දෙන එකේ අඩුපාඩුකම් තියෙනවා.ඒ නිසා අපිට ආදායම 10% ක් අඩුවෙනවා තමයි.නමුත් මම හිතන්නේ අඩු කරලා හරි ලංසුකරුවන් ඉදිරිපත් නොවූ නිසා ,මම හිතනවා මේක වාර්ෂික ලංසු වටිනාකමින් 10%ක් අඩුකරලා නැවත දැන්වීම් පළ කරලා ගන්න තීරණය ඉතාමත් හොඳයි කියලා මම අදහස් කරනවා. .

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම දැනගන්න කැමතියි 2025 වර්ෂයේ,මේ මාස 10 ක් ඉවර වෙලා තියෙනවා.ඒ මාස 10 අවසානයේදී අපේ සභාවේ නිලධාරීන් විසින් කොපමණ මුදලක් මේ දේපල සම්බන්ධව බදු මුදල් වශයෙන් අයකරගෙන තියෙනවද කියන එක පැහැදිලි කරගත්ත නම් මේකට වෙලා තියෙන ගැටළුව පැහැදිලි කරගන්න පුළුවන් වෙනවා. පෞද්ගලික අංශය සම්බන්ධ වෙලා මේ ටෙන්ඩර් ගන්නේ නැති හේතුව හොයා ගන්න වෙනවා. මේකත් ටෙන්ඩර් දාල මේකත් ගත්තේ නැත්නම් එහෙම ලබන අවුරුද්දේ මුල ඉඳන් ආයිත් කාර්ය මණ්ඩලය යොදවල බදු එකතු කරන්න වෙනවා. එහෙමත් නැත්නම් එළු සහ කුකුළු මස් වෙළඳසැල ගැන සඳහන් කලොත් එහෙම මේ ටෙන්ඩර් එක ගත්තේ නැත්නම් සභාවේ කාර්ය මණ්ඩලය යොදල එළුවො ටිකයි කුකුළෝ ටිකයි හරක් ටිකයි කපන්න වෙනවා .නැත්නම් මොකක් හරි ක්‍රමවේදයක් අපිට අනුගමනය කරන්න වෙනවා.මේක ඇත්තටම මොකක්ද වෙලා තියෙන්නේ.ඇයි දන්නෑ නේද මේක අධෛර්යමත් වෙන්න හේතුව.ඒක හොයල, ඒකට තමයි විසඳුම ලබාදෙන්න ඕනි. නැත්නම් මේ ටෙන්ඩරෙත් ගත්තේ නැත්නම් කවුරු හරි,අපි තව මාසෙකින් තව ටෙන්ඩරයක් දායි.එකත් ගත්තෙ නැත්නම් ලොකු ප්‍රශ්නයක් වෙනවා. මම හිතන්නේ ලොකු ගැටළුවක් ඇති මේ මිනිස්සුන්ට.නැත්නම් කලින් ගත්තු අයට සභාවෙන් මොකක් හරි ගැටළුවක් වෙලා ඇති. එහෙම නැත්නම් වෙන මොකක් හරි ගැටළුවක් ඇති.මොකක් හරි බලපෑමක් ඇති.මේකට හේතුව හොයන්නේ නැතුව ටෙන්ඩර් දාන එක මම හිතන්නේ නෑ කොපමණ දුරකට සාර්ථක වෙයිද කියලා.

**සභාපතිතුමා :-**
මේකට මම හිතන්නේ ඇහැලියගොඩ එළු සහ කුකුළු මස් වෙළඳසැල අපි ටෙන්ඩර් දැම්මා. නමුත් ටෙන්ඩර් කාලය මදිව.එක් අයෙක් ඉදිරිපත් වුණා. එවිට අපි ටෙන්ඩර් අවසන් කරලා තිබුණේ. ඒක නිසා තමයි .ඊට පස්සේ කෙනෙක් ආව මේ සඳහා. නීත්‍යානුකූලව යනව නම් 10% අඩුකරන එක අපි කරන වැඩක් නෙමෙයි.චක්‍රලේඛයෙම තියෙන එකක්.ටෙන්ඩර් දාන විට 10%ක් අඩු කරන එක චක්‍රලේඛයේම තියෙන එකක්. මේ ගැන ලොකු විශ්වාසයක් තියෙනවා. අපිට කීප දෙනෙක්ම කථා කළත් එක්ක. ඇත්තටම එය පත්තරෙත් ප්‍රසිද්ධ වුණෙත් නෑ වගේ, එළුමස් කඩේ නම්.අනිත් ටික නම් අපි කරන ටිකක්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එවිට සභාපතිතුමා විශ්වාස කරනවද තුන්වෙනි දේපල ගැන එළු සහ කුකුළු මස් වෙළඳසැල කවුරුහරි ටෙන්ඩර් දාපුවහම ආපහු ගනී කියල.

**සභාපතිතුමා :-**
ඒ ගැන ලොකු විශ්වාසයක් තියෙනවා කීප දෙනෙක් පැමිණිය නිසා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
මම හිතන්නේ එම කාල පමාවත් සමඟ රුපියල් දෙලක්ෂ පනස් තුන් දාහක් පමණ අපට පාඩු වෙනවා.

**සභාපතිතුමා :-**
ඇහැලියගොඩ සතිපොළ භූමියේ තියෙන පොදු වැසිකිළියටත් කීප දෙනෙක් කථා කළා.එකත් යයි කියලා හිතෙනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ වගේ ඍණාත්මක පැත්තට බර වෙනව නම් අපි වහාම ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. විශේෂයෙන්ම පොළට එළු මස් නැතිවෙන්න හේතුව, මොකක්ද කියල හොයල බලනව නම්,මේ ගැන පැහැදිලි වුණ කාරණයක් තමයි අක්‍රමවත් වුණ පොළක් තියෙන්නේ.පොළේ වෙළෙන්දන් නොමැති වීම. පොළ හොඳට සංවර්ධනය කරල ,හොඳ තත්වයක් ඇති කරමු. පෞද්ගලිකව හරි ගන්න කෙනා ලාභයක් ලබන්නනේ ගන්නේ. ඒ වගේ වටපිටාවක් තියෙන්න හදන්න ඕනි. ඒ වගේ මීට කලින් යෝජනා කරගත් පරිදි ඒ අවශ්‍යතාවයන් ටික ඉටු කරන කොට මම හිතනවා මීට වැඩිය මිලකට යන්න පුළුවන්. වැසිකිළියත් මේ තත්වයම තමයි.වැසිකිළියත් පිරිසිදු නෑ.එහි තිබෙන සමහර ගැටළු අපි විසඳිය යුතුමයි. එහෙම විසඳනව නම් ඔය කියන මුදලට යන්න පුළුවන්.කුකුළු මස් හා එළු මස් නෙවෙයි මට තියෙන්නේ පොළ හා වැසිකිළිය

පිළිබඳව ගැටළුව.මට හිතෙනවා ඒ මුදලට යන්න පුළුවන් තත්වයට අපිට ගොඩනගන්න පුළුවන් කියල.අපි සාකච්ඡා කරලා වැඩ සටහනක් ලෑස්ති කරලා තියෙනවා.ඒක ඉක්මන් කළොත් ඔය තැනට ගන්න පුළුවන්.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම ගරු සභාපතිතුමා නගරයට ගිහින් බලන්න, කඩේ ලියාපදිංචි කරල තියෙන්නේ පලතුරු හෝ වෙන දෙයක්. නමුත් විකුණන්නේ මොනවද? මේ පාරෙ දෙපැත්තෙම බැලුවොත් එහෙම විකුණන්නේ මොනවද? කියන දේ නෙමෙයි විකුණන්නේ. ඇත්තටම එළවළු තමයි හැමතැනම දාල තියෙන්නේ.එහෙම නැත්නම් මාලු.ඉතින් පොළට යයිද මිනිස්සු.ඒ නිසා පොළට යන්නේ නෑ.ඒ හින්දා මේ සභාවේ කට්ටිය එකතු වෙලා හොඳ හරි යෝජනාවක් ආපු හින්දා, විකුණනව නම් ඒ විකුණන භාණ්ඩ ටික විතරක් විකුණන්න මොකක් හරි ක්‍රමවේදයක් හදමු.හැමතැනම තියෙන්නේ එළවළු කඩ .පොළට මිනිස්සු යන් නෑ.පොළේ තියෙන්න ඕනි එළවළු.

**සභික ඩී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ යෝජනාව අනුව ඔබතුමා යෝජනා කරල තියෙනවා 10%ක ප්‍රතිශතයක් අඩු කරන්න.

**සභාපතිතුමා:-**
මම යෝජනා කරල නෙමෙයි.චක්‍රෙල්ඛයේ තියෙන්නේ එහෙමයි.ටෙන්ඩ්‍දේසි වුණේ නැත්නම් 10% කින් අඩු කරන්න ඕනි.

**සභික ඩී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා:-**
2023 චක්‍රලේඛය අනුව 10%ක උපරිමයකට යන්න පුළුවන්.එහෙම යන්නත් පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් අවසර ගන්න ඕනි.එතකොට පළමු කාරණය තමයි ඇයි ටෙන්ඩර් එක යන්නේ නැත්තේ කියන එක. දෙවෙනි කාරණය තමයි ක්‍රමවේදයේ තියෙන ප්‍රශ්නය. ඔබතුමා සභාවට යෝජනා කරන්නේ වාර්ෂික වටිනාකමින් 10%ක් අඩුකරන්න.එවිට මේ ටෙන්ඩර් එක නොගියොත් අපිට ඊළඟට වෙන යන්න දිහාවක් නැහැ. 10%ක උපරිමයකට යන්න පුළුවන් කියල තමයි ඔය චක්‍රෙල්ඛයේ තියෙන්නේ. එතකොට අපි 10% දුන්නහම මේ පාර ආයෙ ගියෙ නැතොත් මේ පාර ආයෙත් ගියෙ නැතොත් දෙන්න විදිහක් නැහැ.එවිට අපිට වෙන මොකක් හරි ක්‍රමවේදයකට යන්න වෙනවා. දෙවෙනි එක තමයි ආදායම අඩු වීම. මේක මං කියන එකත් වැරදියි. අපෙත් දේශපාලන පෞද්ගලික හිතවතුන් නගරයේ ව්‍යාපාර සිදු කරන්නේ .නමුත් නගරය පුරා එළුමස් කඩ කුකුළු මස් කඩ විශාල ප්‍රමාණයක් තියෙනවා. පොළෙත් තියෙන්නේ එළවළු කඩ හැමතැනම. මේක අපි නියාමනයක් කරගන්න වෙනවා. අපි බලන්න ඕනි කුකුළු මස් කඩ වලින් අපිට ආදායම කීයක් ලැබිල තියෙනවද කියලා. එය අපි පළමුව සොයා ගත යුතුයි. ඒ අනුව තමා අපිට ක්‍රියාමාර්ගයක් ගන්න වෙන්නේ.පොළ ස්ථාපිත කරන්නේ කොහොම ද කියලාමුලින්ම හොයාගන්න ඕනි.

මම මතු කරණ දෙවෙනි කාරණය තමයි, 2023 චක්‍රලේඛය අනුව 10% ක උපරිමයකට යන්න පුළුවන්.ඒ උපරිමය අපි අද දුන්නොත්, ඊළඟ එකට කරන්න දේකුත් නැහැ.ඒකට අපි පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් අවසරය ගන්න ඕනි . ක්‍රම දෙකක් තියෙනවා, එතකොට ඒක මුලින් ඉල්ලන්න පුළුවන්. නැත්නම් සභාවට දාල සභාවේ අනුමැතිය සමඟ යවන්න ඕනි.මම හිතනවා ඔබතුමා තීන්දු කර ගන්න ඇති අපි සභාවට දාලා සභාවේ අනුමැතියත් එක්ක යවන්න.මම පෞද්ගලිකව 10% යන එකට විරුද්ධත්වය මං ප්‍රකාශ කරනවා .වෙන කාරණයක් නිසා නෙමෙයි, මේක ගියෙ නැතොත් ඊළඟ එකට අපිට කරන්න දෙයක් නැති වෙනවා. අනෙක් කාරණය ඔබතුමා කිව්වා එළු මස් සහ කුකුළු මස් කඩයට ටෙන්ඩරයක් කවුරු හරි ගන්න ඉද්දිද අපේ කාලය පහු වුණ නිසා. ඒකත් අපිට සාකච්ඡා කරන්න වෙනවා. අපි ගාව කෙනෙක් ඉන්නවා .ඒ කෙනා ඉද්දිම අපි 10%ක් අඩු කරල දෙන්න හදනවා.ඔබතුමා දැන් ප්‍රකාශ කළා කාලය මදි වුණ නිසා තමා එළු මස් හා කුකුළු මස් කඩේ ගන්න බැරි වුණේ කියලා.

**සභාපතිතුමා:-**
ඒ කියන්නේ එතුමා දැන ගෙන තියෙන්නේ පස්සේ.අපිට එහෙම වුණා කියල මේ වැඩේට යනව නම් අපිට එහෙම දෙන්න බැහැ.ටෙන්ඩරයකින්ම තමයි දෙන්න වෙන්නේ.

**සභික ඩී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඒක තමයි මම කියන්නේ.එහෙම කෙනෙක් ඉන්නව කියල අපි දැන ගෙන,අපි මුදල අඩු කරන කොට අපේ භාවිතයේ ගැටළුවක් එන්න ඉඩ තියෙනවා. මම හංගල කියන් නෑ.මම විශ්වාස කරනවා ඒක ප්‍රසිද්ධියේ කියන එක තමා හොඳ කියලා. එතකොට අපි ගාව කෙනෙක් ගන්න ඉන්නවා කියලා අපිට දැනිල තියෙද්දී, අපි 10% ක් අඩුකරන්න යෝජනා කළාම, ඒක කොපමණ සද්භාවයේ ගැටළුක් ද කියලා රණවීර මන්ත්‍රීතුමාගේ සිංහල වලින් ම ඉගෙන ගන්න පුලුවන් වෙයි.එය භාවිතය සම්බන්ධ ප්‍රශ්නයක්.

**සභාපතිතුමා:-**
අපි ටෙන්ඩර් දාපුවහම ඒක ඊට වැඩි වෙන්නත් පුළුවන්.

**සභික ඩී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා:-**
වැඩි වෙන්නත් පුළුවන් සභාපතිතුමා.අපි අවම ලංසුව අඩු කරලනෙ දෙන්නෙ. අවම ලංසුවට කැමති හින්දනේ ගිය පාර එන්නේ.රු.2,521,000ට ගන්න කැමති නිසා තමයි එයා පහු වෙලා හරි එන්නේ. එතකොට අපි ඒක මාසෙකට පසුව අපි එයාට රු.2,268,900.00කට දෙන්න අපි අවම ලංසුව යෝජනා කරන කොට මේවට ඇත්තටම පිටින් එන්නේ නැහැනේ රු.253,000.00 ක පාඩුවක් සිද්ධ වෙනවා. මේක අධිභාරයක් වෙන්න පුළුවන්. ඔබතුමා මේක ප්‍රකාශ කරපු හින්දා. නැත්තන් අපි දැනන් හිටියේ නෑ ආවද නැද්ද කියලවත්.මේ සියලුම දේ වෙන්නේ ඇහැලියගොඩ මස් කඩේට එන්නේ මේ කි.මී. 10 ඇතුළත පමණයි එන්නේ.මේක අවශ්‍යා නම්

මේ ප්‍රදේශය තුළම ප්‍රසිද්ධ කරන්න පුළුවන්. මම පෞද්ගලිකව 10% ක් දක්වා අඩුකිරීමට එකවර යාමට මම විරුද්ධ වෙනවා.

**සභාපතිතුමා:-**
ඒක ඇත්තටම පත්තරේ දාන්න ඕනි. පළවෙනි එක පත්තරේ නොදා ඉන්න බෑ. දෙවෙනි එක දාන්නම වෙනවා. මේක අපි උපකල්පනය කරන්නනෙ මේක අපිට දෙන්න පුළුවන් කියල. මේක ගන්නම කියල අපිට ෂුවර් එකක් නැහැනේ. එහෙම කවුරුවත් ඉන්නව නම් අවශ්‍ය නැහැ එහෙම කරන්න.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
සභාපතිතුමනි, අපිට පෙනී යන්නේ මෙම අවුරුදු ගණනාවටම දත්ත පද්ධතියක් යාවත්කාලීන වෙලා නැති නිසා ද දන්නේ නැහැ මේක මෙහෙම වෙලා තියෙන්නේ. මේ නිලධාරීන් එකතු කරපු ආදායම අපිට බලා ගන්න පුළුවන් නම්, අපිට ටෙන්ඩර් මුදල කොපමණ දුරකට යන්න පුළුවන්ද කියන කාරණය අපිට අදහසක් ගන්න පුළුවන්. සාරාංශයක් නැද්ද? සාරාංශයක් තිබ්බනම් හරි.

**සභාපතිතුමා:-**
අපි එහෙම නම් ආදායම් පරීක්ෂක වාර්තාවක් බලමු. මෙය 10% තමයි උපරිම. මේක සභාවේ අනුමත කර ගන්න පුළුවන්,සියයට කීයක් යනවද කියලා. මේක යෝජනාවක් විතරයි. සභාවේ යෝජනා කරන්න පුළුවන් සීයයට නමයක් ,අටක් හෝ ..

**සභික ඩී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා:-**
යෝජනා කරපු නිසා තමයි චක්‍රෙල්කයේ තියෙන්නේ උපරිමය 10%.එතකොට අපිට ඒක සංශෝධනය කර ගන්න පුළුවන්. ඔබතුමා යෝජනා කළේ ලංසු කැඳවා වාර්ෂික වටිනාකමින් 10% ක් අඩුකර නැවත ලංසු කැඳවීමට යෝජනා කරමි. කියලා.එතකොට අපිට ඒක සංශෝධනය කර ගන්න පුළුවන්. සාකච්ඡා කළේ ඔබතුමා කියලා තියෙන යෝජනාව.

**සභාපතිතුමා:-**
අනිවාර්යයෙන්ම.යෝජනාවක් දාන්නේ ඒකනේ. සංශෝධනය කරන්න.

**සභික ඩී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා:-**
අපිට ඔබතුමාගේ හිත් කියවීමේ ඥානය පහළ වෙලා නෑ තාම.

**සභාපතිතුමා:-**
ඒක තමා .සංශෝධන තියෙනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එතකොට ගයේෂාන් මන්ත්‍රීතුමා කිවුවා වගේ එළු සහ කුකුළු මස් කඩය අනිවාර්යයෙන් ගනී කියල අපිට විශ්වාසයක් තියෙනවනේ.

**සභාපතිතුමා:-**
එහෙම අනිවාර්යයෙන් ගනී කියල විශ්වාසයක් නැහැනේ.ඒක අපි උපකල්පනය තමයි කරන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
එතකොට 10% ක් අඩු කළොත් රු.251,000.00 ක් අඩු වෙනවා. හැබැයි 10% නැතුව ඊට වඩා අඩු මුදලක් යන්න පුළුවන්ද කියල අපි ඒක තීරණය කරමු තොරතුරු අරන් ආදායම් එකතු කරන නිලධාරීන්ගෙන් සාරාංශයක් අර ගමු.එතකොට අපිට තිරණයක් දෙන්න පුළුවන්.

**සභාපතිතුමා:-**
මන්ත්‍රීවරුනි, අපිට ඒක ආදායම් එකතු කිරීම විතරක් ගණනය කරල අපිට එහෙම ඒක ගණනය කරන්න බැහැ. හිතන්නකො මේකට අමතරව යනවා ජලය සහ විදුලිය සඳහා මුදල් වැය වෙනවා.මෙතන ගෙන්නන්න පුළුවන්. මෙක කාලය නාස්ති කිරිමක් මම නම් විශ්වාස කරන්නේ. ඒ සඳහා නිශ්චිතව වැය වන ජලය, විදුලිය මේවත් එක්ක ගණනය කරන්න ඕනි.

**සභික ඩී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දිලීන් මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ, සතිපොළ සහ පදික වෙළඳාමෙන් බදු එකතු කරනකොට ඒකට ක්‍රමවේද දෙකක් තියෙනවා.එකක් තමා සභාවෙන් බදු දෙනවා යම් කිසි තුන්වන පාර්ශවයකට. දෙවෙනි එක තමා සභාව විසින් සභාවේ නිලධාරී මහත්වරුන් යොදවලා බදු එකතු කරනවා. එතකොට සතිපොළේ එක ටිකට් එකක් කඩනවා . ඒ ආදායම බලන්න පුළුවන් සභාපතිතුමා.

**සභාපතිතුමා:-**
ආදායම බලන්න පුළුවන් .ගෙන්න ගෙන බලමු .ඒක 100% නිශ්චිත නෑ කියන එක තමයි කිවුවේ.

**සභික ඩී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා:-**
නෑ නෑ සභාපතිතුමා, මේ එළු මස් කඩේට ,හරක් මරල එළුවො මරල බලන්න බෑ ඒක නිලධාරීන් යොදවල. ඒක මම පිළිගන්නවා. එහෙම කරන සභත් තියෙනවා.මල් ශාලා කරන සභාත් තියෙනවා.සභාපතිවරුන්ට ව්‍යාපාර කරන්න පුළුවන් ගැටළුවක් නෑ.හැබැයි සතිපොල සහ පදික වෙළඳාම් කරන එක මේ සභාවෙන්ම බදු

දීල මේ ප්‍රදේශයේ ඉන්න ව්‍යාපාරිකයො බදු එකතු කරලා සභාවට ගෙවල තියෙනවා.ඒ වගේම සභාවෙනුත්,නිලධාරීන් බදු එකතු කරලා තියෙනවා.සභාපතිතුමනි, ඒ නිලධාරීන් එකතු කරපු බදු ප්‍රමාණය අපිට බලන්න පුළුවන්.අපිට මාසෙකට කීයක් එකතු වෙලාද කියලා. පොළෙනුයි පදික වෙළඳාමෙනුයි.ඒකයි අපි යෝජනා කරන්නේ.

**සභාපතිතුමා:-**
එහෙම නම් අපි ගෙන්වමු.නමුත් ඒක හරියට ග්‍රහණය කරගන්නේ නැති එකයි ගැටළුව.ඒ සේවකයාගේ පඩිය පවා අපි මේකට එකතු කරන්න අවශ්‍යයි. මේක එකතු කරලා විතරක් කරන්න බැහැ. සාර්ථක නැහැ.

**සභාපතිතුමා:-**
එහෙම නම් අපි කාරක සභාවක් බවට පත් කරල කතා කරමු.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට මම යෝජනා කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

මෙතැන් සිට මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට මම යෝජනා කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපිට නිලධාරීතුමියගෙන් ඒ අවශ්‍ය තොරතුරු ටික එනකම් ඉදිරියට සභාව කරගෙන යන්න කියලා මම යෝජනා කරනවා.

යෝජනා අංක 50 පසු ගත් කාරක සභා තීරණයට අනුව,

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 6.30 යෝජනාවේ සඳහන් 10% අඩුකළ ලංසු වාර්ෂික වටිනාකමට ටෙන්ඩර් කැඳවීම සභාවේ ඒකමතිකව ස්ථිර කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.30 යෝජනාව, .2025.08.31 දින සිළුමිණ හා තිණකරන් පුවත්පත් වල පහත සඳහන් අප ප්‍රාදේශීය සභාව සතු දේපල බදු ලබා දීමට ලංසු කැඳවුව ද ලංසුපත් ඉදිරිපත් නොවූ නිසා ලංසු කැඳවා වාර්ෂික වටිනාකමෙන් 10% ක් අඩු කර නැවත ලංසු කැඳවීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.31. සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.31.ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා බදු පැන වීමේ ගැසට් පත්‍රය සහා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.(whatsapps group) එකට ගැසට් පත්‍රය යොමු කර ඇත.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ පිළිබඳවත් අපිට සාරාංශයක් දෙන්න පුළුවන් නම් හොඳයි.

**සභාපතිතුමා :-**
මේක අලුත් දෙයක් නෙවෙයි.වර්ෂයක් පාසා සිදුවන සිද්ධාන්තයක්. whatsapps group එකට දාල තියෙනව මෙය.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
හරි හරි සභාපතිතුමා.මෙතන ගොඩක් අය ඉන්නේ නවක මන්ත්‍රීවරු. එතුමන්ල කැමතියි දැනගන්න ගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දෙත් .මේ අවුරුද්දට සාපේක්ෂව ලබන අවුරුද්දෙත් මේ ගාස්තු වැඩි වීම ප්‍රතිශතයක් හරි,ගාස්තු වැඩි වීමේ ප්‍රමාණය ජනතාව දැනුවත් කරන්න ඕනි. ඒ පිළිබඳව සාරාංශයක් දෙන්න පුළුවන් නම් හොඳයි.

**සභාපතිතුමා :-**
ඒක දෙන්න පුළුවන්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඒක අපි ඔකොම එකට කතා කරමු.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව සඳහාත් විස්තර එනකන් අපි ඉස්සරහට යමු.

යෝජනා අංක 50 පසු ගත් කාරක සභා තීරණයට අනුව,

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 6.31 යෝජනාවේ 2026 වර්ෂයේ බදු පැනවීමේ ගැසට් පත්‍රයේ සඳහන් යෝජනාවට අදාළව අදාළ වන ගාස්තු හා නව ගාස්තු සභා සම්මත කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.31 යෝජනාව, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා බදු පැන වීමේ ගැසට් පත්‍රය සහා අනුමැතිය සඳහ ඉදිරිපත් වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.(whatsapps group එකට ගැසට් පත්‍රය යොමු කර ඇත.)

**සභාපතිතුමා :-**
06.32. සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.32.ඇහැලියගොඩ බේරුවාන කසළ කලමණාකරණ අංගනය පුළුල් කිරීම අදියර I යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා පළාත් පාලන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් අත්තිවාරම සඳහා පස් පිරවීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සුදුසු බව මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මෙම යෝජනාව අපිට ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලැබුණු යෝජනාවක්.මේ අදියරේ එකක් වැඩ නිම කිරීම සඳහා ඇස්තමේන්තු හැදුවාම විශාල මුදලක් යනවා.නමුත් එහෙම නැති වුණොත් ඒ මුදල අපතේ යන්න සිදු වෙනවා. ඒ නිසා අපි ඒ අඩුපාඩු මුදල අපි පස් පුරවල අපේ මුදලින් කරන්න තමයි බේරුවාන කසළ අංගනයේ ව්‍යාපෘතිය ගත්තේ. දැන් මේක පේපර් ටෙන්ඩර් ක්‍රමවේදය යටතේ ගිහිල්ල මේ වැඩේ භාර අරගෙන යනවා. පස් පිරවීම සඳහා තමයි අපිට සභාවෙන් අනුමැතිය අවශ්‍ය කරන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ කියන්නේ ටෙන්ඩර් එක ක්‍රියාත්මක වෙනවද? ව්‍යාපෘතිය යනව? එම ව්‍යාපෘතිය තුළ මේ සඳහා වියදමක් දරන්නේ නැද්ද? ඒ වියදම දරන්න ඕනි අපිද?

**සභාපතිතුමා :-**
ඔව්. මේක අපිට ප්‍රධාන අමාත්‍යාංශයෙන් ,ප්‍රගති සමාලෝචන රැස්වීමේදී අපි ගත්ත එකක්.අවශ්‍ය නම් කාර්මික නිලධාරීතුමා ගෙන්වා වැඩිදුර විස්තරයක් දැනගන්න පුළුවන්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඒ ඇස්තමේන්තුව හදන කොට පස් පිරවීම කියන එක දාල නැ?

**සභාපතිතුමා :-**
දාල නැහැ.එහෙම වුණා නම් ඒකට යන වියදමත් එක්ක මේ ඇස්තමේන්තුවට පළාත් පාලන ආයතනයෙන් හම්බවෙන මුදල දෙන්නේ නැහැ. දෙන්නේ අපිට ඒකට යන මුදල අඩු කරලා. අපි එකඟ වුණා නැත්නම් මේක හම්බවෙන්නේ නැති නිසා අපි එකඟ වුණා ඇස්තමේන්තුව අපි කරන්න.කසළ අංගනය දැන් පිරිලා ඉතිරිලා යනවා. මේවන විට එතන වැඩ කරගෙන යනවා.අවශ්‍ය නම් කාර්මික නිලධාරීතුමා ගෙන්වා විමසමු ඕන් නම්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
අවශ්‍ය නැහැ.කොහොමද මේ පස් පිරවීම දෙන්නේ. වෙන ම ව්‍යාපෘතියක් විදිහට ඇස්තමේන්තුවක් හදලා කොන්ත්‍රාත් දෙනවාද?නැත්නම් කෙලින්ම සභාව විසින් මැදිහත් වෙලා වියදම් කරලා ඒ දේ කරනවද කියලා දැනුවත් කළා නම් ඇති.

**සභාපතිතුමා :-**
ඇස්තමේන්තුවක් හදලා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඊලඟ සභාවට ඉදිරිපත් කරනවා ද?

**සභාපතිතුමා :-**
ඔව්, ඔව්.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.32 යෝජනාව, ඇහැලියගොඩ බේරුවාන කසළ කලමණාකරණ අංගනය පුළුල් කිරීම අදියර I යටතේක්‍රියාත්මක ව්‍යාපෘතිය සඳහාපළාත්පාලනප්‍රතිපාදනප්‍රමාණවත් නොවනබැවින්අත්තිවාරමසඳහාපස්පිරවීමව්‍යාපෘතියක්‍රියාත්මකකිරීමසුදුසුබවට වූ යෝජනාව සඳහා ඇස්තමේන්තුව සකස් කර ඉදිරි සභාවට යොමු කිරීමට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.33. සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.33.බේරුවාන කොම්පෝස්ට් ඒකකය සඳහා ජලය ලබා ගැනීම ව්‍යාපෘතියට අදාළව ඉදිකර ඇති ජල කුළුණ වෙත ජලය ලබා ගැනීම සඳහා බේරුවාන වත්ත ඉඩමෙන් ළිඳක් කැපීමට මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා:-**
මේක අපි සභාවට පැමිණීමට කලින් කරපු ව්‍යාපෘතියක්.මේක සම්පූර්ණයෙන්ම වැඩ නිම කර අවසන්.නමුත් දැනට අපේ තිබෙන වපසරිය තුළ මේකට සුදුසු නැහැ ළිඳක් කපන්න. කොන්ත්‍රාත් එකට මේ ඇස්තමේන්තුවේ නැහැ ළිඳ කපන එක. එම නිසා අපිට සිද්ධ වුණා, ළඟ තියෙන රජයේ ඉඩමෙන් මේ අවසරය ඉල්ල ගන්න.දැන් මේකෙ වැඩ නැවතිලත් අවුරුද්දකට වැඩියි.ඒක අපි ඉස්සර කරපු ව්‍යාපෘතියක්.නමුත් අර වතුර ටික දී ගන්න බැරුව මේ වැඩේ දැන් නැවතිලා තියෙන්නේ.මම පෞද්ගලිකව ඒ අධිකාරීතුමා හමු වෙලා, කතා කරා.එතුමට තනි තීරණයක් ගන්න බෑ කිව්වා.පස්සේ එයාලගේ ප්‍රධාන කාර්යාලයට කාතා කරලා අපේ කාර්මික නිලධාරී මහතා එතනට ගිහිල්ලා, එතන මැණික් තියෙන හින්දා එයාල ගුගල් search එකක් කරලා තමා අනුමත කළේ.මේකට යම් මුදලක් යයි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.33 යෝජනාව,බේරුවාන කොම්පෝස්ට් ඒකකය සඳහා ජලය ලබා ගැනීම ව්‍යාපෘතියට අදාළව ඉදිකර ඇති ජල කුළුණ වෙත ජලය ලබා ගැනීම සඳහා බේරුවාන වත්ත ඉඩමෙන් ළිඳක් කැපීම සඳහා වූ යෝජනාවට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.34. සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**

**06.34.ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ඇහැලියගොඩ බස් නැවැතුම්පල අසල කඩ කාමර 10 සඳහා හා සතිපොළ අසල V හැඩ කඩ කාමර 11 සඳහා දැනට අය කරනු ලබන මුදල 2026 මාර්තු තෙක් පමණක් වලංගු බැවින් 2026 අප්‍රේල් සිට ගාස්තු අය කිරීමට නැවත තක්සේරු කර ගැනීමට මම යෝජනා කරමි.**

**i.බස් නැවැතුම්පල අසල කඩ කාමර 10 සඳහා දැනටඅය කරන ගාස්තුව**

| කඩ කාම අංකය | වර්ග අ ප්‍රමාණ | RT/RP/1248 හා2022.12.29 දිනැති ලිපිය අනුව දැනට අය කරන ගාස්තුව රු. |
|---|---|---|
| 01 | 56 | 2,500.00 |
| 02 | 56 | 2,600.00 |
| 13 | 56 | 2,400.00 |
| 04 | 56 | 2,200.00 |
| 05 | 56 | 2,200.00 |
| 06 | 56 | 2,250.00 |
| 07 | 56 | 2,000.00 |
| 08 | 56 | 1,950.00 |
| 09 | 56 | 2,000.00 |
| 10 | 56 | 2,150.00 |

**11.පොළ අසල V හැඩ කඩ කාමර 11 දැනට අය කරනගාස්තුව**

| කඩ කාම අංකය | වර්ග අ ප්‍රමාණ | RT/RP/1197හා2022.12.29 දිනැති ලිපිය අනුව දැනට අය කරන ගාස්තුව රු. |
|---|---|---|
| 03 | 62 | 1,500.00 |
| 04 | 62 | 1,500.00 |
| 05 | 62 | 1,500.00 |
| 06 | 62 | 1,350.00 |
| 07 | 62 | 1,350.00 |
| 09 | 62 | 1,350.00 |
| 10 | 62 | 1,350.00 |
| 11 | 62 | 1,500.00 |
| 12 | 62 | 1,500.00 |
| 13 | 62 | 1,500.00 |
| 14 | 62 | 1,500.00 |

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මෙතන මන්ත්‍රීවරු සියලු දෙනා දන්නවා ඇති, ඇහැලියගොඩ බස්නැවතුම් අසල කඩකාමර 10 ක් හා පොළ අසල V හැඩ කඩ කාමර 11ක්.තක්සේරුව නැවත තක්සේරු කරලා තමා අපිට මුදල වැඩි කරන්න වෙන්නේ.ඒක තමා මම යෝජනා කරන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක නවීකරණයකට භාජනය කරලා ද, නැත්නම් තියෙන විදිහටම තක්සේරු කරන්නේ.

**සභාපතිතුමා :-**
අතුරලිය මන්ත්‍රීතුමා ඒක හොද යෝජනාවක් කරේ.ඕක අපි නිලධාරීන් කීප දෙනෙක් එක්ක ගිහිල්ලා නිරික්ෂනයක් කරලා v හැඩති කඩ ටික අපිට,ඒ ගොල්ලො තමා කඩ කාමර හදා ගෙන තියෙන්නේ.මේක තියෙන්නේ ඇහැලියගොඩ ප්‍රධාන නගරයේ නිසා, එක තට්ටු දෙකට හදලා ඒගොල්ලන්ටම ආපහු දෙන්න.ආදායම් වැඩි කර ගන්නත් ලොකු රුකුලක් වෙනවා මේ ටික.ඒක දැම්ම කරන්න බැ.සභාවකට දාල සම්මත වෙලත් නැනේ.නමුත් මම දැන් යෝජනා කලේ ටික කාළේ තියෙන එකම තක්සේරු කරන්න තමයි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.34 යෝජනාව**,**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ඇහැලියගොඩ බස් නැවැතුම්පල අසල කඩ කාමර 10 සඳහා හා සතිපොළ අසල V හැඩ කඩ කාමර 11 සඳහා දැනට අය කරනු ලබන මුදල 2026 මාර්තු තෙක් පමණක් වලංගු බැවින් 2026 අප්‍රේල් සිට ගාස්තු අය කිරීමට නැවත තක්සේරු කර ගැනීමට වූ යෝජනාවමහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.35.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.35.නුගදණ්ඩ ජේතවනාරාම විහාරස්ථානයේ දැනට ඉදිකර ඇති සහ ඉදිකරමින් පවතින ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ දී ගෙවීමට සිදුව ඇති දඩ මුදල සභා තීරණයකින් ඉවත් කර දෙන ලෙස ගරු ආණ්ඩුකාරතුමිය වෙත ඉදිරිපත් කරන ලද ලිපිය ඉදිරිපත් කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේක තියෙන්නේ කිනගහවිල,ඒ කොට්ඨාශ මන්ත්‍රීතුමත් ඉන්නවා මෙතන, අදහස් දක්වන්න පුලුවන්.මේ ක විහාල භූමි ප්‍රමාණයක විශාල ඉදි කිරීම් ටිකක් ඉදි කරමින් යනවා.ඇත්තටම මේක දැනගෙන හිටියේ නැ.ඉතින් අපි සභාවට පත්වෙලා ඒක නිරික්ෂණය කළා.විශාල ප්‍රමාණයක් කිසිදු අනුමැතියකින් තොරව ඉදි කරමින් පවතිනවා.අපි එයාලට මාස තුනක් කල් දුන්නා.දැන් ඒ අතරතුරේ දී සභාවට විශාල ආදායම් ප්‍රමාණයක් ලැබෙන්න, අපට අනුමත කරන්න බැරි ඒවා තියෙනවා.එතන හදනවා වැවක්.පරිසර බලපත්‍රහා පරිසර අධිකාරියෙන් නතර කරපු ඒවා තියෙනවා.නමුත් අපට දෙන්න පුළුවන් සීමාවන් ටිකක් තියෙනවා,එයාලගේ වපසරිය අනුව ඉදි කිරීම් හදලා තියෙන ගොඩනැගිලිවලට අපට අවසර දෙන්න පුළුවන්. හැබැයි අවසර ගන්න ඕන.හැබැයි අනිවාර්යෙන් ම අපට දඩ මුදලක් සහ ලොකු මුදලක් සභාවට අය විය යුතුයි.ඉතින් අපි සභාව දැනුවත් කළා.නමුත් අපි ඒකට කැමති වුණේ නැ.අපි කැමති උන් නැති හින්දා උන්වහන්සේලා ආණ්ඩුකාරවරිය හම්බෙන්න ගිහිල්ලා තියෙනවා.ආණ්ඩුකාරවරිය එවන ලද ලිපිය මා අතේ තියෙනවා.එකෙත් එතුමිය කියලා නැ මේක අඩු කරන්න කියලා.එතුමිය කියලා තියෙන්නේ සභාව තීරණයක් ගන්න කියලා.ඉතින් මම යෝජනා කරන්නේ මේක සභාවට උන්වහන්සේලාගේ ඉල්ලීම සලකා බලලා,මේක අඩු කරනවද, ඉවත දානවද, නැත්නම් මේක සම්පූර්ණ අය කරනවද කියන එක තමයි සභාවට ඉදිරිපත් කරන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මට ඒ ලේඛනය ගේන්න බැරි වුණා.ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මොකක් හරි ඉදි කිරිමක් කරනව නම්, අපි දැනුවත් වෙන්නත් ඕනේ. කුමක් හෝ ඉදි කිරිමක් කරනව නම් ප්‍රාදේශිය සභාවෙන් ප්ලෑන් එක අනුමත කර ගන්න ඕනේ.එහෙම කරලා නැති නිසා තමා මේ ප්‍රශ්නය ඇති වෙලා තියෙන්නේ.එතන තියෙන ගොඩනැගිලි 7 කට වගේ මට මතක හැටියට දඩ මුදල තියෙනවා විසි ලක්ෂ ගාණක්.ලක්ෂ විසි ගාණක්ක් වගේ ගාණක්.මට ගාණ හරියට මතක නැ.ලක්ෂ විසි ගාණක් තියෙන දඩ මුදලක් සභා තීරණයකින් අයින් කරනවා කියන්නේ සැහෙන බරපතල වැඩක්.එතන විහාරස්ථානය විශාල ආදායම් තියෙන, ලොකු දානපතියන්ගේ ආධාර උපකාර ලැබෙන පන්සලක්.ගමේ පන්සලක් නම් අපිට මොකක් හරි සහනයක් දෙන්න පුළුවන්.මගේ නම් අදහස මේ ලක්ෂ 20 ඉක්මවලා තියෙන මේ දඩ මුදල අපි සභා තිරණයකින් අයින් කරන එක සුදුසු නැ.අපිට එන්න තියෙන ආදායමක්.අනික මේක වැරදි පූර්වාදර්ශයකුත් වෙනවා.අපි මේ විදිහට සැලසුමක් නැතුව ඉදි කිරිම් කරලා දඩ මුදලක් තිරණය කරාට පස්සේ, එක් පාර්ශවයකට බුරුලක් දුන්නොත් එහෙම අනිත් පාර්ශවවලිනුත් අපිට මේ විදිහට ඉල්ලීම් කරන්න පුළුවන්.ඇත්තටම ගත්තොත් එහෙම, අද න්‍යාය පත්‍රයේ ඒ විදිහම තව යෝජනාවකුත් තියෙනවා.අපි නීතිය හා නීතිය ක්‍රියාත්මක කළ යුත්තේ හැමෝටම එක හා සමානව.මෙතන අපේ ගරු මන්ත්‍රී මණ්ඩලයත් ඒකට එකඟ වෙයි කියලා.අපි මේ දඩ මුදල ඉවත් කරන එක සුදුසු නැ කියන එක මගේ නම් අදහස.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ කාරණය හරිටම එතුමා පැහැදිලි කරා.එන ඒ ව්‍යාපෘතිය ගරු සභාපතිතුමනි, හුදෙක් ම පන්සලක් නිර්මාණය කිරීමක් ම නෙමේ. රටවල් ගණනාවකින් ලැබෙන ව්‍යාපෘතියක් හැටියට තමා ඕක ක්‍රියාත්මක වෙන්නේ.මෙතන දී නීතිය නොදැන ගෙන හිටියා කියන කාරණයට සමාවක් දෙන්න අවශ්‍යතාවයක් නෑ.ඇති වෙන්න ඒ ගොල්ලන්ට සල්ලි එනවා.ඒ නිසා මේ දේ විතරක්, ලිවුමක් දීපු පලියට ගැලවෙන්න අපට අවශ්‍ය නෑ.සභාවට අයවිය යුතු මුදල ගෙවන්න පුළුවන් තත්ත්වයක් ඒ අයට තියෙනවා.උපසභාපතිතුමා කියපු දේට මමත් ස්තුතිවන්ත වෙනවා.ඒ වගේ ම ඒ මුදල අය කර ගත යුතුයි කියන අදහසේ තමයි මමත් ඉන්නේ.

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි ඒ අදහස් පළ කරපු උපසභාපතිතුමාටත්, අජන්ත මන්ත්‍රීතුමාටත්.ඇත්තටම නීතිය නොදැන කියන එක නෙමෙයි, ආයතනවල ඉන්න ප්‍රධාන නිලධාරි තමා එතන ඒ කටයුතු ටික කරගෙන යන්නේ.ඒ ගොල්ලෝ දන්නවා.වැව ඉදි කරනකොට සම්බන්ධ වෙලා තියෙන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හිටපු ඉහළ නිලධාරී මහත්මයෙක්.එයා ඒ වෙන්න ඕන පිළිවෙල හා වෙන්න ඕනේ නීති නොදැන නෙමේ ඒක කළේ.විශාල මුදල් ප්‍රමාණයක් එනවා.ගමත් එක්ක සම්බන්ධයක් නෑ.පිට අය තමා එතනට එන්නේ.මගේ යෝජනාවත් අපට එන්න තියෙන ආදායමක්.ඒක අපි අහිමි කර ගන්න ඕන් නෑ.ඒක නිසා ඒ දඩ මුදල අපි අය කර ගමු කියන යෝජනාව තමා මාත් කරන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක ගැන කතා කරන්න අපේ විපක්ෂයේ තොරතුරු ප්‍රමාණවත් මදි.අපිට මේ න්‍යාය පත්‍රයේ මේ යෝජනාව ආවට පස්සේ අපිට නුගදණ්ඩට ගියිල්ලා එන්න අපට අවස්ථාවක් හම්බුන් නෑ,මේ ගැන තොරතුරු ප්‍රමාණවත් විදිහට හොයලා මොකක්ද මේ වෙලා තියෙන්නේ කියලා බලා ගන්න.ඉතින් අපි කැමති නැවතත් ඔබතුමන්ලා ඒ පාර්ශවත් එක්ක සාකච්ඡා කරනව නම්, අපෙ මේ විපක්ෂ කණ්ඩායමේ කවුරු හරි සාකච්ඡාවට සම්බන්ධ කර ගත්තොත් අපිට මේ යෝජනාව සඳහා ප්‍රතිචාරයක් දන්වන්න පුළුවන්.එක පැත්තකින් බලනකොට ආගමික කටයුත්තක් වෙන තැනක්.එක පැත්තකින් බලන කොට සමහරවෙලාවට ආදායම් උත්පාදනය කරන තැනක්.සභාව පැත්තෙන් බලන කොට මේකෙ යම්කිසි ප්‍රශ්නයක් වෙලා තියෙනවා.ගැටලුකාරී තත්ත්වයක්.අපට ඒක අවබෝධ කර ගන්න ප්‍රමාණවත් සාධක අප සතුව නෑ.අපි ඒකයි කතා කළේ, අපි ගිහිල්ලා හෝ නිරීක්ෂණය කරලා හරි මේ සඳහා අදහසක් ඉදිරිපත් කරමු කියලා.හැබැයි අපේ විපක්ෂයේ මතය තමා මේ පිළිබඳව ඉස්සරහට ඔබතුමාලත් එක්ක එකඟ වෙන්න පුළුවන්ද නැද්ද කියන එක තීරණයක් දෙන්න පුළුවන්.හැබැයි අපට අද වෙනකොට මේ සඳහා අපිට එකඟතාවයක් හරි අදහසක් හරි ඉදිපත් කිරීමේ හැකියාවක් නෑ කියන එක මං මේ වෙලාවේ ප්‍රකාශ කරන්න කැමතියි.

**සභාපතිතුමා :-**
නුගදණ්ඩ ප්‍රදේශයේ මං හිතන්නේ ජාතික ජනබලවේගයේ ඇරෙන්න මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරයෙක් පත්වෙලා නෑ නේ.නැත්නම් අදහස් ගන්න තිබ්බා.ඇත්තටම කරුණාරත්න මන්ත්‍රීතුමා ඒකට හොඳ ම උදාහරණය තමා මෙතන අපේ රුවන්සිරි මන්ත්‍රීතුමා. ඒ පන්සල ළඟ මයි ඉන්නේ.නිතර යනවා එනවා.පෞද්ගලිකව මමත් විමර්ෂණය සඳහා කීපවතාවක් ම ගිහිල්ලා තියෙනවා.මම හා අපේ ආරියදාස මන්ත්‍රීතුමා සහභාගී වුණා.ඒ වගේ ම දන්න අපේ මන්ත්‍රීතුමත් ඉන්නවා.අපි ඒක නිරීක්ෂණය කරන කොට නම් ගම්වල තියෙනවා වගේ අඩු ආදායම් තැනක් නෙමේ.ජාත්‍යන්තර ජාලයක් එක්ක සම්බන්ධ වෙලා තියෙන පන්සලක්. ඒක හින්ද මගෙත් යෝජනාව මමත් හිතන්නේ,ආණ්ඩුකාරවරියත් මේක කියලා නෑ, ඒක අඩු කරන්න කියලා.එතුමිය කියලා තියෙන්නෙත් අපිට සභායෝජනාවක් ගන්න කියලා තමා.අපිට සභාවේ යෝජනාව අනුව මං හිතන්නේ, මේක අපි කල් දාන්න ඕනෙද නිරීක්ෂණයක් කරන්න.එහෙම නැත් නම් මේ මුදල අඩු නොකර අය කරනවද කියලා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපිට නිරීක්ෂණයකින් හරි සාකච්ඡාවකින් හරි තමා මේ මුදලට අනුමැතියක් දෙන්න පුළුවන් වෙන්නේ.මම ඒකයි අදහස් කළේ.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මට පොඩි ගැටලුවක් ආවා අපේ ඉදිරිපස ඉන්න මන්ත්‍රී කණ්ඩායමේ ප්‍රතිචාරය එක්ක.අපේ දිලීන් කරුණාපාල මන්ත්‍රීතුමා මම හිතන විදිහට හැම දෙයක්ම දන්න විදිහට සභාවට ආදායම් ගේන්න කතා කරන මන්ත්‍රීතුමෙක්.මටත් මතකේ හැටියට ඔය ආරාමේ ගැන කතාව දිලීන් මන්ත්‍රීතුමා ලොකුවට කතා කරපු මන්ත්‍රීතුමෙක්.එතකොට ඔබතුමා නොදන්නවා කියන කාරණේ මම නම් පිළිගන්නේ නෑ.ගරු සභාපතිතුමනි එතුමන්ලා දැන් ගිහිල්ලා බලන්න ඕන කියන එක මම හිතන්නේ, සභාවට අයවිය යුතු ලක්ෂ විසි ගාණ ගැන කිසිම තැකීමක් ඒ ගොල්ලෝ දැන් දක්වන්නෙ නෑ.අපිත් ආගම් අදහන, පන්සල්වලට යන හොඳ දායකයෝ.මට පුදුම හිතුණා ඒක දැක්කහම.සභාවේ ආදායම් ගැන හොඳට කතා කරන කණ්ඩායම, මේකෙදි ආණ්ඩු පක්ෂයට පෙරලා, ඔය ගොල්ලෝ මේක කරගන්න, ඒකට එහෙම හරි,අනිත් ඒවගෙ එහෙම නෑ.(ඝෝෂාව)ඔබතුමාලා ප්‍රකාශයක්වත් කළේ නැනේ, ගරු සභාපතිතුමනි මේ ආදායම අපි අය කර ගත යුතුයි කියලා.(ඝෝෂාව) සභාපතිතුමනි මට කියන්න තියෙන්නේ ඒක වැරදී කියන එක.මොකද සභාවේ ආදායමක් ගැන සභාපතිතුමා ඒ යෝජනාවක් විදිහට කළේත්, ඒ ස්වාමීන් වහන්සේලා ඇත්තටම ක්‍රියා කරන්න හදන්නේ, මෙක මේ ගොල්ලෝ දන්නෙ නෑ කියන්නේ මේ ආරාමේ පිහිටවනකොට තිබුණේ අපේ පාලනයකුත් නෙමේ.ඒ ගොල්ලන්ගේ පාලනයක් තිබුණේ.මම දන්න විදිහට ගරු දිනේෂ් ගුනවර්ධන අගමැතිතුමා ඇවිල්ලා

තමා මේ චෛත්‍ය විවෘත කළේ.ඒකාලේ හිටපු ටිරාන් අලස් මන්ත්‍රීතුමා කියන හැම කෙනෙක් ම ඇවිල්ලා තියෙනවා ඔය පන්සලට.ඔබතුමන්ලගේ කාලෙ තමා ඔය පන්සල පිහිටුවලා මේ තරම් විනාශයක් මට්ටමට මේ පන්සල ඉදි වුණේ.හැබැයි දැන් ඒක අපි නීතියට යටත් කරලා, ඒ පන්සල නීතියත් එක්ක ගණුදෙනු කරන තත්ත්වයට ආවේ අපේ පාලන කාළේ.ආගම සම්බන්ධව අපෙන් උපකාරයක් ලැබෙන්න ඕන් නම් ඒක අපි ලබා දෙමු.එහෙම නැතුව නීතියට පිටින් ඒ ගොල්ලන්ට වෙනත් රාජ්‍යක් විදිහට කටයුතු කරන්න ඉඩ දෙන්න බෑ.ඒ සම්බන්ධව ඔබතුමන්ලගේ ප්‍රතිචාරය ගැන හරිම දුකයි කියන එක තමයි මට ප්‍රකාශ කරන්න ඕනේ.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීතුමා වම්පස කණ්ඩායම ගැන කියපු නිසා නැගිට්ටේ.මේ සියලු කාරණා අපි නිහඩව අහගෙන හිටියනේ.1,2,3,4 .. යනකන්.නිහඩව අහන් හිටියා.පනතේ එක රීට පස්සේ 1987 අංක 15 ප්‍රාදේශිය සභා පනත සංශෝධනය කරලා, නිති සම්පාදනය කරලා තියෙනවා අපි මේ සභාව මෙහෙයවන්නේ කොහොමද කියලා.මෙතන දී මේ සියල්ලටම මූලිකව ම පාදක වෙන්නේ මේකෙ තියෙන කමිටු ටිකක්.ආණ්ඩුකාරතුමිය, යම්කිසි ලිපියක් එවුවට පස්සේ ඔබතුමාට ඒක බැහැර කරන්න බෑ.හැබැයි මේවා කොයි ආකාරයෙන් දමේ බදු අය කර ගන්නේ, කොහොමද මේ බදු අපි බැහැර කරන්නේ,මේකත් එක්ක කටයුතු කරන්නේ.අධිහාරයට ලක් වුණොත් ගැටලුවක් වෙනවා.ඔබතුමා කිවුව වගේ මේ විහාරස්ථානය යම්කිසි විදිහකින් මුදල් හම්බ කරන ආයතනයක් නම්, මේක අපි අය කර ගත යුතුයි.අපේ දිලින් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ ඒකෙ වෙන් වෙලා යන පැතිකඩයක් නෙමේ.ඔබතුමාට අපි ගෞරව කරනවා ස්තුති කරනවා ගරු සභාපතිතුමන් ඔබතුමාට මේ දේවල් පිළිබඳව මනා අවබෝධයෙන් යුතුව ඔබතුමා කටයුතු කරනවා.ඔබතුමා උඩ තියන්න නෙමේ මේ කතා කරන්නේ.වැරැද්දක් නම් වැරැද්දක් කියනවා මම.මේකෙදී ඉතාමත් ගෞරවයෙන් යුතුව මතක් කරනවා ඔබතුමාලා මේ කණ්ඩායම, ලේකම්තුමා නිලධාරීන් මේ පනත් ගැන අවබෝධයෙන් කරන කොට අර ඉස්සෙල්ලා කිවුව වගේ විපක්ෂයේ අපට කරුණාකරලා මේකෙ පැහැදිලි තොරතුරු දීලා කටයුතු කරා නම් හොඳයි. මේ 6.30 වගන්තිය යටතේ මේකෙ ආදායම ඇයි අපි බදු වලට ගන්නේ ඇයි.ලසු කරන්නේ කොහොම ද?,ඊටපස්සෙ අපි ලංසු ඉදිරිපත් කිරීම සඳහා අපි දැන්වීම් පත්‍රිකා යොමු කළේ,ඒක ආවෙ නැත්තෙ ඇයි, මෙකෙ මෙන්න මෙච්චරක් ආදායම් උත්පාදනය කරන්න පුළුවන්.නමුත් මේක ගන්නෙ නෑ.මේ ආදි කාරණා අපි කමිටුවකට හරි දාලා කමිටුවේ නිර්දෙශය ගෙනාව නම් මේක මෙච්චර කල් ඇදෙන් නෑ.මුල් ටික ඉක්මනට ඉක්මනට ගියා වගේ මට දැනුණා.

**සභාපතිතුමා :-**

ඇත්තටම මන්ත්‍රීතුමා මේක බදු අය කරන එකක් නෙමේ.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**

නැ නෑ.මං මේ කියන්න ගියේ ගරු සභාපතිතුමා අපි මේ විහාරස්ථානය සම්බන්ධව ගන්න තීරණවලදී ගරු ආණ්ඩුකාරතුමිය විසින් එවන ලේඛනයත් එක්කල ගත්තහම අපිට සිද්ධ වෙන්නේ මේ සභාවට දාන්න.මම මේ මං ප්‍රකාශ කරන්නේ අධිහාරයට ලක් නොවී මේ මන්ත්‍රීවරු ඉන්නැද්දී ඕක නොකර, අපි නීත්‍යානුකූලව අපි තිරණ ගන්න ඕන.එපමණයි ගරු සභාපතිතුමා.

**සභාපතිතුමා :-**

නිත්‍යානුකූල වැඩක් තමා මේ කෙරෙන්නේ.මේ පන්සලට මං පුද්ගලිකව මේ පාර, ඒ ගොල්ලන්ගේ කඨිනෙදි කඨිනය අරගෙන ගිහිල්ලා,ඒගොල්ලො මම තමයි ප්‍රධාන දායකයා කරගෙන ගිහිල්ලා, කඨිනේ පැන් කලේ පවා ගෙනිච්චෙ මම.මමත් බෞද්ධයෙක් හැටියට උපරිම ඒ දේවල් කරනවා.අපේ මන්ත්‍රීතුමා දන්නවා, ඒ ගමේ සමහර අය, ඒ ගම්මු උදව් කරනවට අකමැතියි.ඒ ගමේ ඉන්න අයනේ.නමුත් ස්වාමීන් වහන්සේ නමක් ආරාධනා කරපුවහම අපි එතනට යනවා.ඒ වැඩ ටික කරනවා.මට ඒ පන්සලේ ධර්මය ප්‍රචාරය වීම ගැන මගේ අකමැත්තක් නෑ.නමුත් මට නිරික්ෂණය වෙනවා,මම තනියම නෙමේ ගියේ අපේ ආරියදාස මන්ත්‍රීමත් එක්ක.ඒ යන විදිහට නිරීක්ෂණය වෙනවා මේ මුදල, දඩ මුදලක් අය කරන්නේ.මේක මේ අය කාලයක් තිස්සේ කරගෙන ආවා,අපි පත් වුණාට පස්සේ අපි ගියා නිරීක්ෂණය කරන්න.එතකොට මේ බිල්ඩින් ටික හදලා ඉවරයි.මේක කමිටුවක් අදාළ නෑ.කමිටුවකට දාන්න ඕන එකක් නෙමේනේ මේක.ඉතින් අපිට උවමනා වුණා මේ දඩ මුදල නිශ්චිත එකක් මේක.නීතිය නිශ්චිතයි.මේක මේ සානුකම්පිතව සභාවෙන් ඉල්ලන්නේ, ආණ්ඩුකාරවරිය ඉල්ලන්නෙත් අපිට පුළුවන්ද කියලා අහන්නේ.නිත්‍යානුකූලව කාර්මික නිලධාරී හා විෂය භාර නිලධාරීන් ගිහිල්ලා අනුමත කරපු මුදලක් මේක.ඒ ගොල්ලො ඒක බැහැර කරන් නෑ.ඒ ස්වාමීන් වහන්සේලාත් මේක අසාධාරණ මුදලක් කියන් නෑ.නිත්‍යානුකූලව පිළිගන්නවා.මෙන්න මේ මුදල, පොඩි ගාණක් නෙමේ විසිහත් ලක්ෂ හැටහතර දහස් අටසිය හැත්ත තුනයි ශත දාහතරක්.මේ මුදල.ඒ ගොල්ලො කියන්නේ අයින් කරලා දෙන්න කියලා මිසක්, අපි මේක අයතා ලෙස හොයනවා කියලා උන්වහන්සේලා පිළිගන්නෙත් නෑ.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මේක මේ කාලයක් තිස්සේ හදපු එකක්.මේකෙ කිසි සැලැස්මක් නැතුව හදලා අපිට මේක ඇවිත් තියෙන කාරණය ,ලොකුම පාරිසරික බලපෑම වෙලා තියෙන්නේ, ඉංගිරිය පැත්තට ලොකු පාරිසරික බලපෑමක් තියෙනවා.මොකද පරිසර පද්ධතිය එතන හානි වෙලා තියෙනවා.මේක දඩ මුදලක්.මේක ගත්තෙ නැත්තන් .තමා අපි අධිහාරයකට යන්න වෙන්නේ.මේක බෙදීමක් අරන් හරි මේක අද ඉවරයක් කර ගන්න ඕනේ.මේක නාච්චිමලේ කියන හරියේ ලොකු දියපාරවල් තියෙනවා.ජල යෝජනා ක්‍රමයක් තියෙනවා.ඕවා ඔක්කොම දූෂණය වෙලා තියෙනවා.මාස ගාණක් තිස්සේ සිදු වෙච්ච කාරණාවක්.මම නම් කියන්නේ මේ දඩ මුදල අය කර ගත යුතුයි සභාවට.සභාපතිතුමනි මේක බෙදීමක් අරගෙන හරි මේක ඉවරයක් කර ගමු.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, සභාපතිතුමා ආණ්ඩුකාරවරිය ලිපියක් යොමු කරලා තියෙනවා කිවුවා.ලිපිය අන්තර්ගතය මොකද්ද කියලා අපි දැනුවත් නෑ.සභාපතිතුමා කළ යෝජනාවට දකුණු පැත්තෙ පාර්ශවය කි දේට විරුද්ධ වෙනවා.අපි අය කර ගත යුතුයි කියලා1.55 දිලීන් මන්ත්‍රීතුමා අදහස් කළේ අය කර ගත යුතුයි කියන එකේ දී,එය ප්‍රකාශ කරද්දී අපට අදහසක් දක්වන්න මේ කාරණා ප්‍රමාණවත් නෑ.අධ්‍යනය කරන්න කාලයක් ඕනේ

කියලා අදහස් කළේ.උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු දෙපලක් අදහස් දැක්වුයේ අය කර ගත යුතුයි කියලා.විරුද්ධ වුණා නම් තමා සභාවට ආදායම අහිමි වෙන්නේ.මේ පැත්තෙන් කිසිම විරෝධතාවයක් තිබුණේනෑ.දිලින් මන්ත්‍රීතුමා අදහස් දැක්වුවේ ආණ්ඩුකාරතුමිය එවපු ලිපිය සම්බන්ධව අවබෝධයකුත් නැත්නම්,අධ්‍යනය කරන්න විදියකුත් නැත්නම් ඒත් එක්කම සමාජ හා පරිසර හානිය පිළිබඳව මේ යෝජනාවත් එක්ක කාලයක් ඕන වෙනවා මේක අධ්‍යනය කරන්න.ඒකට පසුබිම නිර්මාණය කරලා දෙන්න.ඒ නිසා ඔබතුමා යෝජනා කරනවා.ඒකට දකුණු පැත්තෙ පාර්ශවයේ විරෝධතාව ප්‍රකාශ වෙනවා.මේ ආදායම අහිමි වෙන්නෑ,යෝජනාව සම්මත වෙනවා කොහොමත්.මේක බෙදීමක් අවශ්‍ය වෙන් නෑ.

**සභාපතිතුමා :-**
මන්ත්‍රීතුමා කියන්න තරම් දෙයත් නෙමෙයි මේ.මම කියන්නම් ආණ්ඩුකාරතුමිය එවල තියෙන එක.එතන තියෙනවා විරෝධතා හා, අපිට මෙතන සභාවට දාලා තේරුමක් නෑ.ඒක මං හිතන්නේ පාර්ශය 17 ක් ගිහිල්ලා විමර්ශන කටයුතු සිදු කරමින් යනවා.මේ සම්බන්ධව අපිට ආණ්ඩුකාරවරිය එවල තියෙන්නේ, "විහාරස්ථානයේ දැනට ඉදි කර ඇති ඉදිකරමින් පවතින ගොඩනැගිලිවල සැලසුම අනුමත කරවා ගැනීම සඳහා ගෙවිමට සිදුව ඇති දඩ මුදල සභා තීරණයක් මගින් ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටිමි." ඒක තමා මාතෘකාව.ආණ්ඩුකාරවරිය ඉල්ලා සිටින්නේ "ඉහත කරුණු සම්බන්ධව කලටුවාව නුගදණ්ඩ ජේතවනාරාම විහාරස්ථානයේ විහාරාධිකාරී පූජ්‍යපූජ්‍ය පොල්ගහවෙල ..... හිමි විසින් ගරු ආණ්ඩුකාරතුමිය වෙත යොමු කර ඇති 2025.10.13 දිනැති ලිපිය හා බැදේ.එම ලිපියේ පිටපතක් මේ සමඟ යොමු කරමි.ඒ අනුව මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර ඔබගේ නිරීක්ෂණය ඇතුලත් වාර්ථාවක් ගරු ආන්ඩුකාරතුමිය වෙත ඉදිරිපත් කිරිම සඳහා මම යෝජනා කරමි.එහෙමයි තියෙන්නේ.ඒක ඇත්තට ම සභාවට දාන්න කියල එතුමිය කියලා නෑ.නමුත් අපි සභාවට දාන්න ඕනේ.ලොකු බදු මුදලක්නේ.ඒක තමයි මම ගරු සභාවෙන් ඉල්ලන්නේ පුජමේ දඩ මුදල අපිට නිත්‍යානුකුලව ලබා ගන්න මුදලක්.මේක අපි ලබා ගන්න එකගතාවය තමා මම ඉල්ලන්නේ.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකරමැතිතුමා:-**
ගරු සභාපතිතුමා, මිට පෙරත් අපිට මතකයි වරිපනම් ගෙවා ගන්න බැරුව යම් පුද්ගලයින් කිප දෙනෙක් අපෙන් ඉල්ලිම් කළා.අපි ඒවා කොටස් වශයෙන් හරි ගෙවන්න කියලා කිවුවා.නමුත් දැන් මෙතන දී සභාපතිතුමනි සභාවට යම් කිසි දෙයක් ලබා ගැනිමට හෝ අය කර ගැනිමේ දී මං හිතන්නේ දකුනු පැත්ත කවුරුවත් ඒකට අකමැති විය යුතු නැහැ.මොකද අපි සභාවේ නියෝජිතයෝ හැටියට.නමුත් මෙතන දිලින් මන්ත්‍රීතුමා කිවුවේ,ඇත්තටම මම දන්නෙත් නෑ ඒ ගැන මොකවත් දන්නෑ.ඒකයි අදහසක් ප්‍රකාශ කළේ නැත්තේ.සභාවට යම් මුදලක් අය විය යුතු නම් අපි ඒවා අය කර ගත යුතුයි.අපි ඒවා බෙදිමක් තියලා.ඡන්දයක් ගන්න ඕන් නෑ මේක.අපේ දේ අපි රැක ගතයුතු යෙක් මේ.එකෙදි ඒ පිළිබඳ අවබොධයක් නැති වුණා මිසක්, මේකට වම් පැත්තෙන් විරුද්ධ විමක් කොයි පැත්තෙන්වත් විරුද්ධ වුණෙත් නෑ ප්‍රකාශ වෙන්නෙත් නෑ.

**සභාපතිතුමා :-**
මේ පැත්තෙ කියලා නෑ අපේ වම් අත පැත්තෙ අපේ ස්වාධින මන්ත්‍රීතුමත් කිවුවේ මේක අය කර ගමු කියලා.අනික මේ වගේ දේකට බෙදිමකට යෑම උචිතත් නෑ.මොකද මේක ශාසනාරක්ෂක වැඩක්.එහෙම කළොත් වෙන පූර්වාදර්ශයක් යනවා එළියට.ඒක හින්දා මං හිතන් නෑ බෙදිමක් අවශ්‍යයි කියලා.

**සභික ඒච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, මේ අඩිධිමත් ඉදි කිරිම ඉදි වෙලා තියෙනවා.මේවාට ගන්න තියෙන අවසර අරන් නැත්නම් කොයි තැනක වුනත් පන්සලක, පල්ලියක කෝවිලක කොහෙ වුණත් ,ඒ නිත්‍යානුකුල රාමුව තුළ යන්න ඕනේ.ඉතින් එකෙ දඩ මුදල් තමා මේ එකතු වෙලා තියෙන්නේ.මට හිතෙන විදිහට මෙතන්ට විශාල මුදලක් එකතු වෙන තැනක්.නිත්‍යානුකුල අවසර අරගෙන කරගෙන ගියා නම් කිසි ප්‍රශ්නයක් නෑ.මොකද මම ඇහැට දැකපු නිසා, මට හිතෙනවා ඒ මුදල් ඒ ගොල්ලන්ට මහ දෙයක් නෙමේ. මේක ඒ ගොල්ලන්ට ගෙවන්න පුළුවන් මුදලක්.ඒ නිසා ඒ මුදල අය කර ගත යුතුයි.තියන එක මගේ යෝජනාවත්.

**සභික අයි.ඒච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, ඊයේ පැවැති සම්බන්ධිකරණ කමිටුවෙත් මේ සම්බන්ධව කතා කළා.මේ සම්බන්ධව සභාවෙන් තින්දුවක් ගන්න එක හොඳයි.පැහැදිලිව නීතිත් තියෙනව නම් ඒකත් දැන දැන වුණා කියලා ත් ජේනව නම්, අපි එකච් ඡන්දයෙන් අපි ඒක සම්මත කර ගමු.

**සභික ඩී.ජී. චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, අදහස් දැක් විමේ දී ආවා විපක්ෂයේ අපි මේකට විරුද්ධයි කියලා.අපිට විරුද්ධ වෙන්න අදහසක් නෑ.හැබැයි ඒකට පන්සලට සල්ලි තියෙනව ද පන් සලට සල්ලි නැද්ද ඒවා අදාල කර ගන්න ඕන් නෑ.අපි විපක්ෂය විදිහට අපි තීන්දුවක් විදිහට අපේ දිලීන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා.මම පේද්ගලිකව ඉන්නනේ හිඟ මුදලක් තියෙනව නම් දඩ මුදලක් තියෙනව නම් අපට අය විය යුතු දෙයක් තියෙනව නම් ඒක එකතු කර ගත් යුතුයි කියලා.හැබැයි විපක්ෂය විදිහට පොදු මතයක ඉන්නව නම් ඒ පොදු ම.ය වෙනුවෙනුත් මම පෙනී සිටිනවා.මට ඒක හංගලා මඩ ගහන්න දෙයක් නෑ.අදහස් දැක් විමෙදී තිබුණා ඒ කාලේ හිටපු අගමැතිවරු ඇවිල්ලා ඒව විවෘත කරා ඒවට මුල්ගල තිබ්බා කියලා.අනිවාර්යෙන් ම අපේ ආණ්ඩුවල හිටියේ බෞද්ධයෝ.අපේ ආණ්ඩුවලින් පන්සල් පල්ලිවලට ක්‍රිස්තියානි පල්ලිවලට අවශ්‍ය පහසුකම් සපයලා දුන්නා.මමත් ඔබතුමන්ලගේ ආන්ඩුවෙන් ඉල්ලන්නේ ඒ පන්සල් වලට පල්ලිවලට කෝවිල්වලට සියලුම ආගම්වලට ඒ අවශ්‍ය කරන පහසුකම් සලසා දෙන්න කියලා.මෙකෙදිත් ඔබතුමාලට පුළුවන් ඒ සුදුසු පියවරක් තියෙනව නම් ගන්න.මේකට අපේ කිසිම විරෝධයක් නෑ.එතකොට පන්සල්වලට පල්ලිවලට කෝවිල්වලට අධ්‍යාපන ආයතනවලට පාසල්වලට උදව් කරනවට අපේ කිසි විරෝදයක් නෑ.ඒක හින්දා අපේ කාලේ ඒ

පන්සල් හදන්න අපේ හිටපු අගමැතිවරු ඇවිල්ලා දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ නම කිවුවා.මුල්ගල් තියලා සහයෝගය දැක්වුවා වගේම තමා ගරු සභාපතිතුමාට කයීනයට ආරාධනා කරාම යන්න වෙනවා.බැකියන්න බැනේ ඒ පන්සලට කැමති පිරිසකුත් ඉන්නවා අකමැති පිරිසකුත් ඉන්නවා.ඕකනේ මූලික ගැටලුව.ඔය පන්සලේ ධර්ම ප්‍රචාරයත් එක්ක වෙන වෙන ගැටලු ඇති වෙනවා කියන එකනේ ගැටලුව තියෙන්නේ.සම්බන්ධීකරන කමිටුවෙත් අපේ විපක්ෂයේ දෙන්නටයි සහභාගී වෙන්න පුළුවන් වුණේ.ඒකෙදිත් ඔය ප්‍රශ්නය ගැන කතා වුණා.ඒ කෙ ඉස්කෝලෙ ගැනත් කතා වුණා.ඒක නිසි ප්‍රමිතියට තියෙනවා කියලා .ඒව සම්බන්දයෙන් ඔබතුමාලා නිසි ක්‍රියාමාර්ගයක් ගන්න.අපේ කිසි විරෝධයක් නැ.හැබැයි ඔබතුමාලගේ බලාපොරොත්තුවක් තියෙනව නම් ඒකට මොනව හරි සහනයක් දෙන්න, අපි මෙතන්ට ආපුවහම දැන ගත්තේ ලක්ෂ 27 ක් කියලා.උපසභාපතිතුමා කියනකොට තමා ඇහුණේ.එ.කොට ඒ මුදල විශාල ප්‍රමාණයක්.අපේ ආදායමෙන් මාසික ආදායමෙන් 25%ක්.විසි පහකටත් වැඩියි.ඔබතුමාලා තීන්දුවක් අරගන්න අපේ විරෝධයක් නැ.පන්සල්වලට පල්ලිවලට අධ්‍යාපන ආයතනවලට රජය විසින් යම්කිසි සහයක් දක්වන්නත් ඕනේ.ප්‍රාෙද්ශිය සභාව විසින් යම්කිසි සහයක් දක්වන්නත් ඕනේ.ගරු සභාපතිතුමාට අපි භාර කරනවා තින්දුවක් අරගෙන ඉවර වෙලා , අපේ කාලෙ වගේ උදව් කරනවද නැද්ද කියන එක ඔබතුමාට තීන්දු කරන්න පුළුවන්.බොහොම ස්තුතියි.

**සභාපතිතුමා :-**
ඇත්තටම අපේ දිලීන් මන්ත්‍රීතුමා කරලා කිවුවෙත්, විරුද්ධතාවයක් නෙමෙයි දැක්වුවේ.මේක හරියට පරිශීලනය කර ගන්න බැ කියන එක තමයි මට නම් අවධානය යොමු වුණේ.එහෙම නැතුව දිලීන් මනත්‍රීතුමා මං හිතන් නැ සභාවට ලැබෙන ආදායමක් අපට අය නොකර ඉන්න තීන්දු කරයි කියලා.ඒක මං පුද්ගලිකවත් දන්න නිසා තමයි මමත් ඒ යෝජනාවට විරුද්ධ උන් නැත්තේ.අංක 17 රීතිවල මෙහෙම තියෙනවා මේකෙ විවාදයක් ඇති වුණ නිසා.බෙදීමක් ඉල්ලුවේ නැත්නම් ඒ යෝජනාව ඒකමතිකව සභාසම්මත වුවා සේ සලකනවා කියලා.විරුද්ධ මත කීපයක් ආපු නිසා කිවුවේ.අපි මේක සම්මත කරන්න ඕනනේ.දැන් ඉල්ලන් නැනේ බෙදීමක් .ඒ නිසා මේක සම්මත වුණ ආකාරය ඒකමතිකව සම්මත වුණා කියලා තමා දාන්න වෙන්නේ.(ඝෝෂාව) සභා රීති 20-(17) “සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාවන් ස්ථිර කරනු ලබූ උවත් විවාදය අවසන් විමෙන් පසු මූලාසනය විසින් යෝජනාවට අදාළව සභාවේ එකඟතාවය විමසිය යුතු අතර එකඟතාවය විමසීමේ දී කිසියම් සභිකවරයෙකු යෝජනාවට අදාලව බෙදීමක් ඉල්ලා නොසිටියෙ නම් අදාළ යෝජනාව සභාව විසින් යථා පරිදි සම්මත වුවා සේ සැලකිය යුතුයි.”

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.35 යෝජනාව,නුගදණ්ඩ ජේතවනාරාම විහාරස්ථානයේ දැනට ඉදිකර ඇති සහ ඉදිකරමින් පවතින ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ දී ගෙවීමට සිදුව ඇති දඩ මුදල සහා තීරණයකින් ඉවත් කර දෙන ලෙස ගරු ආණ්ඩුකාරතුමිය වෙත ඉදිරිපත් කරන ලද ලිපිය ඉදිරිපත් කරමි. ඒ අනුව අදාළ දඩ මුදල් සභාව වෙත අය කර ගැනීමට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

6.36.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.36.ගණුදෙණුකරුවන්ගේ පහසුව හා මූල්‍ය පරිපාලන රීති අංක 28 අනුව මුදල් ගනුදෙනු දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 3.30 දක්වා සිදු කිරීම සුදුසු බවට යෝජනා කරමි.**

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේක සාමාන්‍යෙයන් රීතිවල තියෙන්නේ මුදල් ගනුදෙනු කිරිම එක දක්වා කියලා.නමුත් මේ වෙලාව 3.30 දක්වා මේ මුදල් ගනු දෙනු කිරිමට අපි යෝජනා කරා.3.30 දක්වා මුදල් ගනුදෙනු කිරිමේ දී එදිනම මුදල් තැන්පත් කිරිම සිදු වෙන් නැ.එම මුදල් දාන්න වෙන්නෙ පහුවදා තමා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.36 යෝජනාව,ගණුදෙණුකරුවන්ගේ පහසුව හා මූල්‍ය පරිපාලන රීති අංක 28 අනුව මුදල් ගනුදෙනු දිනපතා පෙ.ව 9.00 සිට ප.ව 3.30 දක්වා සිදු කිරිම සුදුසු බවට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.37.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.37. ආයතනික කටයුතු සඳහා මෙතෙක් භාවිතා වන යන සාමාන්‍ය විද්‍යුත් ලිපිනය වෙනුවට eheliyagoda.ps.gov.lk නම් ආයතනික domain නාමය යටතේ රාජ්‍ය ආයතන සඳහා සම්මත ආකාරයේ වඩාත් ආරක්ෂාකාරී, info@eheliyagoda.ps.gov.lk යන නව විද්‍යුත් ලිපිනය ඉදිරි ආයතනික කටයුතු සඳහා භාවිත කිරීමට යොමු වීම වඩාත් සුදුසු බව යෝජනා කරමි.**

**උපසභාපති යු.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේ යෝජනාව කරන්නේ සභාවේ ඉන්න ගොඩක් අය දැනුමක් තියෙන පිරිසක් ඉන්නේ.අපේ ඉස්සෙල්ලා තිබුණේ @gmail.com යන එක.ඒක සාමාන්‍යයන් හදන එකක් මේක.අපිට පුද්ගලිකව හදන එකක්නේ මන්ත්‍රීතුමා. eheliyagoda.ps.gov.lk මේක අනුමත වෙලා එන්න ඕන එකක්.දිලින් මන්ත්‍රීතුමත් දන්නව මේක.මේ වගේ එකක් දකින කොට රාජ්‍ය ආයතනයක් කියලා දැන ගන්න නම වෙනස් කිරීමක් විතරයි කරන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ වගේ එකක් එන එක ඉතාමත් හොඳයි.මං දැකලා තියෙනවා ගොඩක් ආයතනවල gmail එකෙන් ලේසියට හදා ගන්නවා. domain එකට අපිට ගානක් ගෙවන්න වෙයිද?යෝජනාව හොඳයි.සතුටු වෙනවා.ඒ ගමන් ම කියන්න ඕනේ, මේක හරි ඔෆිසියල් විදිහට වෙන වැඩක්නේ.ඇහැලියගොඩ ප්‍රාේදේශිය සභාවේ facebook page එක ඒක ඔෆිසියල් වෙන්න ඕන.නිළ සමාජ පිටුවක් තමයි ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ නිළ facebook page එක.මම දැක්ක 10.14 වෙනිදා තිබ්බ සභාවේ දී අපි සභාව තුල කතා කරපු එක එදා හවස හරි පහුවදා හරි දාල තිබ්බෙ හරි ඒක පාර්ශවිය විදිහට.අපි බලාපොරොත්තු වෙන්නැ නිළ facebookපිටුවක මේ කාටවත් ඕන විදිහට කාගෙවත් ඕන එපාකම් ඉටු කරන්න,නැත්නම් කලින් පැවති රජයන්ට, කලින් පැවති ආණ්ඩුවලට මඩ ගහන්න ඒවා විවේචනය කරන්න යොදා ගනී කියලා අපි විශ්වාස කරන් නෑ.හැබැයි ඒකෙදි වුණේ, අපේ උපසභාපතිතුමා තමයි සභාපති පුටුවේ හිටියේ, මූලාසනය දැරුවේ.එතුමා කියපු කතාව විතරක් අල්ලගෙන මේ නිළ facebook පිටුවේ සමාජ ගත කළා.ඒක මම විශ්වාස කරන විදියට ඒක නොවිය යුත්තක්.සාමාන්‍යයන් මේ නිළ facebook පිටුව දිහා බලන් ඉන්නවා.මේ වාර්තාව එන්නත් කලින් අපි ගෙදර ගියපු ගමන් ගියින් බලනකොට මෙන්න facebook පිටුවේ ගිහිල්ලා තියෙනවා,මේකෙ මම කියන්නම්, ඔබතුමාට ඉදිරිපත් කරන්න කැමතියි.වත්මන් පාලනයට පෙර පැවති දූෂිත දේශපාලන සංස්කෘතිය අප විසින් වෙනස් කරමින් ඉන්නා බවත්, අපිරිසිදු පාලනයට අපිසිදු ජලය වත්කර පමණින් භාජනයේ ජලය පිරිසිදු නොවන බවත් මොකක්ද කතාවක් දාලා,දේශපාලන වටපිටාවක් තමා ඒ නිළ facebook පිටුවේ දක්න්නේ.මම ඒකට කනගාටු වෙනවා.ඒක එහෙම කරන්න එපා.මේක නිළfacebook පිටුවක් නම්, මේක ඔෆිසියල් නම් මේක ඒ අවශ්‍ය පණිවිඩේ විතරක් දුන්නහම ප්‍රමාණවත්.මේ එක එක්කෙනාගෙ දේශපාලන අරමුණු දේශපාලන ඕනැ එපාකම් ඉටු කරන්න facebook පාවිච්චි කරන්න එපා කියන අදහස මම මේ වෙලාවේ ඉදිරිපත් කරන්න කැමතියි. මේ

**සභාපතිතුමා :-**
බොහොමත් ම ස්තුතියි.ඒකට අපි gmail වෙනස් කිරීම සඳහා ජනාධිපති කාර්යාලයෙනුත් ඉල්ලීමක් කරලා තියෙනවා.ඒකත් එක්ක තමා අපි සම්බන්ධ වුණේ.සමාවෙන්න ඕන.මට facebook පාවිච්චි කරන්න කාලයක් නෑ.ඇත්තටම මම ඒක දැක්කෙ නෑ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,දිලින් මන්ත්‍රීතුමා මතු කරපු කාරණය සම්බන්ධයෙන් අදහසක් ඉදිරිපත් කරන්න.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේක නිලධාරීන් විසින්ද කරන්නේ, නැත් නම් ඔබතුමාලගේ පක්ෂයේ සාමාජිකයෙක් විසින්ද කරන්නේ. මෙම නිළ facebook පිටුව කරන්නේ.

**සභාපතිතුමා :-**
නිළ facebook පිටුව ගෙනියන්නේ,ඇහැලියගොඩ ප්‍රාදශෙිය සභාවේ ඒකට අපිට ඉන්නවා නිලධාරී මහත්මියක්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
එතකොට මේ අදාළ නිලධාරීතුමා හෝ තුමිය තනිකර මේ දේහපාලන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නේ.උපසභාපතිතුමා ඉන්නව නම් මේ නිළ facebook පිටුව විනිවිද භාවයෙන් කෙරෙන්න ඕන් නම් දේශපාලනයෙන් තොරව මේක කරගෙන යන්න සභාපතිතුමා.උපසභාපතිතුමා මට පේන විදිහට,මගෙ ළඟ තොරතුරු තියෙනවා.උපසභාපතිතුමා දේශපාලනයෙන් තමා කරලා තියෙන්නේ.මම කියන්නෙ ඔෆිසියල් facebook පිටුව හරහා ඒවා කරන්න එපා.තම තමන්ගේ පෞද්ගලික ගිණුම්වලින් තමන්ගේ අරමුණු තියෙනව නම් සමාජ ගත කරන්න.ඒක අපිට ප්‍රශ්නයක් නෑ.හැබැයි මේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ facebook පිටුව හරහා ඒ වගේ වැඩ කරන්න එපා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දිලින් මන්ත්‍රීතුමා කියපු කාරණය හරි.මම අතිනුත් ගොඩක් ඉස්සෙල්ලා,ආපු අලුත මගේ අතිනුත් එහෙම වැරැද්දක් වුණා.wattsapp group එක හරහා මගේ වසමේ කරපු වැඩසටහනක් මම දැම්මා.මම ඒකත් delete කළා.ඒකත් ගැළපෙන් නෑ.අපේ පෞද්ගලිකව අපි වසම්වල කරන ඒවත් ඒකට දාන්න ඕන් නැනේ.මොකද මහේෂ් මන්ත්‍රීතුමත් මට ඒකට අවවාද දුන්නා.අයියේ ඒක හොඳ නෑ නේද කියලා.මහේෂ් මන්ත්‍රීතුමත් එහෙම මට්ටමේ ඉන්නේ.මමත් ඒක ඒ වෙලේම අයින් කළා.මං ඊට පස්සේ අපේ පෞද්ගලික කිසිම දෙයක් දැම්මේ නෑ.මම හිතන්නේ අපේ facebook පිටුට අපි එහෙම නොකර හිටියොත් හොඳයි කියලා හිතෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමා අදහස් දක්වපු විදිහට මහේෂ් මන්ත්‍රී එතුමටත් අවවාද කරලා, මේ වගේ එකක් දාපු එක තමා ලොකුම ප්‍රශ්නය.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙතන රීති ප්‍රශ්නයක් වෙනවා.සභාව මේකට අදාළ විෂය සම්බන්ධව නොවේ දැන් යන්නේ.මේ විසය වෙන පැත්තකට යනවා.ඒ සම්බන්ධව ඔබතුමා අවධානය යොමු කරන්න.

**සභාපතිතුමා :-**
Facebook එක නම් අපි නිළ වශයෙන් කරමු.මං හිතන්නේ උපසභාපතිතුමත් ඒකෙ ඇඩ්මින් හැටියට ඉන්නවා.අපි ඒක ඒ විදිහට කරමු.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.37 යෝජනාව**,**ආයතනික කටයුතු සඳහා මෙතෙක් භාවිතා වන ehelips@gmail.comයන සාමාන්‍ය විද්‍යුත් ලිපිනය වෙනුවට eheliyagoda.ps.gov.lk නම් ආයතනික domain නාමය යටතේ රාජ්‍ය ආයතන සඳහා සම්මත ආකාරයේ වඩාත් ආරක්ෂාකාරී, info@eheliyagoda.ps.gov.lk යන නව විද්‍යුත් ලිපිනය ඉදිරි ආයතනික කටයුතු සඳහා භාවිත කිරීමට යොමු වීම වඩාත් සුදුසු බවට වූ යෝජනාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.38.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.38.රජයේ නිලධාරී වෙනුවෙන් ලබා දෙන ආපදා ණය මුදල වෙනුවෙන් මාසිකව වෙන් කරන ලද රු.900,000.00 ක ණය මුදල් ප්‍රමාණය රු.1500,000.00 දක්වා වැඩි කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේක මේ ආපදා ණය මුදලක්.මේක සභාවේ ස්ථිර සේවකයින්ට ලබා දෙන ණය මුදලක්.මේක පොලියත් එක්ක නැවත අපිට හම්බෙනවා.මේ දක්වා මේක තිබුණේ ලක්ෂ 9 යි මේකට මාසෙකට වෙන් කරන්න පුළුවන්.ඒහෙම වුණහම ඒ ලිස්ට් එක මාත් අරන් බැලුවා.ඒ ක අඩු පොලියක්නේ.ඒක හින්දා කවුරුත් කැමතියි ගන්න.ඒ ලිස්ට් එක දිගට ඉන්නවා.අත්‍යවශ්‍ය වැඩක් වුණොත්,අර මූලික නම් ලිස්ට් එකත් එක්ක තමා යන්නේ.සිට්ටුවක් දානව වගේ යන්නේ.ලක්ෂ 9 දීපුවහම එච්චරයි.තව ලිස්ට් එකේ කට්ටිය ඉන්නවා.ඉතින් අපි යෝජනා කළා, නිලධාරී මණ්ඩලයට දෙන්නේ.මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීවරියන්ට දෙන එකක් නෙමේ.ස්ථිර අයට දෙන එකක්.ඒක අපි ලක්ෂ නවය ලක්ෂ 15 දක්වා වැඩි කරන්න. මොකද එතකොට තව කීප දෙනෙකුට ඒ ණය මුදල ඉල්ලන්න පුළුවන්.මේක ණය මුදලක්. මේක පොලියත් එක්ක ආපහු අපිට ලැබෙනවා.මං හිතන්නේ ඒකට කවුරුවත් විරුද්ධ වුණ් නෑ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.38 යෝජනාව**,**රජයේ නිලධාරී වෙනුවෙන් ලබා දෙන ආපදා ණය මුදල වෙනුවෙන් මාසිකව වෙන් කරන ලද රු.900,000.00 ක ණය මුදල් ප්‍රමාණය රු.1500,000.00 දක්වා වැඩි කිරීමට කළ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.39.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.39.ගස් කැපිම සඳහා හැකියාව සහිත පුද්ගලයෙකු සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස තත්ත්කාර්ය පදනම මත, සභාවේ සේවයට බඳවා ගැනීම සුදුසු බවට මම යොජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේ යොජනාව දාන්න අපිට විශේෂ වුණේ,අපිට සෞඛ්‍ය කම්කරුවෝ ඉන්නවනේ.ඒ අතර අපිට සභාවට එනවා ගොඩක් ම,අනතුරු දායක, ගැටහැත්ත පොල භූමිය ගත්තත්,අපි ටෙන්ඩරයක් දීලා එක්කෙනෙකුට දීලා තියෙන්නේ.එතනත් තියෙනවා බිල්ඩින් එකට වැටෙන්න ආසන්න ගස් කීපයක්.නමුත් ඒ ගස් බිම හෙළීමට කම්කරුවෝ හොයා ගන්න හරි අපහසුයි.අපි බැලුවා අපිට හම්බුණ් නෑ.අපි යෝජනාවක් කළේ මම අපි ගන්න, මේකට විතරක් ගන්නවා නෙමේ,අපි සෞඛ්‍ය කම්කරුවෙක් ගන්නවා හැබැයි ඒ කම්කරුවා අපිට අවශ්‍ය කරන අනතුරු දායක ගස් ටික කපා ගන්න අවශ්‍ය වෙලාවේ දී ඒ වැඩෙත් කරනවා.ඒකට අමතර මුදලක් ගන්නවා නෙමේ.ගන්නෙ සෞඛ්‍ය කම්කරුවෙක් හැටියට.එයාගේ වෙන ම සුදුසු කමක් තියෙන්න ඕනේ,දැන් ඉන්න සෞඛ්‍ය කම්කරුවන්ට, ඉන්නෙ ගොඩක් ම ඇත්තටම ලෙඩ වෙච්ච අය.වැඩ කරන්න ඇත්තට ම බෑ.මම නිතර නිතර කැඳවනවා.කසල වැඩත් එක්ක මේක බද්ධ වෙන වැඩක්.නමුත් ඒ ගොල්ලන්ට කොච්චර කතා කරත් වැඩක් නෑ, සමමරුන්ට වැඩ කරන්න බෑ.නමුත් මෙච්චර කාලයක් වැඩ කරලා ඒ ගොල්ලෝ අයින් කරන එකත් හරි නෑනේ.ඒ නිසා මම යෝජනා කරන්නේ, සෞඛ්‍ය කම්කරුවෙක් ගන්නේ, කසල අංගනයේ වැඩටත් එක්ක.ඔහුට අමතර සුදුසු කමක් ලෙස ගස් බිම හෙළීමේ හැකියාව තියෙන කෙනෙක් ගන්න තමයි මම යෝජනා කරන්නේ.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ ගන්න පුද්ගලයා අපි දෛනික වැටුපෙන් නේ ද ගන්නේ.නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ මම ඉන්න නිසා ඒ අවශ්‍යතාව උපරිම තියෙනවා.යම් යම් ගැටලු එද්දී කෙනෙක් යොදවලා අවශ්‍ය කටයුතු කරන්න කෙනෙක් හිටියේ නෑ.අවශ්‍යතාවය හොඳයි.නමුත් සභාපතිතුමනි මේ පුද්ගලයෝ මේ කටයුත්තට යොදවා ගෙන මේ පුද්ගලයන්ට යම් කරදරයක් වුණොත්, නොවෙන්න බැරි නෑ.යෙ෿ කියලා හිතන්නත් බෑ.නොවෙන්නත් බැරි නෑ.ගහක් කපද්දි හෝ මොනව හරි දෙයක් වුණොත් ඒකෙ වගකීම හා අපේ වගකිම මොකද්ද?ස්ථිර සේවකයෙක් වගේ නෙමේනේ මේ පදනමින් ගන්න සේවකයා.හැබැයි අවශ්‍යතාවය උපරිමයි.මම නිවාස හා ප්‍රජා කමිටුවේ ඉන්න නිසා අපට ඒක හොඳටම දැනෙනවා.ආරි මන්ත්‍රීතුමා ඇතුළු අපි කට්ටිය ඉන්නේ.යම්කිසි දෙයක් වුණොත් කටයුතු කරන්නේ කොහොමද කියලා කටයුතු කළොත් හොඳයි කියලා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව ගේන්නෙම අපිට ඇතිවෙලා තියෙන ප්‍රශ්නයත් එක්ක.වැඩිපුරම මේ ගස් සම්බන්ධව පැමිණිලි තියෙනවා.ඒ යන හැම අවස්ථාවක දීම අපි පුළුවන් තරම් මේවා සාමකාමීව සාධාරණ විදිහට කතා කරලා සුහසව විසඳ ගන්න උත්සහ කරනවා.හැබැයි සමහර තැන් තියෙනවා එහෙම කතා කරලත් සද්ද නැතුව නිකන් ඉන්නවා.ඉතින් අවසානතීන්දුවක් අපිට ගන්න විදිහක් නෑ,මොකද්ද කරන්නෙ කියලා.එක්කො අපි කවුරු හරි දම්මවලා කප්පවන්න ඕනේ.නැත්නම් නිත්‍යානුකූලව ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ඕන.මේ වගේ කම්කරුවෙකු ට මේ වගේ ගැටලු මතු වෙයි ම නෙමේ,තියෙන්නේ අත්තක් කපන්න, නැමිලා තියෙන ගහක් කපන්න, ඒවගේ දේවල් තමා හැම තැනකම දකින්න තියෙන්නේ.පිටින් අපි ගෙනැල්ල කරත් මේ වගේ අවධානමක් තියෙන්න පුළුවන්.මේවගේ කම්කරුවෙක් අපි ගත්තොත් ඒ වගේ අවස්ථාවක, එක ගෙදරක තියෙනවා පොල් ගහක්. අපි දිනදීලා එනවා.ඒත් කපන් නෑ.ඒ අවධාමට පත්වන පුද්ගලයා මෙහෙට ඇවිත් ලිඛිතව දීලා අන්තිමට සභාපතිතුමාට බැනලත් යනවා.අපි එතනින් එහාට ගතයුතු ක්‍රියා මාර්ගය මොකක් ද?එතනින් එහාට ගන්න ක්‍රියාමාර්ගය ප්‍රායෝගික වෙන්න.අපි කවුරු හරි එක්ක ගිහින් ඒක අයින් කරලා, මුදලක් අය කරනව නම් ඒක අය කරගෙන හරි, ඒ අවස්ථාව අපිට නෑ එතනින් එහාට.අපි සමහර වෙලාවල් වලදී අපි අසරණ වෙනවා එතනින් එහාට මොකක්ද කල යුත්තේ කියලා.ඒකට විකල්පයක් ලෙස මේක භාවිතා කරන්න පුළුවන් අපට.දැඩි අවධානමක් තියෙන තැන්වලදී එයා භාවිතා නොකර සාමාන්‍ය අවස්ථාවලදී මෙයා භාවිතා කරන්න පුළුවන් කියනඑක මට පැහැදිලි වෙනවා ඒ නිසා මම යෝජනා කරනවා මම නිවාස හා ප්‍රජා කමිටුවේ සභාපතිවරයා හැටියට මේ වගේ පුද්ගලයෙක් මේකට ගත්තොත් සුදුසුයි කියලා.

**සභාපතිතුමා :-**
මේ සුමිත් මන්ත්‍රීතුමා කියපු එකේ අපිට ගතයුතු කරුණක් තියෙනවා.කොන්ත්‍රාත් කරුවෙකු ගස් කපනවා වගේ නෙමේ, අපි සෞඛ්‍ය කම්කරුවෙකු හැටියටනේ ගන්නේ.එයාට අවධානයක් තියෙනවා.මගෙ යෝජනාවක් තියෙනවා මෙහෙම.විදුලි කම්බිකරුවෙකු ලෙස ක්‍රියා කරන අපේ නිලධාරීතුමා, එයා ස්ථිර එක්කෙනෙක්.නමුත් අපි එයාට අමතරව දාල තියෙනවා රක්ෂණ ආවරණයක්.අපිට පුළුවන් සුමිත් මන්ත්‍රීතුමා ඒ ගන්න පුද්ගලයට, ලොකු ගානක් යන් නෑ අවුරුද්දකට.අපි එයාට අමතර රක්ෂණ ආවරණයක් දාමු.එහෙම කළොත් අපිට මේ වැඩේ කර ගන්න පුළුවන් නේ ද?මම යෝජනා කරනවා එහෙම කරමු ද කියලා?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව නම් ගැටලුවක් නෑ.අපි මේක පොඩ්ඩක් සංශෝධනයක් කර ගමු.මේකෙ තියෙන්නේ ගස් කැපීම සඳහා පුද්ගලයෙකු සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස තත්ත්කාර්ය පදනම මත, සභාවේ සේවයට බඳවා ගැනීම නේ.ඒ ගන්න කෙනා ඇත්තටම ගස් කපන්න සුදුසු කෙනෙක් බලලා ගමු.මේ යෝජනාව අනුව සෞඛ්‍ය කම්කරුවෝ වෙන රාජකාරීවලට යොදවන්න බෑ.මම මේ සද්භාවයෙන් කරන යෝනාවක් මේක.අපි මේක සංශෝධනය කර ගමු.මේ යෝජනාවට ඇත්තටම එකඟ වෙන්න බෑ.අවශ්‍යතාවය පිළිගන්නවා.අත්‍යවශ්‍යයි.හැබැයි යෝජනාවට එකඟ වීමට ප්‍රශ්නයක් තියෙනවා,පදනම වැරදියි.අපි ගන්නේ සෞඛ්‍ය කම්කරුවෙක්.සෞඛ්‍ය කම්කරුවෙකු වෙන දේකට යොදවන්න බෑ.ඒකට මම යෝජනා කරනවා යෝජනාව සංශෝධනය කර ගෙන,ගන්න එක ගැටලුවක් නෑ.සභාවට අපි යෝජනාවක් කර ගෙන. වැරදි දෙයක් අපිට කරන්න බැනේ.මේක ඉස්සරහට ප්‍රශ්නයක් වෙන්න පුළුවන්.අපි ගන්නෙ ම කියලා සෞඛ්‍ය කම්කරුවෙකු ගස් කැපීමේ පදනමින්.මම කියන්නේ ඒ යෝජනාව සංශෝධනය කර ගමු කියලා.නැත්නම් මට නම් පෞද්ගලිකව එකඟ වෙන්න බෑ ඒ යෝජනාවට.අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු ඒ මතේ ඉන්නේ.

**සභාපතිතුමා :-**
ගස් කැපිම සඳහා හැකියාව සහිත පුද්ගලයෙකු අපි සෞඛ්‍ය කම්කරුවෙකු තමා ගන්නේ.(සෝෂාව)

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
අපි දන්නවා අවශ්‍යතාවය මොකද්ද කියලා.මේකෙ අවශ්‍යතාවය තියෙන්නේ ගස් කපන පුද්ගලයෙකු අවශයයි.ඒක පිලිගන්නවා.හැබැයි ගරු සභාපතිතුමා ලේකම්තුමාගෙනුත් සාකච්ඡා කරලා බලන්න.සෞඛ්‍ය කම්කරුවෙකු වෙන රස්සාවලට යොදවන්න බෑ.ඒ තනතුරට අදාළ රාජකාරීවලින් පිට යොදවන්න බෑ.එතකොට අපි වැරදි පූර්වාදර්ශයක් දෙනවා,මේ කියන වචනය.මේක අපි ඔක්කොටම ප්‍රශ්යක් වෙන ප්‍රශනයක් මේ මම කතා කරන්නේ.මම මෙතන උත්තරෙත් දුන්නේ අපි මේ යෝජනාව සංශෝධනය කරගෙන ඉදිරියට යමු.

**සභාපතිතුමා :-**
උවමනා වුණේ ගස් කපන්නෙක් ගන්න.මට කියන්න බැනේ සෞඛ්‍ය කම්කරුවෙකු ගන්න ඕන කියලා.කාඩර් එක ඇතිනේ.මට කියන්න උවමනා උනේ අපිට ගස් කපන්නෙක් අවශයයි,අපි ගන්නේ ඒ හැකියාව තියෙන සෞඛ්‍ය කම්කරුවෙකු තමා.ඔයාලට තමා මම කියන්නේ.සෞඛ්‍ය කම්කරුවෙකු ඕන කිවුව නම් ඒක ගැළපෙන් නැනේ.මට ඕනේ ගස් කපන්න හැකියාව තියෙන කෙනෙක් තමා ගන්න ඕනේ.අපි යෝජනාව වෙනස් කරලා

මේක දාමු.අපිට මෙහෙම කෙනෙක් ගන්න ඕනෙත් නෑ.බැනුම් අහලම එපා වෙලා තමා මෙහෙම කෙනෙක් බඳවා ගන්න තීරණය කළේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, මේකෙදි අපි අදහස් කළේ, මේක දැන් එළියට යනවනේතමේ වාර්තාවයි න්‍යාය පත්‍රයයි එළියට යනවනේ.එළියට ගිහාම අපි අවධානමට ලක්වෙන කාරණයක් වෙනවා මේක මේ විදිහට මේක අනුමත කළොත්.ඒක නිවරදි කරලා යෝජනාව අපි අනුමත කළා සේ සලකලා ඊළඟ වාර්තාවට දාමු කියන එක තමා අපේ තියෙන්නේ.

**සභාපතිතුමා :-**
එහෙනම් අපි කම්කරුවෙකු ගන්න තැනට යෝජනාව වෙනස් කරලා යෝජනා කරමු නේ ද?

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, ඒ යෝජනාව **ගස් කැපීම සඳහා හැකියාව සහිත පුද්ගලයෙකු කම්කරුවෙකු ලෙස තත්ත්කාර්ය පදනම මත, සභාවේ සේවයට බඳවා ගැනීම සුදුසු බවට මම යොජනා කරමි.** ලෙස මම සංශෝධිත යෝජනාව ඉදිරිපත් කරමි.

**සභික එච්.ආරියදාසමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.39 යෝජනාව,ගස් කැපීම සඳහා හැකියාව සහිත පුද්ගලයෙකු සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස තත්ත්කාර්ය පදනම මත, සභාවේ සේවයට බඳවා ගැනීම සුදුසු බවට වූ යොජනාවට සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් ගස් කැපීම සඳහා හැකියාව සහිත පුද්ගලයෙකු කම්කරුවෙකු ලෙස තත්ත්කාර්ය පදනම මත, සභාවේ සේවයට බඳවා ගැනීම සුදුසු බවට යෝජනාව සංශෝධන සහිතව ඉදිරිපත් කළ අතර, එම සංශෝධිත යෝජනාව සභික එච්. ආරියදාස මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.40.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.40.ඇහැලියගොඩ ජාතික පාසල මඟින් සභා භූමියෙන් කොටසක් අයත් වන ලෙස විධිමත් අවසරයකින් තොරව ඉදි කිරීමක් සිදු කිරීම සම්බන්ධව ඉදිරියේ දී ගත හැකි පියවර සම්බන්ධව තිරණයක් ගැනීම අපේක්ෂා කරමි.(පා.පා.ස.කොමසාරිස් කාර්යාලයේ 2025.10.04 දිනැති ලිපිය අනුව)**

**සභාපතිතුමා :-**
මේක wattsapp group එකටත් දාල තියෙනවා.මේක සභතාර පළාත් පාලන කොමසාරිස් විසින් එවන ලද යෝජනාව.
**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ ජාතික පාසල වෙනුවෙන් ගිය ගමනත් යෝජනාවක් ඇවිල්ල ඒක අපි සාකච්ඡා කළා. ඒක අපි හැබැයි තාම, අපිට ආරංචි වුණා ඔබතුමන්ලා ආදි ශිෂ්‍ය සංගමය හා විදුහල්පතිතුමිය ඇවිල්ලා ඔබතුමන්ලා එක්ක සාකච්ඡා කළා කියලා.කලින් කිවුව වගේ ඒ සංවාද වලින් සංවාද විසංවාද කරලා තමයි මේ අපිට තිරණයකට එන්න වෙන්නේ.හැබැයි අපි දැනුම් දුන්නා අපිවත් ඒ සාකච්ඡාවලට දැනුම් දෙන්න කියලා.මේ ගැන මොකද්ද වෙන්නේ කියලා විපක්ෂයේ කණ්ඩායම දන්නෙ නෑ.නොදැනුවත්ව කලින් කිවුව වගේ මේ ගැන අපිට තිරණයක් ගන්න බෑ.

**සභාපතිතුමා :-**
මන්ත්‍රිතුමා කිවුව වගේ අපි එක වතාවක් කතා කළා.ඊයෙත් මාව හම්බෙන්න ආවා ආදි ශිෂ්‍ය සංගමයේ කීපදෙනෙක්.එතනදී අපට යෝජනා කළේ,ඒක අපිට තනියම ගන්න පුළුවන් තිරණයක් නෙමේ.සමහර ඒවා අධිහාරයට පවා එන්න පුළුවන් ඒවා තියෙනවා.සමහර ඒවා තියෙනවා පනතේ 83/87 කියවන කොට අර කාණු පද්ධතිය සම්බන්ධයෙන් පොදු කරුණු වලට තියෙන සම්බන්ධය තියෙනවා.මේකෙ සමහර තිරණ අපි කැමති තිබුණත්, මේ පනත් කියවන කොට ගැටලු සහගතයි.මම ඒ ගොල්ලන්ටත් කිවුවේ අපි ඔක්කොම එකතු වෙලා සාකච්ඡා කරමු කියලා.විදුහල්පතිනියත් සම්බන්ධ කරගෙන, ආදි ශිෂ්‍ය සංගමයත් සම්බන්ධ කර ගෙන කීපදෙදෙකුට එන්න කියලා අපි මේකට අවස්ථාවක් ගමු.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි ආරම්භක සැසිවාරයේ දීත් මේ ප්‍රශනයට නිරාකරණය කරන්න කාලයක් දෙන්න කිවුවා.දැන් සැලකිය යුතු කාලයක් ගිහින් තියෙනවා.තාම මේක දෝලනය වෙනවා.මේකට නිශ්චිත ක්‍රියා මාර්ගයක් තාම පේන තෙක් මානෙක නෑ.සාකච්ඡාවට දෙපැත්තම සහභාගී කරවා ගන්න කියලා මම සභාව පැත්තෙන් යෝජනා කරනවා.ඒ එක්කම නිශ්චිත විසඳුම් ගන්න පුළුවන් මාර්ගයක් සඳහා යන්න කියලා මං යෝජනා කරනවා.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මමත් ඇහැලියගොඩ ජාතික පාසලේ ආදි ශිෂ්‍යයෙක්.මම දන්න විදිහට නම් ගිය ආණ්ඩුව කාලේ නවීන් දිසානායක ආණ්ඩුකාර තුමා ඕක ගැන සාකච්ඡා වට ගණනාවක් තිබ්බා.මමත් ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමාගේ සම්බන්ධීකරණ ලේකම් වශයෙන් කටයුතු කරන මම ත් මේකට සම්බන්ධ වුණා.මම හිතනවා ඇත්තටම අර පැත්තට මේ පැත්තට බෝලෙ පාස් කරන් නැතුව,ඇහැලියගොඩ ජාතික පාසල ම වැඩ කලේ NPP එකට.ජාතික පාසලේ ඉන්න ආදි ශිෂ්‍ය සංගමයෙත් වැඩි පිරිසත් ඉන්නේ NPP අති බහුතරයක්.මම නම් කියන්නේ අපිත් බේරිලා ඇහැලියගොඩ ජාතික පාසලත් බේරගෙන, ඉහලින් එන නියෝග දෙපැත්ත බැලන්ස් කරන් නැතුව මේ සභාවෙන් ම තීරණයක් අරගෙන අපි හොඳ දෙයක් කරමු කියලා තමා මම නම් යෝජනා කරන්නේ.

**සභික එච්.ආරියදාසමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක මේ ඉස්කෝලෙ ආදි ශිෂ්‍යයා හරි,නෙමේ කල්පනා කරන්න ඕනේ මේකෙ නිත්‍යානු කූලභාවය.ඒ අනවසර ඉදි කිරිම අපි ලඝු කරන්න හොඳ නෑ.මම ඒ පාසලේ ඉන්න නිසා හරි, මම ආදි ශිෂ්‍යයක් නිසා හරි මගෙ දරුව ඉස්කෝලෙට ගියා කියලා, ඒක සාධාරණීකරණය කරන්න බෑ.ඒක අනවසර ඉදි කිරීමක් නම් ඒ අනවසර ඉදි කිරීම ගැන අපි කතා කරන්න ඕනේ.ඒකට පාසලට යන ක්‍රමවේදයක් තියෙනවා, ඒක ඉල්ල ගන්නව නම්.මේක ප්‍රාදේශිය සභාවට හරි නගර සභාවට හරි , අපි ඒක ඉල්ලන්න ඕනේ විදුහල්පතිතුමා ආදි ශිෂ්‍ය සංගමයෙන් පාසල් සංවර්ධන සමිතිය හරහා ලිඛිත ඉල්ලිමක් යන්න ඕනේ ඒ අවශ්‍ය තැනට.අවශ්‍ය තැනට ගිහින් ඒ හරහා ඒක වෙන් කර ගන්න ඕනේ.ඒකට ප්ලෑන් එකක් තියෙනව නම් ඒකට ඔප්පුවක් තියෙනව නම් ඒකෙන් ඊට පස්සේ ඒ කෑල්ල වෙන් කරලා ලබලා දෙන්න පුලුවන්.ඒකෙ කිසි ගැටලුවක් නෑ.යන්න ඕන ක්‍රමවේදය ඒකයි.අනිත් එක තමයි මනත්‍රීතුමා කිවුව වගේ NPP එකට එකෙ ඕකකොමල ඡන්දෙ දුන්නත් අපිට ඒක අදාළ නෑ.මෙතන ප්‍රාදේශිය සභාව මේක.මේක සිද්ධ වෙන්න ඕනේ යාළුකමටවත් හිතවත් කමටවත් නෙමෙයි.නිත්‍යානුකූලව.ඒ නිසා මම කියන්නේ මේක සාකච්ඡා මාර්ගයෙන් විසඳනව නම් හරි එහෙම නැත්නම් වෙන පැත්තකින් විසඳෙනව නම් හරි එකඟ තාවයකට ආ යුතුයි ඒ දෙගොල්ලොම.ඊට පස්සෙ සමථයකට පත්වෙලා ඒක විසඳ ගත යුතුයි.නැතුව අනවසර ඉදි කිරිමකට අපට එකඟ වෙන්න බෑ.ඒක වැරදි පූර්වා දර්ෂයක්.නිවරදි ක්‍රමවේදයකට ගිහින් විසඳ ගන්න අපිත් කැමතියි කියලා යෝජනා කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ආපු ලිවුමේ,ඒක පැහැදිලිවම තියෙනවා, ඒක හයිලයිට් කරපු ටිකේ,වට්ස්ඇප් Group එකටත් දාල තියෙන්නේ.ඒකෙ මෙහෙම තියෙනවා. සභාව සතු ඉඩමේ බාහිර පාර්ශවයන් ඉදිකිරීමක් සිදු කර තවදුරටත් විධිමත් අනුමැතියක් ලබා ගැනිමකින් තොරව ඉදිකිරීම ව්‍යාප්ත කරමින් පැවතීම හේතුවෙන් සභා දේපළ අන්සතු වීමත්, විධිමත් අවසරයක් රහිතව සිදු කරනු ලබන ඉදිකිරිම නියාමනය නොවිමත්, ඇල මාර්ගය අවහිර විමෙන් ගංවතුර අවධානම ඇති විමත් යන ගැටලුවලට මුහුණ දීමට සිදුවිය හැකිබවට නිරීක්ෂණය විය.එබැවින් සිය භූමිය තුළ අනවසරෙන් ඉදි කර ඇති මෙම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් මහා සභාවට යෝජනා ඉදිරිපත් කර ඉදිරියේදී ගත හැකි පියවර පිළිබඳ සාකච්ඡා කර විධිමත් හා සභා තීරණයක් සහිතව කඩිනම් පියවරගු ගන්නා ලෙසත්, මේ පිලිබඳව ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කිරීමට අදාළ සභා තිරණය සහ ඒ සඳහා ඔබ විසින් ගනු ලැබූ ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මාවෙත වාර්තා කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.අපේ ආරියදාස මන්ත්‍රීතුමා මගේ අදහසම ප්‍රකාශ කළා.මෙතෙක් කාලයක් වෙලා තියෙන ඒවගේ අඩුපාඩුකම් අපි ඇත්තටම නිවරදි කරන්න ඕන.ඒක අපි නිවරදි කරද්දී ,මොකක් හරි නීතිය අදාළ වුනාට පස්සේ ඒ නිතිය ඒක කාටත් සාධාරණ විදිහට හැමෝටම අදාල වන විදිහට තමා අදාළ ඒ නිතිය ක්‍රියාත්මක කල යුත්තේ.ඒක නිසා අපි අපේ කෙනෙක් ද අපිට ඡන්දෙ දුන්නද නැද්ද, ඇත්තටම මං මේ කතා කරන්නේ දේශපාලන විදිහට ගත්තොත් එහෙම මේක සියදිවි හානි කර ගැනිමක් වගේ යවැඩක් වෙන්නත් පුළුවන්.නමුත් අවුලක් නෑ.අපි සභාව ඉන්න කාලේ ඒ ගන්න තීරණය අපි හරි විදිහට ගන්න ඕනේ කියන තැන තමයි මම ඉන්නේ.අද අපිට හරියට තීරණයක් ගන්න බැරි වෙයි.නමුත් අපි අර සාකච්ඡාවට යනව නම්, යන්න ඕනේ මෙන්න මේ තිරණය මත පදනම් වෙලා විතරයි.වෙනත් තිරණ මත පදනම්වෙලා අපි සාකච්ඡා පවත්වන එක මං හිතන්නේ , ඒ සාකච්ඡාවකින් නැවත වටේකින් නැවත එතන්ටම එනව.සම්බන්ධිකරණ දෙකක කතා කරලා තියෙනවා.විදුහල්පතිතුමියයි, ආදි ශිෂ්‍ය සංගමයයි එක්ක සාකච්ඡා කරා.අර හෝද හෝද මඩේ දානව වගේ එකම කාරණය නැවත නැවත කතා කරණ එක තේරුමක් නෑ.මං හිතන්නේ මේක අවසාන තිරණයක් ගැනිම සඳහා, ඇත්තටම දැන් නගර සංවර්ධනය සඳහා මිලියන , ඒ කියන්නේ 2026 අයවැයෙන් ඇහැලියගොඩත් ඇතුළුව ලංකාවේ ප්‍රධාන නගර 10 ක් ,ඇත්තටම අපි සතුටු වෙන්න ඕනේ ඒකෙ ඇහැලියගොඩ කියන නම ඇතුලත් විම ගැන.එතකොට ඇහැලියගොඩ නගරය නගර සංවර්ධනය කිරිමටත් විශාල මුදලක් අපිට ලැබෙනවා.මම මේ කියන්නේ ඒ ගොඩනැගිල්ලේ එකක් තමයි මේ ලිපියේ සඳහන් වන පරිදි එක් පැත්තකින් සභාවේ භූමිය අත්පත් කර ගෙන තියෙනවා.අනික තමයි නගරය මැද්දෙන් යන ප්‍රධාන ජල කාණුවක්.ඒක අවහිර වෙලා තියෙන්නේ.ඇහැලියගොඩ නගර සංවර්ධනය සඳහා මුදල් වෙන් වුණාය කියලා,අවට පස්සේ මිනිසුන්ගේ තියෙන ලොකු ඉල්ලිමක් තමා,ඇහැලියගොඩ නගරයේ ජලා ප්‍රවාහනය ක්‍රමවත් කරන්න කියන එක.ඒ පැත්තට එහෙම තීන්දු තිරණ ගද්දි,මේ පැත්තෙන් මේ වගේ තින්දුවක් ගනිද්දි. අත්තටම පරස්පර විරෝධියි.හරියටම කාණුව උඩින් තමයි ඉදි කිරිම කරලා තියෙන්නේ.ඇත්තටම මම ඇහැලියගොඩ ජාතික පාසලේ ආදි ශිෂයෙක් නොවුණත්,ආදි ශිෂයෙත් වුණා වුණත් මම මේක කියනවා.අපිට ඡන්දෙ දුන්නත් මම.අපි හිතවත්කම නැතුව ඍජු තිරණයක් ගන්න ඕනේ.මොකද ඒ මත පදනම් වෙලා තමා ඊළඟ සාකච්ඡාව ඉස්සරහට යන්න ඕනේ.නැවත වතාවක් මේ සාකච්ඡාව මේ සභාවේ සාකච්ඡා කිරිමට වෙන විදිහට හෝද හෝද මඩේ දැම්මක් සිද්ධ විය යුතු නෑ.අපි දැන් වුණත් අඩුපාඩුවක් වෙලා තියෙනව නම්, අඩුපාඩුවක් කරලා තියෙනව නම් නිහතමානීයව ඒව පිළි අරන් ඒවා නැවත නිවරදි කර ගන්න ඉදිරිපත් වෙනවා මිසක්, ඒ කරපු වැරැද්ද නිවරදි කර ගැනිමට වෙච්ච දේවල් සඳහා වෙන ඒ දේශලශපාලන බලපෑම් කිරිම සුදුසු නෑ කියන එක තමා මගේ අදහස.ඒ නිසා මං යෝජනා කරන්නේ අදහස් කරන්නේ මේ සාකච්ඡාව අපි ගමු,ඒ සාකච්ඡාවේ පදනම විය

යුත්තේ මෙන්න මේ වැරැද්ද නිවරදි කිරීම මිසක් ඒ වැරැද්දට අනුබල දීම වැරදි පූර්වාදර්ශයක් දීම නොවිය යුතුයි කියන අදහස තමා මං මතු කරන්නේ.බොහොම ස්තුතියි.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මමත් ඇහැලියගොඩ ජාතික පාසලේ උසස් පෙළ දක්වා අධ්‍යාපන හැදෑරුවේ.මමත් ඉන්නවා ජාතික පාසල අපේ පාසල තියන එක නෙමේ,මගෙ දරුවෝ යන්නේ ජාතික පාසලට.නමුත් ඒක නෙමේ අදාළ.අපේ දේපලක් නම් රැක ගත යුතුයි කියන තැන අපි ඉන්නවා. එතන දී අපිට තියෙන ගැටලුව අපි මේක දෙපාරක් ම සාකච්ඡාවට යමුයි කියන එක කෙරුන් නෑ.එහෙම වුණානම් විනිවිද භාවයකින් යුතුව සාකච්ඡා කර මේක විසඳගන්න තිබුණා.තැනින් තැන අතන මෙතන කතා කරාට මාස 5 ක් පුරාම මේක ඇදි ඇදි ගියාට කිසිම තැනක සාකච්ඡාවකට භාජනය වුන් නෑ.එහෙම වුණානම් අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කටයුතු කළා නම් මේක වෙන්නෙ නෑ.මෙතන මම දකින එකම වැඩේ වන් මැන් ශෝ එකක් විතරයි යන්නේ.මෙතන අපි කතා කරනවා එකතු වෙලා වැඩ කරන්න.එළියට ගිහාම අපි පැත්තකවත් නෑ.මොනව හරි පුහුණුවකට ගියොත් ඒක ඒ අදාල අයට විතරයි.මොකද මට ඒ පුහුණු තියෙනව මොකද මම රාජ්‍ය නිලධාරියෙක් ඒ හා සම්බන්ධ වැඩ කරන නිසා.නෑ සභාපතිතුමා මේක කියන්න ඕන.ඒ හේතුව තමා මේ වෙලා තියෙන්නේ.අපි සාකච්ඡාවකට යමු.සාකච්ඡා වටයකින් පසු අපි තීරණයකට එමු කියන එක තමා මගේ අදහස.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ බිල්ඩින් එක අඩක් නිම කරලා තියෙනවා.ඒකට යම් විදිහකින් රජය මැදිහත් වෙලා, අර ආරි මන්ත්‍රීකරතුමා කිවුවෙ කර ගන්නව නම් කර ගන්න ක්‍රම තියෙනව කිවුවේ.අන්න ඒ ක්‍රමවේදයකින් හරි කමක් නෑ ඒ අවශ්‍ය තැන්වලට ගිහිල්ලා අවශ්‍ය උපදෙස් අරගෙන, මමත් සෙන්ට්‍රල් එකේ.මගෙ දරුවත් සෙන්ට්‍රල් එකෙ.මම ගියාද අපි ගියාද කියන එක නෙමේ ප්‍රශ්නය තියෙන්නේ.අපි මොන දේ කළත් දරුවන්ට.ඒ ගැන හිතලා ආදි ශිෂ්‍ය සංගමයයි අපියි සාකච්ඡා කරලා මොකක් හරි වැඩක් කරලා දෙන්න පුළුවන් නම් හොඳයි.මේක හැමදාම සාකච්ඡා කරනවා.දෙපැත්තට වෙලා විවාද කරනවා.මේක මං හිතන්නේ තේරුමක් වෙන්නෙ නෑ.ඒ හින්දා දෙපාර්ශවය ම එක්ව කතා කරලා,රජය පාර්ශවයෙන් හරි මොකක් හරි උදව්වක් කරන්න පුළුවන් නම් , අපි මොකක් හරි කරමු. පළමු වෙනි වතාවට කතා කළේ අතුරලිය මන්ත්‍රීතුමා.අපිත් කතා කළා.ඒක ආයෙ ආයෙ මතු වෙනවා උත්තරයක් නෑ.අපි වැඩි කාලයක් යන් නැතුව, ළඟ දවසක් දාගෙන සාකච්ඡා කරලා දේශපාලන අධිකාරියෙන් හරි මේක කටයුත්ත ගැන විසඳුමක් හදා ගමු.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්නමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං හිතන්නේ අපි සාකච්ඡාවට යන්න කලින් අපි තීන්දු කරලා ඉමු දෙනවද නැද්ද කියලා.ඉස්කෝලෙන් මේ ගැන ඉල්ලීමක් කරලා තියෙනවා.සභාවක් විදිහට අපි තීරණය කරන්න ඕනේ අපි ඉස්කෝලෙ ගැන හිතලා අපි මේක දෙනවද නැද්ද කියලා.සරල තීන්දුව අපි අරගෙන , අපි සාකච්ඡාවට යන්.අපි තීන්දුවක් නොගෙන ඒ අයත් එක්ක සාකච්ඡාවට ගිහිල්ලා , ඒ අය ඇහුවොත් එයාලට දෙනවද නැද්ද කියලා , අපිට වෙන්නේ මූණට මූහුණ බලාගෙන ඉන්න.මොකද අපේ එකඟතාවයක් නැනේ අපි කෙලින් තීන්දුවක් ගන්න ඕන. කලින් ආණ්ඩුකාරතුමා මේ තොරතුරු 100% මං නිවරදි නම් , සභාවට බලය පවරලා තියෙනවලු තීන්දුවක් ගන්න කියලා. නවීන් දිසානායක මහතා.එතන ඉඳන් මේ වැඩේ ඉස්සරහට කරන් යන්න තියෙන්නේ. .ඒක හින්ද උපසභාපතිතුමා අපි කාරක සභාවක් බවට පත් කරලා හරි අපි කට්ටියත් එක්ක කතා කරමු.කතා කරලා තීන්දුවක් ගමු මේක දෙනවද නැද්ද කියලා.එතකොට අපිට කියන්න පුළුවන් අපි ගන්න තීන්දුව.මම යෝජනා කරනවා මේක කාරක සභාවක් බවට පත් කරලා කට්ටියත් එක්ක කතා කරමු කියලා.

**සභාපතිතුමා :-**
ඇත්තට ම මේකෙ සරල කාරණාවක් නෙමේ ඇත්ත කතාව.මුදන්නායක මන්ත්‍රීතුමා හා ගයාෂාන් මන්ත්‍රීතුමා කිවුව වගේ නවීන් දිසානායක ආණ්ඩුකාර තුමත් ඉස්සෙල්ල මං කියපු විදිහ තමා කියලා තියෙන්නේ.මේ වැඩේ අපිට පවරලා තියෙන්නේ.මේ කෙදී බලන්න ඕගොල්ලෝ මේ පනත තියෙනව නම්, මේක දෙන්න බෑ.83-84 කියවන්නකො පනතේ.මේක කියවන්න බලන්න දෙන්න පුළුවන් ද කියලා.මේක සභාව සතු දේපලක් මේක.මේ යෝජනාවට මේක අනුමත වෙනව නම් මේක මෙනවා කියලා.මම ඒකට එකඟ නෑ.දැන් මමත් නඩු කිපයකට යනවා පහුගිය කාලේ සභාපතිවරු කරපු වරදවල් වලට.මේක ඇත්තටම ඔඩිට් එකකට යනවා.

**සභික අයි.එච්.රණවීරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි ආයතනික නිතිය අනුව කටයුතු කරන්නේ.අපි හැම දේම කරන්නේ දරුවො වෙනුවෙන්නේ.දරුවො වෙනුවෙන් අනීතික දේවල් කරන්න බෑ.මේ සභාවේදී විතරක් නෙමෙයි අපි මොන තීන්දුව ගමු. මේක සභාවේ දේපලක් නිසා මේක සභාවෙදි තීන්දුව ගමු ඉස්සෙල්ලා.අපි දරුවො එක්ක තරහක් නැනේ.මේ තියෙන තත්ත්වය අනුව මේ ප්‍රශ්නය අපි නීතිමය රාමුවක් තුළ විසඳගමු.

**සභාපතිතුමා :-**
තවදුරටත් සාකච්ඡා කරන්න ඕන්නම් මේක කාරක සභාව බවට පත් කර ගමු.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මහා සභාව කාරක සභාවක් ලෙසට යෝජනා කරමි.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

මෙතැන් සිට මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහා සභාවක් ලෙසට යෝජනා කරමි.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,කාරක සභා තීරණය අනුව සභා තීරණය වෙන්නේ 2025.11.17 සවස 2.00 ට ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ සියලුම සභිකයින්, පාසැලේ ආදි ශිෂ්‍ය සංගමය හා පාසලේ විදුහල්පතිතුමා සියලු පාර්ශව කැඳවලා සියලුම මන්ත්‍රිවරු ඒකට සම්බන්ධ වෙන්න.අපි සාකච්ඡාවක් අරගෙන අවසන් තීරණය අරගෙන ඉදිරි සභාවට යොමු කිරීමට මම යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.40 යෝජනාව**,** ඇහැලියගොඩ ජාතික පාසල මහින් සභා භූමියෙන් කොටසක් අයත් වන ලෙස විධිමත් අවසරයකින් තොරව ඉදි කිරීමක් සිදු කිරීම සම්බන්ධව ඉදිරියේ දී ගත හැකි පියවර සම්බන්ධව තිරණයක් ගැනීම අපේක්ෂා කරමි වූ යෝජනාවට (පා.පා.ස.කොමසාරිස් කාර්යාලයේ 2025.10.04 දිනැති ලිපිය අනුව) ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ සියලුම සභිකයින්, පාසැලේ ආදි ශිෂ්‍ය සංගමය හා පාසලේ විදුහල්පතිතුමා සමඟ 2025.11.17 වන දින ප.ව 2.00 ට සියලුම දෙනා එක්ව සාකච්ඡා කොට, ඒ සඳහා ගත් තීරණය ඉදිරි සභාවට ඉදිරිපත් කිරීමට උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාවිසින් යෝජනා කළ අතර සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කිරිමෙන් පසු මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.41.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.41.බෙරුවාන කසල අංගනය පුළුල් කිරීම සම්බන්ධව කාර්මික නිලධාරී මහතා විසින් 2025.10.17 දින ලිපිය හා සම්බන්ධවයි.ඒ අනුව එමපරිශ්‍රය තුළ කර්මාන්තයක් සිදු කිරිමට නියමිත බැවින් කසල අංගනයේ දැනට පිරී ඇති කසල ගොඩ ගෙපල මට්ටම දක්වා එස්කැවේටර් යන්ත්‍රයක් මඟින් ඇද දැමීම හා කසල ගොඩ තුනී කර ගැනීම සඳහා වූ යෝජනාව ඉදිරිපත් කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
කසල අංගනයේ ඉදිකිරිමක් පවතිනවා.එතන කසල ගොඩගැහිලා තියෙනවා.ඒ සඳහා අපිට එස්කැවේටර් යන්ත්‍රයක් අරගෙන කසල ගොඩ තුනී කර ගන්න තමයි අපි යෝජනා කරන්නේ.ඇත්තටම අපිට තියෙන්න JSB රථය කැඩිලා තියෙන්නේ.පළාත් සභාව අපිට යෝජනාවක් කළා,ඒ ගොල්ලෝ අපිට දෙසැම්බර් මාසේ අලුත් එස්කැවේටර් යන්ත්‍රයක් දෙනවා කියලා අපිට.ඒගොල්ලෝ දෙන්නේ කෝටියක මුදලක්.ඊට වැඩි මුදලක් යනවා. මං මේ අමතරව කියන්නේ.අපිට ඉතුරු ටික දාලා අලුත් එස්කැවේටර් යන්ත්‍රයක් ගන්න අපි ඉල්ලුම්පත් දාල තියෙන්නේ.ඒක හින්දා අපි මේ කුලියක් ගෙවලා කරන්න වෙන අවසාන කසල ඉවත් කිරීම වෙන්න පුළුවන්.ඒ කමා මේ යෝජනා කළේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.41 යෝජනාව**,**බෙරුවාන කසල අංගනය පුළුල් කිරීම සම්බන්ධව කාර්මික නිලධාරී මහතා විසින් 2025.10.17 දින ලිපිය හා සම්බන්ධවයි.ඒ අනුව එමපරිශ්‍රය තුළ කර්මාන්තයක් සිදු කිරිමට නියමිත බැවින් කසල අංගනයේ දැනට පිරී ඇති කසල ගොඩ ගෙපල මට්ටම දක්වා එස්කැවේටර් යන්ත්‍රයක් මඟින් ඇද දැමීම හා කසල ගොඩ තුනී කර ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.42.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.42.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ඉදිරි සංවර්ධන වැඩ සටහන් සඳහා වියදම් දැරීමට අප ආයතනය සතුව පවතින ස්ථාවර තැන්පතුවලින් සභාවට වඩාත් වාසිදායක ලෙස කල් පිරී ඇති ස්ථාවර තැන්පතුවෙන් රුපියල් 4,000,000.00 මුදලක් ලබා ගැනීමට යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
ඇත්තටම මේ වෙන කොට අපි ප්‍රාදේශිය සභාවෙන් අරන් තියෙන ආදායම් හා වියදම් බලන කොට ඒ ගත්ත මුදල් වියදම් වෙලා තියෙනවා.ඒකට මූලිකම හේතුව වුණේ, පඩි වැඩි වීමත් එක්ක අපි සේවකයින්ට ගෙවන

ලද මුදල විශාල ප්‍රමාණයක් වැඩි වුණා.ඒකත් එක්ක අපේක්ෂිත වියදම අනපේක්ෂිත ලෙස විශාල වශයෙන් වියදම් වෙන්න සිදු වුණා.එම නිසා සභාවේ තියෙනවා ස්ථාවර තැන්පත් දාපු ගිණුම් කීපයක්.ඒ එකකින් තමා මේ වඩාත් වාසිදායක, ඉස්සරහට කල් පිරෙන ඒවා තිබ්බොත් අපිට ඒවගේ පොලිය ලැබෙන් නෑ.නමුත් අපි කල් පිරුණ ගිණුමකින් තමා මේ අපි ලක්ෂ 40 මුදල අපි ලබා ගැනීමට යෝජනා කරන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපට දැන ගන්න පුළුවන්ද මේ මිලියන 4 මුදල නිදහස් කර ගන්නේ මොන වගේ කාරණාවලට ද කියලා.මොන වගේ ව්‍යාපෘතිවලටද කියලා.නැත්නම් අපිටත් කියක් හරි හම්බෙනවද විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියලා.අපේ ගම්වලත් වැඩ කරන්න අපිත් ආ ාවෙන් ඉන්නේ.අපිටත් ප්‍රතිපාදන වලට සල්ලි දෙනව නම්, අපිත් යෝජනා ගොඩක් නෙ ැත් තියෙනවා අපේ මන්ත්‍රීවරු.ඒ වෙනුවෙන් ඔබතුමත් යම්කිසි සහයෝගයක් දෙනව නම් අපිත් කැමතියි මේක නිදහස් කරන්න.එහෙම නැත්නම් එකට අපි මැදිහත් වෙන එකේ තේරුමක් නෑ කියලා මං හිතන්නේ.

**සභාපතිතුමා :-**
ඇත්තට ම අපි එහෙම බැලුවෙ නෑ, යෝජනා කාගෙද කියලා බැලුවෙ නෑ.මේ වෙනකොට වසර අවසාන වෙන කොට අපේ තැන්පතුවල හා අපේ තියෙන ගිණුමේ තියෙන මුදල්වලින් කිසිම සංවර්ධන යෝජනාවක් ඉටු කිරිමට අවස්ථාවක් නෑ.අපි බැලුවෙ නෑ, මොකද්ද යෝජනාව කියලා.සංවර්ධන යෝජනාවලට අමතරව, අපට මිලදී ගැනීම් කීපයක් කරන්න වෙයි.ඒකත් එක්ක තමා මේ මුදල නිදහස් කරන්න බලාපොරොත්තු වෙන්නේ.අපි බැලුවෙ නෑ මේ යෝජනා කාගෙද කියලා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, යෝජනා කාගෙද අපිට සල්ලි ලැබෙනව ද කියන මත පදනම් වෙලා මම හා විපක්ෂයේ මන්ත්‍රීවරු මං හිතන්නෑ එහෙම තීරණවලට එකඟ වෙනවා ඇති කියලා.සභාවේ සංවර්දන කටයුතු, ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කිරිම අත්‍යවශ්‍යයි.ඒක ගැටලුවක් නෑ.හැබැයි මිලියන 4 ක් අරලෙන පාරවල් ටිකකට, කරන්න පුළුවන් කොන්ක්‍රිට් දාන පොඩි වැඩ ටිකක්.ඒතකොට ඒ සඳහා, මෙච්චර කාලයක් චෝදනා එල්ල වුණානේ මොනවද කරලා තියෙන්නේ කියලා, හැබැයි එහෙම ගගන්න හරි මිලියන 4 කුත් ඉතුරු කරලා තියෙනවා.

**සභාපතිතුමා :-**
මේක ඇත්තටම ඉතුරු කරලා තියෙන්නේ මන්ත්‍රීවරු නැති කාළේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
හරි.ඔබතුමා කිව්වා, මේකෙ පඩි වැඩි වුණා කිව්වා, පඩිත් ප්‍රතිපූර්ණය වෙනවා.ඒක මේ මිලියන 4 ගන්න හේතුවක් නෙමේනේ ගරු සභාපතිතුමා.අපිට දෙනව ද මොනවද කියන එක නෙමෙයි, මේකෙන් කරන්නේ මොනවද, මේකෙන් ප්‍රාග්ධන වියදමකට යොදව නම් කිසි ගැටලුවක් නෑ.සංවර්ධන කටයුතු කියන්නේ ප්‍රග්ධන වියදමක් නම් උපසභාපතිතුමා ඒක අර්ථ කථනය කරලා පෙන්නන්න.මොනවද හදන්නේ කියලා.පාරකට කොන්ක්‍රිට් ටිකක් දාන්න, ඔබතුමාලගේ අවශ්‍යතාවයට දේශපාලන ප්‍රචාරයක් ගන්න මේ මිලියන 4 ස්ථාවර තැන්පතුව ගන්නව නම් අපේ විරෝධතාව ප්‍රකාශ කරනවා.

**සභාපතිතුමා :-**
එහෙනම් අපි ඡේදිමක යන්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඡේදිමකට නෑ කිසි ගැටලුවක් නෑ.හැබැයි සභාපතිතුමා අපි අපේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.සංවර්ධන කටයුතු කියලා, විපක්ෂයේ යෝජනා එකක්වත් කරලත් නෑ.හැබැයි කරලා තියෙන ඔක්කොම ටික ඔබතුමන්ලගේ යෝජනා විතරයි.ගැටලුවක් නෑ, ඔබතුමන්ලා කරන්න ඕනේ.ආණ්ඩුව තියෙනවා කරගෙන යන්න ඕනේ. හැබැයි ඒ වෙනුවෙන් මේ ස්ථාවර තැන්පතුවේ තියෙන මිලියන 4 අරගෙන, ඔබතුමා දැක්කනේ, අර චාමර සම්පත් ඇමතිතුමාට තියෙන්නෙත් එය වගේ චෝදනා.fix deposit එක මාරු කරා.ඒ වගේ තත්ත්වයක් මේ සභාවෙත් ඇති කරන්න එපා.මේ සල්ලි නිලධාරීන් විසින් හරි බොහොම අමාරුවෙන් ඉතුරු කරන ලද සල්ලි.මේක ප්‍රග්ධන වියදමකට යොදවන්න ගැටලුවක් නෑ.මේකෙන් එක්ස්කැවේටර් යන්ත්‍රයක් ඕන් නම් ගන්න.ඒ වගේ දේකට අපිට එකඟතාවය දෙන්න පුළුවන්.ප්‍රග්ධන වියදමකට.නැතුව මේ දිනපතා තියෙන වියදම්වලට,අරෙහෙට මෙහෙට කාණු කපන්න, ඒවට වියදම් කරන්න මගෙ නම් අනුමැතියක් නෑ.බොහොම ස්තුතියි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සභාවක් විදිහට ලබන අවුරුද්දේ අය වැය අපි ඉදිරිපත් කරනවා ඉදිරියේදී.අය වැය සාකච්ඡා කිරිමේ දී තමා අපිට ඒ ගැටලුව ආවේ.වැටුප් ප්‍රතිපූර්ණය මේ අවුරුද්දෙත් 20% ක් කපලා තියෙන්නේ.ඊටපස්සෙත් ඒ වගේ නැවත 20% ක් කපනවා.ඒ වාගේ 20% 20% ගානේ 2029 වගේ වෙද්දි සම්පූර්ණයෙන් ම ප්‍රාදේශිය සභාවේ ඉන්න සේවක මණ්ඩලය වෙනුවෙන්, නිලධාරී මණ්ඩලයේ වැටුප් ගෙවන්න වෙන්නේ සභාවේ ආදායමෙන්.එතකොට ඇත්තට අපි ලබන අවුරුද්දෙ ඉඳන් ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් රාශියක් අපි සිදු කළ යුතු වෙනවා.ස්තුතිවන්ත වෙනවා අපේ සභාවේ නිලධාරී මණ්ඩලයට අපි 2008 ඉඳන් අපේ ප්‍රාදේශිය සභාවේ වරිපනම් බල ප්‍රදේශයේ වරිපනම් නැවත තක්සේරුවක් කරලා නෑ.දැන් මේ 2025.ඒ සම්බන්ධව දේශපාලන තින්දුවක් අරන් නෑ, මේකෙ සභාපතිවරු ඉඳලා තියෙනවා කිපවතාවක්.සාමාන්‍යයෙන් අවුරුදු 4 කට 5 කට සැරයක් නව තක්සේරුවක් කරන්න ඕනේ.

ඊට පස්සේ නැවත වරිපනම් තක්සේරුවක් කරලා, දැන් වරිපනම් බල ප්‍රදේශයේ කේ පෝරම අපි බෙදාගෙන යනවා.දැන් අපිට තියෙන ප්‍රශ්නෙ තමා, අපි සභාවක් විදිහට ආදායම් අතින් ශක්තිමත් වෙන්න ඕනේ.අපිට තියෙන ප්‍රග්ධන වියදම තමා ගොඩක්ම, අපි පාරක් හදනවා කියන එකත් පුනරාවර්තන වියදමක් වෙන්නේ, ඒ පාර කැඩෙන්න හැදුවොත් එහෙම.පාරක් හැදුවොත් අවුරුදු 20 ක් 30 ක් තියෙන්න ඕනේ.මෙච්චර කාලයක් වුණේ එහෙම නෙමේනෙ.මම ඉන්න වසමේත් තියෙනවා නාකන්දල පාර හදලා තියෙනවා 4 වතාවක්.නාකන්දල තිබ්බටුවාව පාර.පාරක් හැදුවට පස්සේ තියෙන්න ඔනේ, අඩු ගාණේ අවුරුදු 20 ක් 25 ක් තියෙන්න ඕනේ.පාරක් සඳහා වියදම් කරන මුදලත් අනිවාර්යෙනම ප්‍රග්ධන වියදමක් වෙනවා.මේ මිලියන 4 මුදල ගන්නේ ඇත්තටම සංවර්ධන යෝජනා සඳහා ම තමා.ඒක පක්ෂ ද විපක්ෂ ද කියලා තේරිමක් නෑ.(සෝෂාව)

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක රීති ප්‍රශ්නයක්.37-(4) කිසියම් සභිකයෙකු කතා කරන විට වෙනත් කවර හෝ සභිකයෙකු විසින් ඊට බාධා නොකළ යුතුය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
එතකොට ගරු සභාපතිතුමා, අපි සභාව විදිහට අපිට fix deposit එකක තියලා ඒකෙ පොලිය විදිහට එන එක හරි.අපිට තියෙන වත්කම්වලට අපි වියදම් කරලා ඊට පස්සේ අපි, ප්‍රග්ධන හැකියාව වැඩි කර ගන්න ඕනේ.ඒක තමා අපිට තියෙන වගකිම.බැංකුවල සල්ලි තිබිලා, සභාව නැති කාළේ නිලධාරී මේ සල්ලි ඉතුරු කරලා, ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා.මගේ අදහස අපි මේ තැන්පතුවේ මිලියන 4 මුදල අරන් අපි ඔක්කොටම බෙදන්න බැරි වෙයි.අපි මන්ත්‍රිවරුන්ටත් අපි දෙමු හැම මන්ත්‍රිවරයෙකුටම. ඒ කියන්නේ සක්‍යතා අධ්‍යනයක් කරලා ක්‍රියාකරන්න යන සංවර්ධන ව්‍යාපාතිය ගැන.අපි එහෙම කරමු.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒක අරගෙන මොකද්ද කරන්නේ කියලා නිශ්චිත වශයෙන් කියන්න ඕනේ.එතකොට අපි පුළුවන් ඒ සම්බන්ධව විග්‍රහයක් කරන්න මොකද්ද කරන්නෙ කියලා.ව්‍යාපෘතිවලට ගන්නවට විපක්ෂය විරුද්ධ වෙන්නේ, ස්ථාවර තැන්පතුව කියන්නේ අපේ වත්කම.පාසලට භූමි දෙන එකට ලොකු සංවාදයක් ගියා.(සෝෂාව)

**සභාපතිතුමා :-**
අදාළ දේ විතරක් කතා කරන්න.නැත් නම් කාලේ යනවා.අනික මට මෙතන විශේෂ යෝජනා දෙකකුත් තියෙනවා.ඒකටත් මුදල් අවශ්‍ය කරනවා.ඒකත් අත්‍යවශ්‍ය යෝජනා දෙකක්.ඇත්තටම මටනම් තේරෙන් නෑ පාරක් හදනවා කියන්නෙත් ආදායමක් තමයි.ඒක පුනරාවර්තන වෙන් නෑ.ඔයාල මේ මුදල ගන්නවට විරුද්ධත්වක් ගන්නව නම් අපි භේදීමක් ඉල්ලන්නම්. භෙදීමක් ඉල්ලන්න.එතකොට බෙදිමෙන් අපිට ඉස්සරහට යන්න පුළුවන්.නැත්නම් කාලේ යනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, යෝජනාව අංක 6.42 ඒ රුපියල් මිලියන 4, නැත්නම් ලක්ෂ 40 ස්ථාවර තැන්පතුවෙන් නිදහස් කර ගැනීම සඳහා කිසිදු සාධාරණ හේතුන් සඳහා, මොනවටද යොදා ගන්නේ කියන අරමුණ පැහැදිලි නැති හින්දා අපේ විපක්ෂ කණ්ඩායමේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.ඒ වෙනුවෙන් අපි බෙදීමක් ඉල්ලනවා.

ඒ අනුව යෝජනාවට පක්ෂව හා විපක්ෂව අත ඔසවා ඡන්දය ප්‍රකාශ කිරීම සිදු විය.

**සභාපතිතුමා :-**
ඇහැලියගොඩප්‍රාදේශිය සභාවේ ඉදිරි සංවර්ධන වැඩ සටහන් සඳහා වියදම් දැරීමට අප ආයතනය සතුව පවතින ස්ථාවර තැන්පතුවලින් සභාවට වඩාත් වාසිදායක ලෙස කල් පිරී ඇති ස්ථාවර තැන්පතුවෙන් රුපියල් 4,000,000.00 මුදලක් ලබා ගැනීමට සම්මත වෙනවා.ඒක සම්මත වෙන්නේ බෙදීමකින් හෙවත් ඡන්ද විමසිමකින්.ඡන්ද 19 ට ඡන්ද 14 ක් ලෙස සටහන් වීමෙන්.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.42 යෝජනාව,ඇහැලියගොඩප්‍රාදේශිය සභාවේ ඉදිරි සංවර්ධන වැඩ සටහන් සඳහා වියදම් දැරීමට අප ආයතනය සතුව පවතින ස්ථාවර තැන්පතුවලින් සභාවට වඩාත් වාසිදායක ලෙස කල් පිරී ඇති ස්ථාවර තැන්පතුවෙන් රුපියල් 4,000,000.00 මුදලක් ලබා ගැනීම යෝජනාවට බෙදිමක් ලබා ගත් අතර, එහිදී මුදල් ලබා ගැනිමට පක්ෂව ඡන්දව 19 ක් ද, මුදල් ලබා ගැනිමට විරුද්ධව ඡන්ද 14 ක්ද ලැබුණු අතර, ඒ අනුව වැඩි ඡන්ද 5 කින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.43.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.43.කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන්ට කාර්යාල ක්‍රම හා ලිපිගොණු කළමණාකරණය පිළිබඳ පුහුණුවක් පැවැත්විමට හා ඒ සඳහා රුපියල් 39100.00 ක වියදමක් දැරීමට මම යෝජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
ඇත්තටම මේක මේ අවුරුද්දෙ වෙන් වෙලා තිබුණා මේ කාර්ය මණ්ඩලයට ලිපි ගොණු හා කළමණාකරනය පිළිබඳ පුහුණු වැඩසටහනක් සිදු කිරීමට.ඒක වෙන් වෙලා තිබුණු මුදලක්.නමුත් ඒක අපිට කර ගන්න බැරි වුණා.නිලධාරී මණ්ඩලය පසුගියදා පැවැත්වුණු සාකච්ඡාවේ දී, ඒ ගොල්ලොත් තිරණය කර ගත්තා, මේ පුහුණුව සඳහා කීප දෙනෙක් මේ ස්ථානයට, ඇත්තටම සම්පත් දායකත්වය ලබා දෙන්න එන්නේ.ඔහුට මුදලක් හා නිලධාරීන්ට තේ වියදම් සඳහා තමා මේ රුපියල් 39100.00 යන්නේ.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.43 යෝජනාව,කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන්ට කාර්යාල ක්‍රම හා ලිපිගොණු කළමණාකරණය පිළිබඳ පුහුණුවක් පැවැත්විමට හා ඒ සඳහා රුපියල් 39100.00 ක වියදමක් දැරීමසඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.44.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**

**06.44. පැල්පිටිය පාරේ වඩුතුන්පැල කුඹුරට මායිම්ව ඇති ආදාගල දක්වා දිවෙන කණුතැටිය පාරට අදාළ අංක ඩබ්ලිව්.ඒ.03/2023 දරණ නඩුව බස්නාහිර පලාත්බඳ මහාධිකරණයේ දී (අවිස්සාවේල්ල) සමථ වී ඇති අතර ඒ අනුව මෙම මාර්ගය පවරා ගැනිම මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේක සැහෙන කාලයක් නඩු කියලා,මහාධිකරණයෙන් ආපු තීන්දුවක්.අපේ දිලීන් මන්ත්‍රීතුමා ඒ ගැන දැනුවත් ඇති.ඒනිසා මේක අපිට අධිකරණ තීන්දුවකින් අපිට මේක පවරලා.මේක අපිට පවරා ගන්න වෙනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.44 යෝජනාව,පැල්පිටිය පාරේ වඩුතුන්පැල කුඹුරට මායිම්ව ඇති ආදාගල දක්වා දිවෙන කණුකැටිය පාරට අදාළ අංක ඩබ්ලිව්.ඒ.03/2023 දරණ නඩුව බස්නාහිර පලාත්බඳ මහාධිකරණයේ දී (අවිස්සාවේල්ල) සමථ වී ඇති අතර ඒ අනුව මෙම මාර්ගය පවරා ගැනිම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.45.සභාපතිතුමාගේ යෝජනාව.

**සභාපතිතුමා :-**
**06.45.හිගඟුරනගේ වත්ත මාර්ගය පවරා ගැනීම මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේ පාරත් අධිකරණ නඩු තින්දුවක් යන එකක්.මේක හැබැයි ඒ පාර්ශවයෙන් 50% ක් නඩු ගාස්තු, මේ ලිපිය මං ළඟ තියෙනවා.නඩු ගාස්තු දීමට ඒ ගොල්ලෝ කැමති වෙලා තියෙනවා.ඒ කියන්නේ අපිට දරන්න වෙන්නෙ 50%යි.නඩු ගාස්තු සම්පූර්ණම ඒ ගාස්තු එතනින් දැරීමට ඒ ගොල්ලෝ පොරොන්දු වෙලා තියෙනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.45 යෝජනාව,හිගඟුරනගේ වත්ත මාර්ගය පවරා ගැනීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.46.සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ යෝජනාව.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
**06.46.මාහිංගොඩ අනුලා භික්ෂුණී ආරාමයට යන මාර්ගය සංවර්ධන කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මාහිංගොඩ අනුලා භික්ෂුණී ආරාමයට යන මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බැවින් එය ඉතා ඉක්මනින් සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ 6.46යෝජනාව,මාහිංගොඩ අනුලා භික්ෂුණී ආරාමයට යන මාර්ගය සංවර්ධන කිරිම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.47.සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ යෝජනාව

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
**06.47.තලාවිටියවත්ත නියාස් මහතාගේ නිවස ඉහළින් යන පටු මාර්ගය සඳහා පැති බැම්මක් දැමීමට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, තලාවිටියවත්ත නියාස් මහතාගේ නිවස කියන්නේ ගෙවල් ගොඩක් එක තැනක හදපු ස්ථානයක්.එතන කිසිම සැලසුමක් නැතුව නිවාස ඉදි කරලා තියෙන ගමක්.ඒනිසා තමා ඒ මාර්ගය පටු මාර්ගයක් හා අනාරක්ෂිත මාර්ගයක් වෙලා තියෙන්නේ.ඒකට පැතිබැම්මක් දාලා සංවර්දනය කරන්න කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ 6.47 යෝජනාව,තලාවිටියවත්ත නියාස් මහතාගේ නිවස ඉහළින් යන පටු මාර්ගය සඳහා පැති බැම්මක් දැමීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.48.සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**06.48.දකුණු කරඳන නිකගලවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම දකුණු කරඳන දමිල සිංහල ජන කොටස් දෙකක් නියෝජනය කරන කොට්ඨාශයක්.ඔවුන් සහෝදරාත්මකව ජීවත් වෙනවා.මේ යෝජනා කරල තියෙන මාර්ගයේ වැඩි ප්‍රතිලාභයක් ලබන්නේ මගෙ දමිළ සහෝදරවරු.ප්‍රාදේශිය සංවර්ධන යෝජනාවේ දී ව්‍යපෘතිය ක්‍රියාත්මක කරවීමේ දී අපේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව, මම බලාපොරොත්තු වෙනවා ඒ සහෝදර ජනතාවට සාධාරණත්වයක් ඉෂ්ඨ කරන්න.ඔබතුමන්ලගේ සාධනීය මැදිහත් වීමක් බලාපොරොත්තු වෙනවා. නිකගලවත්ත මාර්ගය සංවර්ධනය කර ඒ ජනතාවට ඇති වී ඇති අපහසුතාවය මගහරවා ගැනීමට කටයුතු කර දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 6.48 යෝජනාව,දකුණු කරඳන නිකගලවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.49.සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**06.49.කිරිල්ලාවල විහාරහේන මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**
**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම කොට්ඨාශයත් ඉතාමත් දුෂ්කර කොට්ඨාශයක්.මාර්ගයේ මුල කොටස ඉදි කිරීම් කරලා තියෙනවා.දැන් සංවර්ධනය කිරිමට තිබෙන කොටස ගල්පරවලින් ගමන් කරන්න තියෙන මාර්ගයක්.රබර් සීට් නිශ්පාදනය කරන ජනතාවක් සිටින්නේ.ඔවුන්ගේ වගා කටයුතු, එදිනෙදා ජීවන තත්ත්වය පහසු කර ගැනිමට මාර්ගය සංවර්ධනය කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කඳු සහිත බිමක් තියෙන මාර්ගයක්.දීර්ග කාලයක ඉඳන් ඒ මිනිස්සු අපේක්ෂා කරනවා ඒ පාර සංවර්ධනය කරන්න.අදියර කීපයක් සංවර්ධනය කරලා තියෙනවා මුල කොටස.හදිසියේ ලෙඩෙක්වත් අරන් යන්න පුළුවන් පරිසරයක් නෑ ඒ මාර්ගය ගුළ. මොකද ත්‍රිවිල් එකක්වත් යන්නේ ඉතාමත්

කලාතුරකින්.ගල් උඩින් පැනලා තමා යන්න වෙලා තියෙන්නේ.මේ මාර්ගය සංවර්ධනය කිරිම කාලෝචිතයි කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 6.49 යෝජනාව**,**කිරිල්ලාවල විහාරහේන මාර්ගය සංවර්ධනය කිරිම සඳහා වූයෝජනාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.50.සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**06.50.කම්බිකොටුව බෝක්කුව අසල සිට ලාල් මහතාගේ වෙළඳසැල දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම මාර්ගය තියෙන්නේ වික්‍රමකන්ද මාර්ගයේ.ප්‍රධාන මාර්ගය සංවර්ධනය වෙලා තියෙන්නේ.අතුරු මාර්ගයක් තියෙන්නේ.මේ මාර්ගයේ වලවල් හැරිලා තියෙන්නේ.මේ ප්‍රදේශයේ ජනතාව අපහසුතාවට පත්වෙනවා ඒ නිසා.ඒ නිසා මේ මාර්ගය සංවර්ධනය කර ගැනිමට ඔබතුමාගේ මැදිහත් වීම බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 6.50 යෝජනාව**,**කම්බිකොටුව බෝක්කුව අසල සිට ලාල් මහතාගේ වෙළඳසැල දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරිමසඳහා වූයෝජනාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
ඔයගොල්ලන්ට මතක ඇති අපි කාරණා දෙකක් අපි කල් දාගත්තා.6.30 හා 6.31ඒ සඳහා ලේකම්තුමා ලැස්තිවෙලා ඉන්නවා, උත්තර සපයන්න. එක නිසා මම සභාවෙන් ඉල්ලා සිටිනවා මහා සභාව කාරක සභාවක් ලෙසට යෝජනා කරන ලෙසට.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මහා සභාව කාරක සභාවක් ලෙසට යෝජනා කරමි.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

මෙතැන් සිට මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහා සභාවක් ලෙසට යෝජනා කරමි.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
]ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

කාරක සභාවෙන් ගන්නා ලද තීරණය අදාළ යෝජනාවට සම්බන්ධ කර ඇත.

**සභාපතිතුමා :-**
**හදිසි යෝජනා:-01**

**මහජනතාව වෙත අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා භාවිතා කිරීමට කාර්යාලය වෙත මිලදී ගැනීමට නියමිත කාර්යාල උපකරණවල වටිනාකම් සිමාව,ප්‍රසම්පාදන කමිටුවේ සීමාව වන රුපියල් මිලියනයේ සීමාව ඉක්මවා යන බැවින් කාර්යාල උපකරණ මිලදී ගැනිමට සභාවේ අනුමැතිය ලබා ගැනීමට මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මන්ත්‍රිවරුත් හිතයි මොකද මේක හදිසි කියලා.ඇත්තම කියනව නම් ඡායා පිටපත් යන්ත්‍රය කැඩිලා.මේ සභාවට අවශ්‍ය වාර්තා ඇත්තටම ගැහුවේ තොරණගොඩ සම්බන්ධිකරණ කාර්යාලයෙන් තමා ගහලා දුන්නේ.මෙතන ඡායා පිටපත් යන්ත්‍රයක් තියෙනවා, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර දෙකක්, පරිගණක ප්‍රින්ටර් දෙකක්, ප්‍රාජෙක්ටර් එකක්,ups 13 ක්.මේවා ඇත්තටම ප්‍රසම්පාදන කමිටු නිර්දේශය අනුව තමා මිල දී ගන්නේ.ඒ වගේම ඩෙස්ටොප් පරිගණක යන්ත්‍ර 4 ක් ගන්න තියෙනවා.අපේ කාර්යාලයේ වැඩකටයුතු මන්දගාමී වෙලා

තියෙනවා.අලුතින් ඉල්ලලා තිබුණට මේ වෙනකන් අපිට ලැබුණ් නෑ.ඒ හින්දා ඒවා එනකන් බලන් හිටියොත් අපිට වැඩ ටික කරගන්න වෙන් නෑ.පොටෝ කොපි ගහන යන්ත්‍රය පවා කැඩිලා තියෙන්නේ.ඒ හින්දා හදිසියේම ගන්න වෙලා තියෙන නිසා තමා මම මේක හදිසි යෝජනාවක් විදිහට සභාවට ඉදිරිපත් කළේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කළ I යෝජනාව , මහජනතාව වෙත අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා භාවිතා කිරීමට කාර්යාලය වෙත මිලදී ගැනීමට නියමිත කාර්යාල උපකර්ණවල වටිනාකම් සීමාව,ප්‍රසම්පාදන කමිටුවේ සීමාව වන රුපියල් මිලියනයේ සීමාව ඉක්මවා යන බැවින් කාර්යාල උපකර්ණ මිලදී ගැනිමට සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**හදිසි යෝජනා:-02**
රාජ්‍ය පරිපාලන,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2025 වර්ෂය සඳහා 2025.10.22 ලිපිය මඟින් ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව සඳහා ට්‍රැක්ටර් ටේලරයක් මිලදී ගැනිම සඳහා රුපියල් 750,000.00 ක මුදලක් වෙන් කර ඇති අතර, ඉතිරි මුදල සභා අරමුදලින් වැය කිරිමට හා එම මුදල යොදා ටේලරයක් මිලදි ගැනිමට මම යෝජනා කරමි.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේක හදිසි යෝජනාවක් විදිහට දාන්න වුණේ,අපිට 2025.10.22 තමා මේ ලිපිය ලැබුණේ.අපිට 750,000.00 ක මුදලක් අපිට හම්බෙනවා.ඔයාල දකිනවා ඇති කුණු අදින ඒවා.ඇත්තටම අබලන් වෙලා තියෙන්නේ.තව පොඩි මුදලයි අපිට දාන්න වෙන්නේ.ඉතින් අපි මේක හදිසි යෝජනාවක් හැටියට මේක දාලා, හැකි ඉක්මනින් මේක ප්‍රධාන අමාත්‍යාංශයට යවන්න ඕනේ.ඒක හින්ද තමා මම මේක හදිසි යෝජනාවක් විදිහට ඉදිරිපත් කළේ.750,000.00 ක මුදලක් අපිට හම්බෙනවා.ඉතුරු මුදල තමා ටේලර් රථය වෙනුවෙන් ලබා ගන්න තියෙන්නේ.මේක අපි බැලුවා,තව පොඩි ගාණක් තමා අපිට සභාවෙන් වෙන් කරන්න සිද්ධ වෙන්නේ.ඒක නිසා තමා මේක හදිසි යෝජනාවක් විදිහට දැම්මේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පොඩි ගාණ කීයද කියලා දැන ගන්න පුළුවන්ද?

**සභාපතිතුමා :-**
ප්‍රසම්පාදන තාම කැදෙව්වෙ නෑ.සභා අනුමැතිය ඕන හින්ද තමා සභාවට ඉක්මනට දැම්මේ.
ඉතුරු මුදල ගන්න ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තමා යන්න වෙන්නේ.අපිට මේ ලක්ෂ 750,000.00 ක මුදල නැති වුණොත් කියලා තමා අපි අදම මේක සභා අනුමැතියට ඉදිරිපත් කළේ.

**සභාපතිතුමා :-**
අපි දන්නවා ඊළඟ 2026 වර්ෂය සඳහා අපිට අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන්නට අවශ්‍යයි.අපිට ඊළඟ සභාවට ඒක ඉදිරිරිපත් කරන්න, අපිඒ සඳහා දිනයක් වෙන් කරලා දාලා තියෙනවා,2025.11.20 ඒකාබද්ධ කාරක සභාවක් කැඳවලා, ඒකෙන් තීරණය ගන්න.දැනට හදලා තියෙනවා අයවැය වාර්තාව.ඒක අපි සියලුම කාරක සභා ටික කැඳවලා,මේ ගැන සාකච්ඡා කරන්න අපි විශේෂ දිනයක් හැටියට මේ මාසෙ 20 වෙනිදා පෙ.ව 10.00 ට ප්‍රාදේශිය සභා ශ්‍රවනාගාරයේදී සාකච්ඡා කරන්න එන්න.මේ සඳහා සිටින සියලුම කාරක සභා සියලුම සාමාජිකයින් පැමිණෙන්න.අපි අයවැය හදලා තියෙන්නේ.ඒකට අදහස් විමසා ගන්න ඇත්තටම අත්‍යවශ්‍යයි.මේකට යෝජනා ඉදිරිපත් කරන්න සියලුම මන්ත්‍රිවරු එනව නම් වඩා හොඳයි.පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ ගැන සාකච්ඡා කරන්න සියලුම මන්ත්‍රිවරුන්ට මම ආරාධනා කරනවා පැමිණෙන්න කියලා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කළ II යෝජනාව , රාජ්‍ය පරිපාලන,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2025 වර්ෂය සඳහා 2025.10.22 ලිපිය මඟින් ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව සඳහා ට්‍රැක්ටර් ටේලරයක් මිලදී ගැනිම සඳහා රුපියල් 750,000.00 ක මුදලක් වෙන් කර ඇති අතර, ඉතිරි මුදල සභා අරමුදලින් වැය කිරිමට හා එම මුදල යොදා ටේලරයක් මිලදි ගැනිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.කාරක සභා වාර්තා**

**07.01.2025.10.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.10.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.02.2025.10.17 වන දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාර්මික සේවා කමිටුවේ 2025.10.17 හයවැනි යෝජනාවට අවධානය යොමු කරන්න කැමතියි, මෝරගල රජමහා විහාර මාවතේ පළමු පටුමඟ අඩි 16 ක පළලින් යුත් ප්‍රාදේශිය සභාවට අයත් මාර්ගයේ ඇතැම් ස්ථානවල පළල අඩු ස්ථාන ඇති බව නිරීක්ෂණය වෙලා තියෙනවා.ඒ පිළිබඳ සභාවට ඉල්ලීමක් කරලා තියෙනවා මැනලා සීමා ලකුණු කරන්න කියලා.කමිටුවේ තීරණයක් දීලා තියෙනවා.ඒ එක්ක ම මම සභාවට යෝජනා කරන්න කැමතියි, දැන් හරි ලස්සනට ඒ රජමහා විහාර මාවතේ දෙපැත්තේ හරිම ලස්සනට මල් පිපිච්ච, හිටවලා තියෙනවා මල්ගස්.සභාපතිතුමනි සභාව මැදිහත් වෙලා, ඒ මල් ගස් ටික තාප්පෙන් ඇතුළේ හිටවන්න කියලා ඒ ඉල්ලීම කරන්න කියලා මම යෝජනා කරනවා.මොකද පාරේ තමා මල් ටික හිටවලා තියෙන්නේ.ලස්සනට මල් තියෙනවා.හැබැයි ඉතින් වාහනයක් මාරු කරන්න විදිහක් නෑ.ඒ ජනතාව දැනුවත් කරන්න ඕනේ. මාත් කීප අවස්ථාවක දී ම ඔවුන්ට පෞද්ගලිකව කිවුවා, සමහරු තරහා වුණා.හැබැයි සභාව මැදිහත් වෙලා ඒ දේ කරනව නම් ගොඩක් වටිනවා කියන අදහස මේ වෙලාවේ ඉදිරිපත් කරන්න කැමතියි.

**සභාපතිතුමා :-**
නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සභාපතිතුමා ඉන්නවද?ඒ සම්බන්ධයෙන් ඔබතුමා දැනුවත් ද?

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කමිටුවේ තීරණය වුණේ,සැලසුමක් තියෙනවා නගරයේ මාර්ග මිනුම් කරන්න.ඉදිරියේදී ඒ ක්‍රියාමාර්ගත් එක්ක, මේ මාර්ගයේ මැනුම් කටයුතු කරලා, සැලසුමක් හදනවා කියලා තමා ඉදිරියට ගියේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාර්මික කමිටුවට යෝජනා කරන්න කැමතියි පොඩ්ඩක් මැදිහත් වෙලා, දෙපැත්තෙ තියෙන මල් ගස් ටික අයින් කරන්න කියලා, ජනතාව දැනුවත් කරන්න වැඩපිළිවෙළක් හදනව නම්, වාහන ගමනාගමනයට වගේම, පදිකයින්ට ගමන් කරන්නත් පහසු වෙනවා ඒ මාර්ගයේ.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාර්මික සේවා කමිටුවේ සභාපතිතුමාව දැනුවත් කිරිමට කටයුතු කරන්නම් මේ සම්බන්ධව.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙය සභාවට අයත් සියලුම මාර්ගවල ක්‍රියාත්මක කරන්න කියලා අදහසක් ඉදිරිපත් කරනවා.ගැම ගමකම ඔය ප්‍රශ්නය තියෙනවා.දිලීන් මන්ත්‍රීතුමා කිවුව වගේ පෞද්ගලිකව කතා කරොත් ප්‍රශනයක් වෙනවා.ඒ නිසා සභාව මැදිහත් වෙලා ඒ කටයුත්ත කරනව නම් ගොඩක් හොඳයි.

**සභාපතිතුමා :-**
ඒ වගේ ඒවට අපි ගොඩක් මැදිහත් වෙලා මැනුම් කටයුතු සිදු කරනවා.පෙළක් අය අපිට ලිඛිතව දන්වනවා.පෙළක් අය අපිට නිර්ණාමිකවත් දන්වනවා.සමහර පාරවල්වල අඩි 8 යි තියෙන්නේ.සමහර පාරවල් වල අඩි 8 ට කොන්ක්‍රිට් දැම්මහම, ඒ ගොල්ලෝ හිතන්නේ පාර තියෙන්නේ අඩි 8 කියලා.ඒ ගොල්ලො ඒ එක්කම තාප්පයක් බඳිනවා.මන්ත්‍රීතුමා කියන කතාව සම්පූර්ණ ඇත්තක්.අපි ඒකට මැදිහත් වෙලා, පුළුවන් ඒවා අපි මැනුම් කටයුතු කරලා තියෙනවා.සමහර ඒවට අපි පවර ගන්න සුදානම් වෙලා තියෙනවා.අපි ඒවා නිසි ආකාරයෙන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.10.17 වන දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.03.2025.10.23 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ ප්‍රශ්නයක් තියෙනවා, ඒක රට දෙදල්ගහවත්ත වෙන්දේසි ඉඩමෙන් ප්‍රාදේශිය සභාව සතු ඉඩම් කැබැල්ලක්, අපිට ලැබිලා තියෙනවා.ඒක ක්‍රීඩා සමාජයක් එකට කැමැත්ත ප්‍රකාශ කරලා තියෙනවා.නමුත් ඒ වෙන්දේසි වත්තේ ඉන්න සියලුම දෙනා අකමැත්ත ප්‍රකාශ

කරලා ලිවුමක් දීලා තියෙනවා මේක, වෙන්දේසි වත්තේ අපිට,අයින් කරපු කොටසක් මේක.මේකේ වෙනත් අයට දීලා අපේ ගෙවල්වලට හානියක් වෙන්න පුළුවන්,ඒ පිරිස් රාත්‍රිකාලයේ මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්න පුළුවන්, එතකොට අපට කරදරයක් වෙන්න පුළුවන් කියලා මතවාදයක් ඒ ගොල්ලෝ ගෙනැල්ලා තියෙන්නේ.ඒක අපි මොකද්ද කරන්නේ, ලබා දෙනවාද ? මොකද කරන්නේ.

**සභාපතිතුමා :-**
ඇත්තටම සුමිත් මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් අපි සොයන කොට, සාමාන්‍යයෙන් අපි ඉඩමක කට්ටි වෙන් කරලා, එහෙම කොටසක් වෙන් කරන්නේ, අපි සොයලා බැලුවා.ඒ වපසරියේ අයට තමා ඒක අයිති.ඒ ගොල්ලොත් එක්ක සුහදව කතා කරලා තමා අනිත් අයට සහභාගී වෙන්න පුළුවන්.මොකද ඒ ගොල්ලන්ගේ පහසුකම් සඳහා තමා ඒ භූමිය වෙන් කරලා තියෙන්නේ.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
එතකොට අපි එදා ආපු තරුණයන්ට කැමැත්ත ප්‍රකාශ කළා.මං හිතන්නේ ඔබතුමත් එක්කත් කතා කළා.ඒ තරුණයන්ට දුන්නට කමක් නෑ ඒ ගොල්ලොත් කැමතියි.නමුත් ඒ ගොල්ලො කියන්නේ මේක දීලා රට දවල්ට අනවශ්‍ය විදිහට හැසිරෙයිද, කතා බහ කරයිද,කියලා.දැන් අපි ඒ ගොල්ලන්ට අනුමැතිය දෙනවද?

**සභාපතිතුමා :-**
ඒ ගොල්ලෝ මේකෙ නීතිමය තත්ත්වය දන්නැතුවද දන්නෙත් නැනේ.ඒ හින්ද ඒ ගොල්ලොත් එක්ක අපිත් සුහදව කතා කරමු.ගමේ අයටත් ඒක පරිහරණය කරන්න දීලා, ගමේ අයටත් කියන්ක ඕනේ හැබැයි,මේක අනිත් ගෙවල් වලට නිවාසවලට කරදරයක් නැතුව, සුහදව පරිහරණය කරන්න කියලා.අපි අවශ්‍ය නම් අවශ්‍ය ප්‍රතිපාදන, සභාව විදිහට දෙන්න පුළුවන්කමක් තියෙනව නම්,අපි ඒවත් දෙමු එතනට.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි කමිටුවෙදී කිවුවේ සභාපතිතුමා කියපු විදිහටම තමා.අපි එදා දැනුවත් කළා ඒ දෙමාපියන්ටත්.මේක මේ කාගෙවත් නෙමේ, කණ්ඩායමත් එක්ක එකතු වෙලා, ඒ වැඩේ කරන්න. අනිත් එක තමා, එල්ලෙ ගහන්න, ක්‍රිකට් ගහන්න , එතන ඉඩ මදි.ඒ හින්දා වෙලිබෝල් නෙට්බෝල්, බැට්මින්ටන් වගේ දේවල් කරන්න කියලා උපදෙස් දුන්නා.තණකොළ ටික කපලා සුද්ද කරලා දෙන්න යෝජනාවකුත් ගියා.පිටින් ඇවිල්ල සෙල්ලම් කරන්න දෙන් නෑ ඒ ගොල්ලෝ.වටේ කට්ටියට සෙල්ලම් කරන්න පොඩි තීරුවක් තියෙන්නේ.ඒක ලොකු ගැටලුවක් ඇති තැනක් නෙමෙයි.ගන්ජ ගහන එක අරක්කු බොන එක, එකනෙ අපි දැන් වලක්වගෙන යන්නේ.ඒ වගේ මතයක් ඒ ගොල්ලන්ගේ ඔළුවේ තිබුණා.එයාලට තිබ්බ ගැටලුව තමයි පිටින් කට්ටියක් ඇවිත් මෙතන ආක්‍රමණය කරයි, ඊට පස්සේ ගැටලු මතුවෙයි කියලා.එහෙම ගැටලු මතු වෙයිද කියලා අපිට කියන්න බෑ.

ඒ අනුව මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.10.23 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.04.2025.10.30 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.10.30 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.05.2025.10.30 වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.
ඒ අනුව මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.10.30 වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.06.පරිසර හා සේවා පහසුකම් කමිටුව -නොපැවැත්විණි.**

**සභාපතිතුමා :-**
මං හිතනවා මේක ඉදිරියේදී අත්‍යවශ්‍ය එකක් තමයි පරිසර හා සේවා පහසුකම් කමිටුව.මං කියනවා හැකි ඉක්මනින් මේ කමිටුව ගන්න කියලා.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම පරිසර හා සේවා පහසුකම් කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරනවා. මේ මස 19 වෙනිදට දාගත්ත අපි කමිටුව රැස්වෙන්න.

**සභාපතිතුමා :-**
අපි මෙතන දී දැනුවත් කරනවා, ඒ කමිටුවේ සිටින සියලුම දෙනාට 19 වෙනිදට පරිසර හා සේවා පහසුකම් කමිටුවට සහභාගී වෙන්න කියලා.

**සභාපතිතුමා :-**
**08. ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා,වෙනත් වාර්තා**
**08.01.2025 ඔක්තෝම්බර් මස ආදායම් වියදම් වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025 ඔක්තෝම්බර් මස ආදායම් වියදම් වාර්තාවමහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**08.02. 2025 ඔක්තෝම්බර් මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025 ඔක්තෝම්බර් මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**09.ගෙවා අවසන් බිල්පත්**
**09.01.2025 ඔක්තෝම්බර් මස ගෙවීම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.
ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025 ඔක්තෝම්බර් මස ගෙවීම් වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**10.වෙනත් කාරණා**
**10.01**.පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම.

**සභාපතිතුමා :-**
මම මෙතනදී විශේෂයෙන් ම ඉල්ලා සිටිනවා අපි පෞද්ගලික යෝජනා ඉදිරිපත් කරනකොට අපේ සභාවේ වපසරියට, සභාවේ යම් යම් තිරණවලට යටත්ව, වැඩි වේලාවක් ගන්නේ නැතුව අතයවශ්‍යා කාරනා පමනක් අපි පැහැදිදිලි කරමු.එහෙමනම් පේද්ගලික යෝජනාවලට මෙතැන් සිට කාලය වෙන් කරනවා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම දැනට මාස දෙකකට විතර කලින් යෝජනාවක් දැම්මා,මගේ අතින් කිසිම දැනුම් දිමක් කළෙත් නැ.දැනට ටිපර් 6 ක් මං මුදලින් දාල දුන්නා ඒ ගොල්ලන්ට.ගල් ටික ඒ ගොල්ලෝ අරන්.දැනට වැලි ටික හේදිලා ගිහිල්ලා තියෙනවා.ඒ පැත්තේ ගම්වාසින් මට කියල තිබුණේ වසන්ත මන්ත්‍රිතුමා ඒකට විරුද්ධ වෙලා,සභාවට ඇවිල්ලා දිල තියෙනවා කියලා.එහෙම සම්බන්ධ වෙනව නම් එතුමාගේ නමින් දුන්නත් කමක් නැ,ඒ වියදම් ටික දරන්න.මේක ඉක්මනින් කරලා දෙන්න.අපි දැනුවත්ව ඒ වගේ යෝජනාවක් දාල මීටිපොල මන්ත්‍රිතුමියට සති දෙකක් තුනක් යනකොට ඒක ලබා දුන්නා.ඒ වගේ දෙයක් අපි සබාවට දැම්මහම ඒක දෙන්න බැරිනම්, බැ කියන්න ඕන.නැත්නම් අපි ගොඩක් අපහසුතාවයට පත්වෙනවා.

**සභාපතිතුමා :-**
වසන්ත මන්ත්‍රිතුමා, මේ අපේ මන්ත්‍රිතුමා කියන්නේ,මෙතුමා යෝජනාවක් දාල තිබුණ වැලි හා ගල් සපයාගෙන තියෙනවා කියලා.ඒකට ඔබතුමා ඒකට විරුද්ධ වුණාද?

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගමේ මිනිස්සු කියන කතා නවත්තන්න බෑ.එතුමාගේ යෝජනාවේ මම අතුරු යෝජනාවක් විදිහට දැම්මා සිමෙන්ති ලබා දිම සුදුසුයි කියලා.වාර්තාවල තියෙනවා ඒක.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
මම දාන්න ඕන යෝජනාවක් කියලා,ඔබතුමා එයාල එක්ක කිවුවලු.මම කිවුවා එයාගේ නමින් හරි මේක දාලා, ඒ මිනිස්සුන්ගේ වැලි ටික හෝදන් යන්න තියන් නැතුව, ගල් ටික තියෙනවා.ඒ ටික දාල දෙන්න,ඉතින් ඒකට අපි මාස දෙකක් තිස්සේ බලා ගෙන ඉන්නවා.ඒකට කිසිම ප්‍රතිචාරයක් නැති නිසා තමයි මේ යෝජනාව දාන්නේ.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙතුමා ඒක යෝජනා කළා.ඒකට මම අතුරු යෝජනාවක් කළා ඒතුමන්ලා කොන්ක්‍රීට් ගල් වැලි සපයාගෙන තියෙනව නම්, සිමෙන්ති ලබා දිම සුදුසුයි කියලා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ඔබතුමාට මතක් කළා කිවුවා ගම් වාසීන්.එතකොට ඔබතුමා කියලා තියෙනවා, යෝජනාව ඔබතුමයි දාන්න ඕනේ කියලා.තවත් එකක් කියලා තියෙනවා මගෙ ඉඩම් තියෙනවා නේද කියලා.මගෙ ඉඩම් ඉතින් ගම පුරාම තියෙනවා.ඒක හින්දා මගෙ ඉඩමක් ගැන හිතන් නැතුව,ඒක ඉතා ඉක්මනින් ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරපු වෙලාවේ මම ත් ඒකට අදහස් ඉදිරිපත් කළා.ඒක ක්‍රියාත්මක නොවුනද කියලා මට ඒකේ වගකීම භාර ගන්න බෑ.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ නගරය සංවර්ධනය කිරිම සඳහා තොරා ගැනීමේ දී,අපේ සභාපතිතුමා, උපසභාපතිතුමා විශාල වශයෙන් මේ පිළිබඳ කැප කිරීම් කළා.ඒ ඒ අවශ්‍ය තැන්වලදී ඇවශ්‍ය තැන්වලට කතා කරලා, කොහොම හරි ඇහැලියගොඩ සංවර්ධනය කිරිම සඳහා තෝර ගත්ත නගරයක් විදිහට පත්වීම පිළිබඳව අපි ඉතාම සතුටු වෙනවා.ඒවගේම දුම්රිය මාර්ගය සඳහාත් විශාල වශයෙන් කැප කිරීම් කරලා තියෙනවා.ඒ පිළිබඳවත් අපි සතුට ප්‍රකාශ කරනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ නගරයේ ටෙලිකොම් ආයතනය අසල පොදු වැසිකිලිය සංවර්ධනය කළ යුතුයි කියලා මීට ඉහත සභා වාරයේදී මම යෝජනා කළා.ඒ යොජනා කරන්න පෙර මම එතනට ගියා බලන්න.ගේට්ටුව ලඟින් ඇතුළටවත් යන්න බෑ, පුදුම කැලෑවක් තිබුණේ.මට ඇතුළත් බලන්න අවශයතාවය තිබුණා.නමුත් යන්නවත් බෑ.මම ඊයෙ ගියා එතනට, ඊයෙ ගියාම හරි ලස්සනට සුද්ද කරලා තිබුණා.මම ගේට්ටුවත් ඇරගෙනම ඇතුළ බලන්න ගියා.සභාපතිතුමනි, ඇතුලේ ටයිල් අල්ලා හොඳට තියෙනවා.ටයිල් එකක් දෙකක් වගේ කැඩිලා තියෙනවා.තව ජල කරාම හයි කරන්න ඕනේ.ජලය සපයන්න ඕනේ.ඒ ඉතුරු අඩුපාඩු හැටියට.මං හිතන්නේ ඒ තරම් ලොකු වියදමක් යන්නේ නෑ මේක සංවර්ධනය කරලා, කාටත් යන්න පුළුවන් විදිහට මුදලක් අය කර ගෙන, කවුරු හරි පුද්ගලයෙක් යොදවලා, ඒ කටයුතු කරන්න.ඉතින් ඒ කරන ලද යෝජනාව ගැන ඔබතුමා ඒ අවධානය යොමු කරලා මේ ආකාරයෙන් කටයුතු කිරීම ගැන මගේ ස්තුතිය පුද කරනවා.

**සභාපතිතුමා :-**
ඒ ගැන මම පොඩි සඳහනක් කරන්නම්.අපේ නගරේ තමයි කැගැල්ල නගරය ඇරුණහම දිගම නගරය.ඉතින් අපිට වැසිකිළිවල ලොකු අඩුවක් තියෙනවා.අපි ප්‍රාදේශිය සභාව පත්වෙලා අපි ඔතනට ගියා ඕක ප්‍රතිසංස්කරණය කරන්න.ඔබතුමා කිවුව වගේ යන්න විදිහක් නෑ කැලෑව තමයි තිබුණේ.එතකොට අපේ කාර්මික නිලධාරී මහත්මයා කියපු කතාවක් තමා,සභාපතිතුමා ඕක අපිට කරන්න බෑ,ඕක CGR එකට අයිති ඉඩමක්.ඕකට අපි මුදල් වියදම් කළොත් අපිට ඔඩිට් එකට යන්න වෙනවා කියලා.ඉතින් ඒ හින්දා තමයි අපි ඕක අතහැරලා දැම්මේ.ඊට පස්සෙ ඇත්තටම අපේ පක්ෂ රැස්වීමේදි මට ඉහළින් ම දෝශාරෝපනය වුණා අඩුම ගානේ, ඇයි මේ වැසිකිළි පද්ධතියවත් සුද්ද කළේ නැත්තේ කියලා.එදා මට හා උපසභාපතිතුමාට අපේ අයගෙන් ම ලොකු චෝදනා ටිකක් ඉදිරිපත් වුණා.ඔය කතා කිවුවට හරි යන්නේ නෑ,ඕ ගොල්ලන් ඊළඟට කියපු දේ තමා,රේල්ලුවේ නම්, රේල්ලුව කාගෙද?කතාවත් ඇත්ත.රේල්ලුවෙත් ආණ්ඩුවේනේ.ඔයාට ඒක ඕන්නම් ඇයි ඔයා ඒක ඉල්ලුවේ නැත්තේ.ඉතින් අපි දන්නවා දුම්රිය පාර හැදෙන්න කාලයක් යනවා.පස්සේ මම හා ආරියදාස මන්ත්‍රීතුමා මැදිහත් වෙලා, ඔබතුමා කිවුව කතාව හරි, ඔබතුමාගෙත් යෝජනාවක් තමා.අපි ඊටපස්සේ කම්කරුවෝ කීප දෙනෙක් දාල සුද්ද කරලා, පුද්ගලිකව මම හම්බුණා ව්‍යාපාරික මහත්මයෙක්.මම කිවුවා මේක මගේ වැඩක් නෙමෙයි,පොදු වැඩක් තියෙනවා,මෙන්න මේක අපිට හදලා දෙන්න කියලා.ඉතින් එතුමා ඊයෙ ඇවිත් තියෙනවා මාව හම්බෙන්න.නමුත් මම ඒ වෙලාවේ හිටියේ නෑ.නමුත් එතුමා කැමති වෙලා අද එතුමාගේ බාසුන්නැහේ කෙනෙක් ඇවිල්ලා ඇස්තමේන්තුවක් අරන් ගියා.ඉතින් මම හිතන්නේ වැඩි දවසක් යන්න ඉස්සෙල්ලා, අපි ඒක හදා ගන්න පුළුවන් වෙයි.අනිත් එක තමයි එතන පසුගිය කාළේ සිද්ධ වුණ දේ තමයි,අපි ඒකට වැඩිය මැදිහත් වුන් නැති හේතුව තමයි,AG Office ළඟ නිවාසවල හිටපු අය එතනට නාන්න පවා යනවා, ඇරලා දුන්නහම.එහෙම වුනහම වලවල් පිරෙනවා.පිරුණහම දුගඳ හමනවා.දැන් ඒ සියලු දෙනාම වගේ බේරුවාන අලුත් නිවාසවලට ගිහිල්ලා තියෙනවා.එතන දැන් ඔබතුමා කිවුවා වගේ අපි කෙනෙක් දාල, අපිට ආදායම නැතත් කමක් නෑ.අපි එයාට ඉබ්බෙක් දීලා තියෙනවා.නාන්න තහනම් කියලා බෝඩ් එකක් ගහනවා.රෑ එතන ඇරලා තියන්න හොඳ නෑ.ඒ හින්දා වෙලාවක් දෙනවා එතන ඇරලා තියන්න.අපි කියන්නේ මුදලක් අය කරලා.අඩුම ගාණේ එයාගේ වියදමට හරි, ලාභයක් ඕන් නෑ ප්‍රාදේශිය සභාවට.ඇත්තටම මැණික් පොළේ අය කියන්නේ,ඒ අවශ්‍යතාව ඇති වුණාහම, සමහර කාන්තාවන්, වෙන යන්න තැනක්.ළඟ දි එක්කෙනෙක් කලන්තෙත් හැදුණා කිවුවා.ඒ හින්දා අපිට පුළුවන් වෙයි ව්‍යාපාරික මහතාගෙත් උදවු ඇතිව වැඩි කාලයක් යනනෙ නැතිව වැසිකිළි පද්ධතිය ලස්සනට කරලා දෙයි කියලා ලොකු විශ්වාෂයක් තියෙනවා.ඒ සභාවේ මුදල් යන් නෑ කීයක්වත්.දාන්න බෑ අපිට සභාවේ මුදල්.දැම්මොත් අපිට ඔඩිට් වෙනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, AG Office එකත් අයිති වෙන්නේ රේල්ලුවේ ඉඩම් කොටස්වලට නේද?

**සභාපතිතුමා :-**
රේල්ලුවේ කියලා තිබුණට රේල්ලුවේ ටික පරිහරණය කරන්නේ, ඒකේ ආදායම ගන්නේ මාර්ග සංවර්ධන අධිකාරියෙන්.නිමාලි හෝටලය හා ඒ ටික ඒවා ඔක්කොම බදු දීලා තියෙන්නෙත්,නාගරික සංවර්ධන අධිකාරියෙන්.රේල්ලුව යන නිසා නැවත වතාවක් ඒවා රේල්ලුවට පවරා ගනිමින් යන්නේ.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
එහෙනම් දුම්රිය දෙපාර්තමේන්තුවටත් අවශ්‍ය වෙනවනේ, ස්ටේෂන්වලත් තියෙනවනේ වැසිකිළි පද්ධතියක්.ඒ නිසා මේක අත්‍යවශ්‍ය කාරණයක් නිසා, මං හිතනවා ඒක අපි සංවර්ධනය කරාට,ඒ ගොල්ලෝ අපිට අනිසි ප්‍රතිඵලක් කරන් නෑ කියලා මං විශ්වාස කරනවා.පිරිසිදුව තියෙන්න ඕන දිනපතා.බොහොම ස්තුතියි.

**සභාපතිතුමා :-**
දැනට අපිට ඒක කරන් යන්න පුළුවන් කිසිම ගැටලුවක් නෑ.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, කොත්විල මාර්ගයේ මිඩ්ලන්ඩ් එක ළඟින් බහින තැන දෙපැත්තේ, කැලේ වැවිලා තියෙනවා දෙපැත්තටම.එතන පාසල් දරුවෝ යන වෙලාවට, සෙනසුරාදට පංති යන වෙලාවට ලොකු පිරිසක් ගමන් කරන මාර්ගයක්.කැලැව නිසා පාරේ අයින් වෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තියෙනවා.මම දැන් එතන පොටෝ එකක් දැම්ම වට්ස්ඇප් එකට.ඒ ගැන අවධානය යොමු කරලා සුද්ද කරලා දෙන්න කියලා කියනවා.ඒත් එක්ක ම සභාපතිතුමා සම්බන්ධීකරණ රැස්වීමට ඒක චක්‍රෙල්ඛයක් මඟින් ආවත්, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් දෙන්නටයි යන්න තියෙන්නේ.ඒක හරි අසාධාරණ ක්‍රියාවක්.මම මේක ඉහළට යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.මොකද අපේ මොනව හරි දෙයක් කතා කරන්න තියෙන ස්ථානය එතන.එදා මම යනකොට 9.10 යි.ඒ වෙලෙත් ඇතුළට යන්න දුන්නෙ නැහැ, මම එළියේ ඉවර වෙනකම්ම හිටියා.ඒ වුණාට ඒවෙලේ මම ඡන්දෙ ඉල්ලපු බලප්‍රදේශය වෙරලු ගස් හේන ප්‍රජා ශාලාවේ කාරණයක් සම්බන්ධව කතා කළා.එතනදී ඇත්තටම මම මගේ අතේ ඒ වෙනකොටත් තිබුණා ඒ සම්බන්ධව තොරතුරු.මොකද මේක මගේ පියා ප්‍රදේශීය සභාවේ ඉන්න කාලේ වුණ සිද්ධියක් හේතුවෙන් මම මේ පත්තර පිටුව තියාගෙන ඉන්නවා.මේක 2013 ජනවාරි 07 වෙනි සඳුදා පත්තරේන් ගත්ත එකක්.මේකෙ ප්‍රජා ශාලාව සම්බන්ධ විශේෂ තොරතුරු රාශියක් තියෙනවා.මේ ප්‍රජා ශාලාව කාටවත් පෞද්ගලික පරිහරණයක් නෙමෙයි.ඒක පියා සිහිපත් වීම සඳහා වෙරලු ගස්හේන ජනතාවට හදා දීපු ඉඩමක්.ඒක මං හිතන්නේ,ඒ වෙලේ ඒක ප්‍රකාශ කරන්න තිබුණා මට ඒ වෙලේ ඇතුළේ හිටිය නම්.මට ඒ අවස්ථාව නැති වුණා.ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරනවා.මං හිතන්නේ මේ ප්‍රජා ශාලාව සම්බන්ධව ගමේ දෙතුන් දෙනෙක් මාත් එක්ක, කතා කරා මේක සම්බන්ධව කතා කරන්න කියලා.ඒක හින්දා තමයි මම තාත්තට කතා කරලා,පියාට කතා කරලා මේ තොරතුරු ටික ගත්තේ.ඒ හින්දා සම්බන්ධීකරණ කමිටුවට,මම හිතන්නේ, අපි පක්ෂ විදිහට 07 ක් ඉන්නවා.පක්ෂ 07 ක් නියෝජනය වෙනවා.එතනට එක්කෙනෙක් දෙන්නෙකුට වැඩිය අපිට නියෝජනය ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා ඉහළට දැනුම් දෙන්න කියලා.මං හිතන්නේ අපේ ප්‍රදේශීය සභා සභිකවරු ලංකාවේ එකිනෙක පැතිවලින් කුඩු සම්බන්ධව ඒ ඒ පවුල්වල අය මේ වෙනකොට අහුවෙමින් යනවා.ඒ සම්බන්ධව මාගේ විරෝධතාවය ප්‍රකාශකරනවා.අප්‍රසාදය ප්‍රකාශ කරනවා.ඒත් එක්ක ම මට හිතෙනවා ඉස්සරහට අපිටත් දේවාලයක් හදන්න වෙයිද කියලා ඔබතුමාගේ දිස්ත්‍රික් නායකයා පවා පාර්ලිමේන්තුවේදී කතා කරලා තියෙනවා,මං ඒක ගැන කණගාටුව ප්‍රකාශ කරනවා, දේවත්වයෙන් සලකනවා කියලා දෙවිවරු.මං හිතන්නේ කොහොමද කියන්න දන්නෙ නෑ, ඒක ගැනත් මගේ විරෝධය ප්‍රකාශ කරනවා.ගොඩක් ස්තුතියි සභාපතිතුමා.කොත්විල මාර්ගයේ කටයුත්ත ඉක්මනින් කරලා දෙන්න කියලා ඉල්ලනවා.

**සභාපතිතුමා :-**
ඇත්තටම කොත්විල මාර්ගය පෞද්ගලික යෝජනාවක් විදිහටත්,අපිට සභාවට ඇවිල්ල තියෙනවා.ඒක මම අදාළ විෂය කරන නිලධාරියට ඒක යොමු කරලා තියෙනවා.ප්‍රදේශීය සම්බන්ධීකරණ කමිටුවේ, ඒක එක ආසනයක් ඉලක්ක කරගෙන කරපු වැඩක් නෙමෙයි.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මට පොඩ්ඩක් සමාවෙන්න.මට තව එක දෙයක් තියෙනවා, කියන්න.ප්‍රජා ශක්ති වැඩසටහන..ප්‍රජා ශක්ති වැඩසටහනේ සභාපතිවරයා වෙන්නේ මගේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමා නම් කරන කෙනා.මං හිතන්නේ එතන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා තමා ප්‍රධාන වෙන්නේ.එතනදී අපිට යන්න වෙන්නෙත් ඇප්ලිකේෂන් එකක් දාලා,ඒ සභාවට ඒ විදිහට.මං ඒ ගැනත් මං මේ වෙලාවේ මම විරෝධය ප්‍රකාශ කරනවා.

**සභාපතිතුමා :-**
සම්බන්ධිකරණය කමිටුව ගැන ගත්ත තීරණය ඇහැලියගෙොඩ සම්බන්ධීකරණ කමිටුවට විතරක් ගත්ත තීරණයක් නෙමේ.පොදුවේ මුළු දිවයිනටම ගත්ත තීරණයක්.ඒ හින්ද අපිට මොකුත් කන්න බෑ,නමුත් යෝජනාවක් විදිහට අපිට කරන්න පුළුවන් වෙයි.නමුත් එකට සභාවේ තීරණයක් ගන්න බැරි වෙයි.අපි කලින් න්‍යායාය පත්‍රය දෙනවනේ.ඒ හින්දා ඒ දිනේට සම්බන්ධ වෙන දෙන්නට තම තමන්ගේ ප්‍රශ්නය යොමු කරලා තමයි මේ වැඩ කටයුත්ත කරන්න සිද්ධ වෙන්නේ.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි ඇහැලියගොඩ පොල ගැන කතා කරන කොට, පොළේ වතුර බිල් ලයිට් බිල් රුපියල් හැටදාහක් අසූදාහක් අපි සභාවෙන් ගෙවනවා කියලා තක්සේරු කරලා තියෙනවා.පොළේ ලයිට් පද්ධතියේ මොකක් හරි තාක්ෂනික ගැටලුවක් තියෙනනේ, සුවිච් එක ඔන් කරාහම ඔක්කොම ලයිට් ටික පත්තු වෙනවා.දවල්ට බල්බ් 13 ක් ලොකු බලබ් පත්තු වෙනවා.වැඩකට නැතුව තමයි ඒ බල්බ් ටික දවල් කාලයේ පත්තු වෙන්නේ.එක සවිච් එකකින් මේ බල්බ් ඔක්කොම පත්තුවෙන එක තමා ගැටලුව තියෙන්නේ.ඒකට

මීටර් හයි කරනකොට ඒ ගොල්ලන්ට ඒක පැවරුව නම් එහෙම විදුලිය අපතේ යැමක් වෙන් නෑ.එහෙම මීටර් හයි කරලා හදන්න පුළුවන්නම් ගොඩක් හොඳයි කියලා මම යෝජනා කරනවා.

පදික වෙලඳාම ගත්තොත් ගොඩක් කඩවල,සෙන්ටර් එක ගත්තහම අඩි 50 ක් දෙපැත්තට බෙදෙන්න ඕනේ.ඒකට අමතරව පාරේ තමයි එගොල්ලෝ රථවාහන නවත්තන ටික පවා පාරෙන් අරගෙන,ඒ ගොල්ලෝ කඩ කාමර හදලා බදුත් දීලා තියෙනවා.අතන පළතුරු කඩේ කඩ කොටස් දෙකක් බදු දිලා තියෙනවා.පාරට අදාළ ටිකෙන් තමා ඒ ගොල්ලෝ සල්ලි හම්බ කරන්නේ.මිනිසුන්ටත් ඒක අපහසුතාවයක්.ජේමට් එකේ යනකොට බැග් එහෙම හැපෙනවා ඇගේ .ඒ වගේම කලින් සභාවේ,විශේෂයෙන්ම අතුරලිය මන්ත්‍රීතුමාට ස්තුති කරන්න ඕනේ,ගියපාරට වඩා අද අඩුවෙන් කතා කළේ,ලෙඩවෙලා ඉන්න හින්දා.ගියපාර 52 වතාවක් නැගිටලා තියෙනවා.

**සභාපතිතුමා :-**
කඩකාමර ගැන කියපු එක ඇත්ත.මන්ත්‍රීතුමා සැහෙන උනන්දු වෙනවා පොල ගැන,අපිටත් සමහර අවස්ථාවල දොස් කියනවා.ඒ ගැන බොහෙම ස්තුතිවන්ත වෙනවා.ඔබතුමත් පැමිණෙන්න 21 වෙනිදට, අපි පොළේ නිත්‍යානුකූල කට්ටිය අපි කැඳවල තියෙනවා.ඇත්තට අපිට එතනදී ලොකු තීන්දු තීරණ ටිකක් ගන්නවෙනවා.ඒ වගේම තමයි අපිට ඉදිරියේදී පොලිසියට නියෝග දෙන්න වෙනවා, අපි අදුරගෙන තියෙනවා,නිරික්ෂණය වෙලා තියෙනවා,උපදේශන කමිටු,වෙලඳ සංගම්, පොලීසිය,MOH එක එක්ක සාකච්ඡා කරලා තියෙනවා.තිරණ ගන්න විතරයි දැන් තියෙනනේ, පදික වෙළඳාම් සම්බන්ධව.අපි ඉදිරියේදී ඔය ගැටලු ටික විසඳන්න සූදානම්.ඒ සඳහා පියවර ගන්නවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෝගල ක්‍රිඩා පිට්ටනියේ කාණු පද්ධතියේ ප්‍රශ්නය මං මීට කලිනුත් මං කිවුවා.UD එකට ඔබතුමා දැනුවත් තලා ද දන්නේ නෑ.දැන් මාස තුන හතරක් වෙනවා එක කියලා.

**සභාපතිතුමා :-**
ඇත්තටම UD එකත් එක්ක සාකච්ඡා කරලා තියෙන්නේ.UD එක හෙට, ඒ කියන්නේ 12 වෙනිදා මේ නගර සංවර්ධනය ගැන මේ ස්ථානයේ දි පවත්වන්න සූදානම් කරලා තියෙනවා.මම ඔබතුමාගේ ඒ යෝජනාව ගැන කතා කරන්නම්.

**සභික දිලීන් කරුණාපාලමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන් ම මං මතක් කරන්න කැමතියි, අපි එකඟතාවයකට ආවා, අපි දාන යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා කියලා.මේ සැරේ මම යෝජනා දෙකක් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරිම සඳහා මම භාර දීලා තියෙනවා.ඒ යෝජනා දෙක න්‍යාය පත්‍රයේ නෑ.පළවෙනි යෝජනාව තමා වැලිගම ප්‍රාදේශිය සභාවේ සභාපති ලසන්ත වික්‍රමසිංහ මැතිතුමාගේ ඝාතනය පිළිබඳව ශෝකය ප්‍රකාශ කිරීමේ යෝජනාව.අපි ප්‍රාදේශිය සභාවක් විදිහට අපේ සහෘර්දයෙක්, පක්ෂ විපක්ෂ බලන්න අවශ්‍ය නෑ.ඔබතුමා වගේ ඔය පුටුවක වාඩිවෙලා ඉන්න, වැලිගම ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා අමු අමුවේ ඝාතනය කරලා තිබ්බා මහ දවාලේ.එතකොට ඒ වෙනුවෙන් අපි ප්‍රාදේශිය සභාවක් වෙනුවෙන් ශෝකයක් ප්‍රකාශ කරලා නෑ මේ වෙනකන්.ඒ ශෝකය ප්‍රකාශ කරන යෝජනාව මම මේ සභාවේ න්‍යාය පත්‍රයට දැම්මත්, හැබැයි ඒ පිළිබඳ කිසිම සැලකිල්ලක් දක්වලා නෑ මේ ගරු සභාවෙන්.ඉතින් ඒ ගැන හරිම කනගාටු වෙනවා, අපි දන්නවා මේ ආණ්ඩුව බලයට පත් වුනේ මිනිසුන්ට දහසක් බලා පොරොත්තු දීලා, ජාතික ආරක්ෂාව පිළිබඳ ටියුෂන් දෙන්න බංකු අරගෙන එන්නන් කියපු ඒ අය ආණ්ඩුව පාලනය කරද්දී, නමුත් අද මහ දවාලේ මිනිස්සු මරා දාන තත්ත්වයකට පත් වෙලා තියෙනවා.එසේ මෙසේ පුද්ගලයින් නෙමේ,ජනතාව විසින් තෝරා පත් කර ගත්තු, ජනතාව විසින් තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කරපු, සභාපතිවරයාව තමා ඝාතනය කරලා තියෙන්නේ.ඉතින් මේක ඔබ තමුන්නාන්සේලාට වගේම අපිටත්, මේ අවධානමේ තමා අද වෙනකොට ජීවත් වෙන්න වෙලා තියෙන්නේ, මේ රටේ තියෙන ආරක්ෂක තත්ත්වයත් එක්ක.මම දැක්ක පහුගිය දවසක ජනාධිපතිතුමා, පාර්ලිමේන්තුවට ආවේ වාහන තුනකින් නෙමේ, වාහන හතරකින්.එබලාට මතක ඇති වාහන තුනකින් එනවා කියලා තමා එතුමා මැතිවරණ සමයේදී ප්‍රකාශ කළේ. නමුත් වාහන හතරකින් ආවේ.ඒ තරම් අධිආරක්ෂිත කලාපය තුළ, වාහන හතරකින් ඇවිත් තමා එතුමා අය වැය කතාව ඉදිරිපත් කළේ.නමුත් අපිට යුතුකමක් තියෙනවා,ප්‍රාදේශිය සභාව නියෝජනය කරන මන්ත්‍රිවරු විදිහට,සභාපතිවරු විදිහට,උපසභිපතිවරු විදිහට, එතුමාගේ ඝාතනය පිළිබඳ, ශෝකය ප්‍රකාශ කිරිමට අපිට යුතුකමක් තියෙනවා.හැබැයි ඒ යුතුකම අපි විසින් පැහැර හැරලා තියෙනවා.ඔබට මතක ඇති තංගල්ල ප්‍රාදේශිය සභාවේ නිලධාරීන්ට යම්කිසි අනතුරක් වුණා බදුල්ල පහු කරලා එනකොට,බස් එක පෙරලිලා කිපදෙනෙක්, ඒ අවස්ථාවේ දී මිය ගියා.අපි ඒ අවස්ථාවේ දි, අපි ඒ වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කළා.හැබැයි මේ අවස්ථාවේ ශෝකය ප්‍රකාශ කිරිම මග ඇරලා තිබ්බා, මං දන්නෙ නෑ මේක ආණ්ඩුවේ කුමන්ත්‍රණයක්ද කියලා මං දන්නෑ.කෙසේ වෙතත්, අපි දන්නවා ඒ වැලිගම ප්‍රාදශෙ◌ිය සබාවේ බලය හුවමාරු කර ගන්නකොට විශාල ගැටුමකින් තමා එතුමා සභාපති බවට පත් වුණේ.ඒ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් විදිහට අහිංසක දරු තුන් දෙනෙක්ගේ පියෙක්,ආදරණිය සැමියෙක්, ඒ ප්‍රදේශ වාසින්ගේ කැමැත්තෙන් පත් වෙච්ච සභාපතිවරයෙක් ඒ ආකාරයෙන් මිය ගියා.ඇත්තටම මේ වෙලාවේ කණගාටුව ප්‍රකාශ කරන්න කැමතියි.ඔබතුමන්ලාට පුළුවන් නම් මේක අපේ යෝජකාවක් විදිහට වැලිගම ප්‍රාදේශිය සභාව හා එතුමාගේ පවුලේ ඥාතින්ට මේ අපේ ශොක ප්‍රකාශය යවන්න කියලා මං ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අනිත් කාරණාව තමයි, දිර්ඝ කාලයක් තිස්සේ කල් දමා ඇති පලාත් සභා මැතිවරණය පැවැත්විමට ආණ්ඩුව දිරි ගැන්විමේ යෝජනාව,2016 පලාත් සබාව විසුරුවට පස්සේ, සබරලමුව පළාත් සබාව, උව පළාත් සභාව මම හිතන්නේ 2017 විසුරුවේ.මේ අවුරුදු 9 ක කාලය තුළ, පළාත් සභි මැතිවරණය තියාගන්න බැරි වෙලා තියෙනවා.නමුත් මේ ආණ්ඩුව බලයට පත් වෙනකොට,දැන් අවුරුද්දක් වෙන කොට ඇවිල්ලා.බලයට පත්වෙන කොට කිවුවා මැතිවරණ සිතියම කිසිසේත් අකුලන්නේ නෑ කියලා.හැබැයි දැන් ප්‍රමාණවත් කාලයක් තිබුණා, මේ පලාත් සභා මැතිවරණය තියන්න.අපි බලා පොරොත්තු වෙනවා මේ අය වැයෙන්, සල්ලි වෙන් කරලා තියෙනවා.නමුත් ජනාධිපතිතුමා කිවුවේ, ඔන්න සල්ලි වෙන් කරලා තියෙනවා, ඔබ සියලු දෙනා එකතු

වෙලා, අවස්ථාව තියෙනවා පනත සම්මත කරගන්න.සංශෝධනය කර ගන්න.හැබැයි ඒක නෙමේ කියන්න වටින්නේ,අපි හැමෝමත් එක්ක එකතු වෙලා, මේ පනත සංශෝදනය කරලා, පලාත් සබා මැතිවරණය තියන්න ඔන කියන වාක්‍ය නෙමේ, එතුමා එතන දී ප්‍රකාශ කළේ.මට මතකයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා කලින් මුදල් නැති අවස්ථාවේදී, රුපියල් බිලියන 10 ක් වෙන් කර ගන්න, බැරි අවස්ථාවේ දි කියපු ප්‍රකාශය ම තමයි අනුර කුමාර ජනධිපතිතුමා පර්ලිමේන්තුවේ දි මෙවර අයවැය කතාවේ දි ප්‍රකශ කළේ.ඉතින් ඒ ගැන කන ගාටු වෙනවා.මම කැමතියි යෝජනාවක් විදිහට ඉදිරිපත් කරනව නම් මේ පලාත් සභා මැතිවරණය ඉක්මනට තියලා මේ ජනතාවගේ කැමැත්ත ආපහු විමසලා, ඒ පළාත් සභා මැතිවරණයෙන් එක්කෝ ආණ්ඩුව බලය ගනී,නැත්නම් විපක්සය බලය ගනී.ඒ කෙසේ වෙතත් පළාත් සභා මැතිවරණය තියන්න කියන අදහස ඉදිරිපත් කරන්න කැමතියි.එතන දී පුළුවන් මේ ආණ්ඩුව තවදුරටත් ඉස්සරහට බලයේ ඉන්නවා ද, නැද්ද කියන ජනතා විශ්වාසය තහවුරු කර ගන්න. අපි විශ්වාස කරන අන්දමට දැනට නම් මේ ආණ්ඩුව යන වැඩපිළිවෙළත් එක්ක ජනතාවගේ විශ්වාසය පළුදු වෙලා තියෙනවා.මම උදාහරණ කියන්නම් මෙවර අයවැයේ දී විශාල ප්‍රමාණයක් නව බදු හඳුන්වලා දීලා,අපි දැක්කා ප්‍රාදේශිය සභාවේත් නව බදු හඳුන්වලා දීලා තියෙනවා.මොකද ඒක කරන්න දෙක් නෑ.IMF එකෙන් කියලා තියෙනවා, බදු අය කරගන්න කියලා.කෙසේ වෙතත් අලුතින් බදු කිපයක් හඳුන්වලා දිලා තියෙනවා.වාහන ආනයනය කිරිම මත 2.5% ක වගේ බද්දක් අලුතින් හඳුන්වලා දීලා තියෙනවා.ඊට අමතරව සෙස් බද්ද වැඩි කරලා තියෙනවා.ඒ අනුව ලංකාවේ පාරිභෝගිකයෝ පාරිභෝජනය කරන ඉලෙක්ට්‍රොනික භාණ්ඩවල මිල වැඩිවීමේ අවධානමක් තියෙනවා.ඊයෙ වෙනකොට අපි දැක්කා කැප්පෙටිපොල ආර්ථික මධ්‍යස්ථානය අවට උද්ඝෝෂණයක් සංවිධානය කරලා තිබ්බා ගොවීන්.අල ගොවියා, ළූනු ගොවියා අපහසුතාවයට පත් කරන විදිහට ආණුඩුවේ වැඩපිළිවෙළක් යනවා.මඩකාලා, ගොයම් කාල ආපු නාමල් කරුණාරත්න ඇමතිතුමාගේ අවධානය කිසිසේත් ඔවුන්ට ලැබිලා නෑ. කිවුව විදිහට ආණ්ඩුව ක්‍රියාත්මක වෙන්නේ නෑ.ඉතින් මේ තත්ත්වයන් උඩ ආණ්ඩුව දැඩි විදහට මිනිසුන්ගෙන් ඈත් වෙලා ඉන්න විදිහක් අපිට පේන්න තියෙනවා.ඒ අනුව, පළාත් සභා මැතිවරණය කල් දමනවාදෝ අපට සැකයක් ඇති වෙනවා.පළාත් සභා මැතිවරණයෙන් පුළුවන් ඒ බව තහවුරු කර ගන්න.

ඊට පස්සේ ප්‍රජා ශක්ති වැඩසටහන ඊයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තුළ පැවැත් වුණා.ඉතින් මම අහන්න කැමතියි ඔබතුමාගෙන්, පැල්පිටිය කොට්ඨාශය ජයග්‍රහනය කළ අපිට ආරාධනාවක් තිබුණ්නෑ ඒ ප්‍රජා ශක්ති වැඩසටහනට සම්බන්ධ වෙන්න.දැන් මේක ඔබතුමන්ලා කියපු ජනතාවට දුන්නු, ඒකද මේ දේහපාලන සංස්කාතිය.අපිව, බහුතර ජනතාව විසින් අපි තේරී පත් වුනත්,ඔවුන්ගේ අවශ්‍යතා,අවමනාවන් ඉටු කරන්න අපිට අවස්ථාව, දිගින් දිගටම මගහරින ස්වභාවයක් තමා අපිට පේන්නේ.ඒ වෙනුවෙන් ඔබතුමාවත් කතා කරන්න, අපිවත් සම්බන්ධ කරගන්න.කොට්ඨාශ මන්ත්‍රිතුමා සම්බන්ධ කර ගන්නව නම්,අනිත් කොට්ඨාශවල,මාවත් සම්බන්ධ කර ගන්න, මේ වැඩසටහන් වලට.මොකද අපිව විශ්වාස කරලා ජනතාව ඡන්දෙ දිලා තියෙනවා ඔවුන්ට වැඩ කිරීම යුතුකම අපිට තියෙනවා.

ඊට අමතරව ගිය මාසේ 6.31යෝජනාව සමස්ථ ලංකා අන්තර් දිස්ත්‍රික් ළමුන් ප්‍රවාහනය කිරිමේ සංගමයත් එක්ක,උපසභාපතිතුමා කිවුවා සාකච්ඡාවක් දාලා, මේ මාසේදී ඒ ප්‍රගතිය කියන්නම් කියලා.හැබැයි ඒ පිළිබඳ කිසිම ප්‍රගතියක් අපි දන්නෙත් නෑ.ඒ පොළ භූමිය ඔවුන්ට ලබා දෙනව ද නැද්ද කියලා.මං දන්නෑ එකෙ කාර්යක්ෂමතාවය කොතනද තියෙන්නේ කියලා.ඒ වගේ ම 6.42 යෝජනාව ක්‍රිඩාපිටියේ ගාස්තු නිර්ණය කිරිම සඳහා සාකච්ඡාවක් කරනවා කිවුවා.නමුත් ඒ සාකච්ඡාව සිදු වුණෙත් නෑ.මං දන් නෑ, හෙට අනිද්දා ගැසට් කරනවා 2026 සඳහා ගාස්තු, එතකොට මේ ක්‍රිඩාපිටියේ කසළ කලමණාකරණය පිළිබඳ ගාස්තුව ඒ ගැසට් පත්‍රය තුළ නැතිවෙයි.ඒ පිළිබඳ මේ සභාවට දැනුම් දුන්නෙත් නැ.6.17 තිබ්බා වෙළඳ සංගමය පුළුල් කිරිම ගැන සාකච්ඡාවක් කරලා,ප්‍රගතිය දැනුම් දෙන්නම් කියලා, ඒකත් නෑ.මං දන්නෑ අපි මෙතනට ඇවිල්ලා, කොහොමත් මම ඉස්සරහට සංවර්ධන යෝජනා ඉදිරිපත් කරන් නෑ.අපිට ලොකු විශ්වාසයක් තියෙනවා ඔබතුමන්ලගේ ඔය නව දේශපාලන සංස්කෘතිය හරහා අපිට ප්‍රතිපාදන වෙන් වෙන්නේ නැ කියලා.ඒ හින්දා සංවර්ධන යෝජනා ඉදිරිපත් කරන් නෑ.නමුත් අපිට මේවා කතා කරන්න, මිනිසුන්ගේ ප්‍රශ්න කතා කරන්න න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න, ඒවට අවස්ථාව දෙන්න.හැබැයි ඒ ප්‍රගතිය, ඒ කාර්යක්ෂමතාවය අපි මේ සබාවතුළ දකින් නැ.මම හිතනවා මේ කාර්යක්ෂමතාවය දිගින් දිගටම රැක ගන්න බැරි වුණොත් මේ සභාව, මිනිසුන්ගේ ජනතා විශ්වාසය නැතිවෙන්න ඉඩකඩ වැඩියි.සහෝදර මන්ත්‍රිවරයෙක් විදිහට තමයි මේ පිළිබඳව එබතුමන්ලට ප්‍රකාශ කරන්නේ.මෙතනින් ම පේනවා මේ කාරණා තුනක් පිවිබඳව මේ මාසයේ දී අපෙ සභාව දැනුවත් කරනවා කිවුවට, ඒ පිළිබඳව කිසිම ප්‍රගතියක් මේ සභාව තුළ ප්‍රකාශ කළේ නෑ.

ඊට අමතරව වත්සලා මන්ත්‍රිතුමිය යෝජනා කළා,කාන්තා කමිටුවක් පිළිබඳ, මං හිතනවා එතුමියට සමහර වෙලාවට මඟ ඇරෙන්න ඇති.සභාවෙන් ඒ ගැන විමසිමක් කළා නම් එතුමි ඒ ගැන සුදානමින් ඉන්න ඇති ඒ පිළිබඳ සවිස්තරාත්මක් විස්තරයක් කරන්න.නමුත් ඒ පිළිබඳ උනන්දුවක් සභාව දැක්වුයේ නෑ.ඉතින් ඒ ගැනත් කනගාටුව ප්‍රකාශ කරනවා.ඒ වගේම අවසාන වශයෙන් රංජිත් බණ්ඩාර මන්ත්‍රිතුමා කිවුවා, සිමෙන්ති කොට්ට කිපයක් ලබා දෙන්න අනිත් ඔක්කොම සම්පත් ටික හොයාගෙන තියෙන්නේ,ඒ ටික ඒකරාශී කරලා අර අහිංසක ජනතාවට යන්න එන්න පාර හදලා දෙන්න උදව් කරන්න කියලා. මේ සභාව ඒක කිසිම තැකීමකට ගත්තේ නෑ.ඊට අමතරව ගරු වසන්ත මන්ත්‍රිතුමා විසින් කිවුවලු එකේ වගකීම එතුමාට භාර ගන්න බෑ කියන ප්‍රකාශය මේ සභාවේ දී කිවුවා.කොට්ඨාශයේ මිනිස්සු දැන ගන්න ඕනේ කොට්ඨාහයෙන් තේරී පත් වුණු මන්ත්‍රි තුමා,එතකොට ඡන්දය දුන්නු, ජනතාවට ඒ වගකීම, රංජිත් මංත්‍රිතුමා මෙච්චර මහන්සිවෙලා ඉද්දී, එතුමාට ඒ වගකිම ගන්න බැරි වුණා.ඉතින් ඒක හරිම කනගාටුදායක තත්ත්වයක්.මෙන්න මේ තත්ත්වය නෙවෙයි නව දේහපාලන සංස්කෘතියෙන් බලා පොරොත්තු වුණේ.ඉතින් මේ ඔබතුමන්ලා මේ යන ගමන,මං දන්නෑ, ජනතාව විශ්වාස කරන විදිහට නෙමේ යන්නේ,මේ විදිහට දිගින් දිගටම ගියොත් ඉදිරි පළාත් සභා මැතිවරණයේ දි අනිවාර්යෙන් ම මේ මාලිමා ආණ්ඩුව පරාජය වෙනවා කියන එක මේ වෙලාවේ මතක් කරමින් මගේ කතාව අවසන් කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔය සඳහන් කරන ගෝමරගල වත්ත මාර්ගය,මම ග්‍රාමිය සංවර්දන යෝජනාවලට ඇතුළත් කරලා තියෙනවා.2026 යෝජනාවටත් ඇතුළත් කරලා තියෙනවා.නමුත් මම කියන්නේ මේ උගත් මන්ත්‍රිවරු

දෙන්නට වටහා ගන්න බැරි වෙන්න පුළුවන්.ගමේ මිනිසුන්ට අවබෝදයක් නැති වෙන්න පුළුවන්, අපේ රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමා යෝජනාවක් කරලා තියෙද්දී මාස 6 ක් යනකන්, මට තවත් යෝජනාවක් කරන්න බෑ.ඒක සභාවේ නීතියක්.මං කියන්නේ ඒකයි මට මැදිහත් වෙන්න බැරි, එතුමා යෝජනාවක් කරලා තියෙන කොට ඒ යෝජනාව ක්‍රියාත්මක වුණා හෝ නොවුණා හෝ මාස 6 ක් ඉක්මයන තුරු මට නැවත යෝජනාවක් කරන්න බෑ, මේ සභාවේ.ගමේ මිනිස්සුන්ටත් මට කියන්න තියෙනනේ ඒක තමා.නමුත් එතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කරන්න පුළුවන් ප්‍රතිපාදන තියෙනව නම් , කරන්න විදිහක් තියෙනව නම් මන් නැවතවාරයක් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ,සිමෙන්ති ලබා දෙන්න,මමත් කැමතියි එකඟතාවය පළ කරන්න.මම කොතනකවත් කියලා නැ, එතුමා යෝජනා කළා කියලා, එකට ප්‍රතිපාදන දෙනන්න එපා කියලා.මගෙ දකුණු කරදන කොට්ඨාශයේ සියලුම මාර්ග ටික මේ මන්ත්‍රීවරු 36 දෙනාම යෝජනා කරලා ක්‍රියාත්මක කරලා දෙනව නම්, මම බොහොම කැමතියි.අපි පෞද්ගලිකත්වයක් අරමුණු කරගෙන වැඩ කරන්නේ නෑ.අපිට ඕනේ ගමේ මිනිසුන්ට වැඩක් කෙරෙන්න.අපි නම ගහ ගන්න ඒ මාර්ගයේ යන්නෙත් නෑ.සංවර්ධන ව්‍යාපෘතියට අපි නම දාන්නෙත් නෑ.මොක ද අපි දන්නවා මහජන මුදල්වලින් වැඩ කෙරෙන්නේ.අපිට පුද්ගලයෝ වශයෙන් මතු වෙන්න කිසිදු අවශ්‍යතාවයක් නෑ.ඉතින් මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමා සඳහන් කරන විදිහට,සිමෙන්ති කොට්ට ලබා දෙන්න ප්‍රතිපාදන තිබෙනව නම්.මම ඉල්ලා සිටිනවා ලබා දෙන්න කියලා.නමුත් සිමෙන්ති විතරක් මේ මොකද කොන්ක්‍රීට් වැලි ගල් මට සපයා දෙන්න පුළුවන්කමක් නෑ.එතුමාගේ යෝජනාව ක්‍රියාත්මකවුණා හෝ නොවුණා හෝ මා 6 ක් යන තුරු මට මේ සභාවේ මේ යෝජනාව කරන්න බෑ කියන එක විතරයි මම කියන්නේ.නමුත් මම ග්‍රාමීය සංවර්ධන යෝජනාවලිය තුළ(පැහැදිලි නෑ) බොහොම ස්තුතියි.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයෙන් පටන් ගන්නම්.එතුමා මතු කළේ,එතුමා ගල් වැලි ප්‍රශ්නය විසඳලා තියෙන්නේ.සිමෙන්ති ටිකක් ලබා දෙන්න කියලා කියන්නේ.මං දන්නැ ඉස්සසෙල්ල තුෂාරි මන්ත්‍රීතුමිය යෝජනාවක් ගෙනාවා,සභාවේ ඒකමතිකව අනුමත කරලා, සිමෙන්ති ටික ලබා දුන්නා.ඒ ක්‍රියාපටිපාටියම ඒ ක්‍රියා මාර්ගයම,සද්භාවය ගැන කතා කරන සභාව තුළ, රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමාට යොමු වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මම අසනිප නිසා අද අඩුවෙන් කතා කළේ.

පොල භූමිය අද වෙනකොට සැලකිය යුතු මට්ටමකට සංවර්ධනය වෙලා තියෙනවා.පිරිසිදුභාවයකුත් මේවෙනකොට තියෙනවා.ඒ සේවකයොම යොදා ගන්නඑ්ඒ පිරිසිදු කරන කටයුතුවලට.ඒත් එක්ක ම මම මීට අවස්ථා කීපයකදීම මතු කළා ජලය බැස යන ගලි වලවල්වල අවශ්‍ය කොන්ක්‍රීට් රාමුව නැති, රාමුව නැති ගලි වලවල් දෙකක් තියෙනවා, ඒ සඳහා අවධානය යොමු කරන්න.ඊට අමතරව සභාවට ඇවිල්ල යෝජනා කළා ප්‍රතිලාභියෙක්, වහලේ පීල්ලක් ගැලවිලා අනතුරු දායකයි කියලා,මට පොරොන්දු වුණ ආකාරයට ඒ ප්‍රතිලාභියා පොඩි දැල් කවරයක් අරන් ගැට ගහලා අනතුරුදායක කියන එක හඟවන්න, දැනටත් ප්‍රදර්ශනය කරලා තියෙනවා.සභාවට ඇවිත් දැනුම් දීලා තියෙනවා ,අනතුරු දායකයි ,මගේ ඔළුවත් ඒකේ හැප්පෙන්න ගියා,ඒ හින්දා අවධානය යොමු කරන්න කියලා.ඒත් එක්ක ම මුන්සීර් මන්ත්‍රීතුමා යෝජනා කළා පොලභූමිය ළග ගස් වගයක් ඉවත් කරන්නයි කාණු පද්ධතිය පිරිසිදු කරන්නයි.මං දන්නැ ඒ ගස් ටික ඉවත් නොකළොත් බැම්මත් හදන්න වෙනවා.බැම්මේ විවිධ චිත්‍ර රටා නිර්මාණය වෙමින් පවතිනවා බැම්ම තුළ මුල් ගිහිල්ලා ගස්වල.ඒ සඳහත් අවධානය යොමු කරන්න කියලත් ඉල්ලා සිටිනවා.

ඊළඟට දම්මුල්ල කරදන මාර්ගයවිශාල සෝදා පාළුවකට ලක්වෙලා තියෙනවා.ඉක්මන් ක්‍රියාමාර්ගයට නොගියොත් දම්මුල්ල කරදන මාර්ගය තැන් කිපයකදිම කාපට් මාර්ගය පළුදු විමට ලක්වෙලා තියෙනවා.ඒ වගේම සමහර තැන්වල කොන්ක්‍රීට් ගැලවීම වාගේම. ඒ සඳහා ඉක්මන් මැදිහත් විමක් අවශ්‍ය වෙනවා.

ඒ වගේම මම ලේකම්තුමාට ස්තුතියක් කර ගන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.පුස්තකාලය ප්‍රතිසංස්කරණය කාලය තුළ රෝහල් භූමිය,පාඨකයන්ට හානි නොවන විදිහට භාවිතා කරන්න පුලුවන් කියලා ලේකම්තුමා ගිය සබාවේ දී ප්‍රකාශ කළා.ඒකෙ ලොකු සාධාරණත්වයක් ඉෂ්ඨ වෙලා තියෙනවා,ඒ පිළිබඳ විශේෂ ස්තුතියක් මේ වෙලාවේ ලේකම් මහත්තයාට ප්‍රකාශ කරනවා.

ඒත් එක්ක ම විලේගොඩ සුසානාගාරය පිළිබඳව මං මීට ඉසේසල්ල් මේ අදහස සභාව තුළ ස්ථාපිත කළා.මේ සුසානාගාරයේ අය කරන ගාස්තුව සම්බන්ධව ගාස්තුව සමාලෝචනය කල යුතුයි,ඒ නඩත්තු කටයු.ුවලට හානියක් නොවන විදිහට.මම අවමංගල්‍ය උත්සව කිපයකට සම්බන්ධ වුණා ප්‍රදේශයෙන් බැහැරව, දෙහිඕවිට ප්‍රදේශයේ අපිට වැඩිය අඩුයි.තව මිනුවන්ගොඩ නගර සභාවේ අය කරන්නේ රුපියල් දහදාහක වගේ මුදලක්.කුරුවිට ප්‍රාදේශීය සභාව රුපියල් 12.000.00 ක වගේ මුදලක් තමා භාවිතා කරන්නේ.ඒ නිසා ඒ සම්බන්ධව සමාලෝචනය කරලා,ගාස්තු අඩු කිරීමට ක්‍රමවේදයක්. හදලා අයවැය ඉදිරිපත් කරනකොටඒකට අන්තර්ගත කරලා ගාස්තු අඩු කිරිමේ ක්‍රමවේදයකට යන්න පුළුවන් නම් හොඳයි කියලා යෝජනා කරනවා.

ඒත් එක්කම මේ සභාවට යෝජනා ඉදිරිපත් කරනවා නිරන්තරයෙන්,අපි කරන යෝජනාවලට වෙන්නේ මොකද්ද කියලා අපිට පසු විපරම් කරන්න ක්‍රමවේදයක් නෑ.යෝජනාවට ලැබුණ ප්‍රතිඵලය මොකද්ද කියලා දැන ගන්න ක්‍රමවේදයක් උදා කරලා දෙන්න කියලා මම යෝජනා කරනවා.

ඒවගේම ගරු සභාපතිතුමා මුලික වටේදී මම මේ ප්‍රශ්නය යොමු කරනකොට කිවුවා මාස 6 ක් වගේ කෙටි කාලයක් තුළ ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි කියලා.තලාවිටිය ජල යෝජනා ක්‍රමය සම්බන්ධව, දැන් මේ දවස්වල නම් වහිනවා.ඊට පස්සේ පායන කාලේ එන කොට, දැන් මාස 5 ක් ගිහින් තියෙනවා සභාව පිහිටුවලා.තව මාසයක් වගේ කාලයක් තියෙන්නේ.තලාවිටිය ජල යෝජනා ක්‍රමයේ දැන් තියෙන තත්ත්වය මොකක්ද කියලා පැහැදිලි කිරිමක් කරන්න කියලා මං ඉල්ලිමක් කරනවා.

ඒත් එක්කම නිරන්තරයෙන ම රේල් පාර නගර සීමාව තුළ ගමන් කරනවා කියලා මාධයවල විශේෂයෙන් ම, සෝෂල් මීඩියාවල නිරන්තරයෙන ම යනවා.මං එතනදි විශේෂයෙන ම මතු කරපු ප්‍රශ්නයක් තමයි, රේල් පාර ගිහපුවහම රෝහල් පිවිසුම් මාර්ගයට ලොකු ගැටලුවක් වෙනවා.දැන් විකල්ප මාර්ගයක් වහයෙන් ජානිස් මාවත සංවර්ධනය කරන්න කියලා මං නිරන්තරයෙන් අවස්ථා කිපයකදී යෝජනා කළා.ඒ ජානිස් මාවත

සංවර්ධනය කරන්න සාකච්ඡාමය ප්‍රවේශයකට යන්න ක්‍රමවේදයක් සූදානම් කරන්නත් කියලා යෝජනා කළා.මේ වෙලාවේ නැවත සිහිගැන්වීමක් කරනවා.ඒත් එක්ක ම මංගල සභාවේ දී යෝජනා කළා, නගරේ සතු වැසිකිළි පද්ධති. මම නම් වශයෙන්ම කිවුවා,ප්‍රතිසංස්කරණය කළ යුතු කියලා. ඒ වගේම දඹුල්ල පොළ භූමියේ තියෙන වැසිකිලි දෙකත් සංවර්ධනය කරන්න යෝජනා කළා.එතකොට මට ගැබිච්ච පිළිතුර තමයි,මේක රේල්ලුවට අයිති ඉඩමක්, එක හින්දා මේකට ප්‍රවේශයක් ගන්න අපිට අවස්ථාව නෑ කියලා. කෙසේ හෝ යම් ප්‍රවේශයක් අරන් තිබ්ම ගැන මං පෞද්ගලිකවත්, කාටහරි ප්‍රතිලාභයක් ලැබෙන නිසා සතුටු වෙනවා.අනිත් එක නගර සංවර්ධනය පිළිබඳව උපසභාපතිතුමා ප්‍රකාශ කළා.බොහොම හොඳයි.හැබැයි ගිය රජයන් විසින් අත්පත් කර ගත් භූමිය තුළ අද විශාල වශයෙන් ස්ථිර ඉදි කිරීම් ඉදි වෙමින් පවතිනවා.කඩා ඉවත් කරන්න ප්‍රතිපාදන ඇති පනතේ.ඉදිකිරීම වලක්වාගන්න ප්‍රතිපාදනත් ඕක ඇතුළේ තියෙනවා.විශාල වශයෙන් අත්පත් කර තියෙන ඉඩම් වල විශාල ඉදිකිරීම් පවතිනවා.ඒ ගැනත් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මං යෝජනා කරනවා.

ඒවගේම මේ රජයේ දෙවන අයවැය ඉදිරිපත් කළා, දින කිහිපයකට ප්‍රථම.ඒකෙදි අපි ණය අරන් තියෙනවා, ඩොලර් මිලියන 37 ක් අරන් තියෙවා මේ කාල සීමාවක් තුළ.ඒත් වැය ශීර්ෂවල වියදම් කරලා තියෙන්නේ 30% කට අඩු ප්‍රමාණයක්.සියලුම වැය ශීර්ෂවල විශාල මුදලක් වෙන් කරලා තියෙනවා.ඒක අතිරික්තයක් වශයෙන් පෙන්වනවා මේ අයවැය තුළ.ණය අරන් තියෙනවා ඩොලර් මිලියන 37 ක්.ඇස්තමේන්තුගත වියදම් කරලා තියෙන්නේ 30% වඩා අඩු ප්‍රමාණයක්.ඒ නිසා මේ රජය යන ක්‍රියාමාර්ග සම්බන්ධව යම් යම් ක්‍රියාමාර්ග ගැනීමේ දී, හොඳම උදාහරණයක් තමයි මත්ද්‍රව්‍ය පිළිබඳ හොඳ ප්‍රචාරාත්මක ක්‍රමවේදයක් තුළ රජය ලොකු ප්‍රවර්ධනයකුත් එක්ක, හොඳ ප්‍රවේශයක් අරගෙන කටයුතු කළා.ඒ ජාතික ජනබලවේගයේ මන්ත්‍රිවරු කිපදෙනෙක් අහුවෙනකොට,ඒකට පොලිස්පති නියෝගයක් නිකුත් වෙනවා, චක්‍රලේඛයක් නිකුත් වෙනවා,මාධ්‍ය ආවරණයට ලක් වෙලා නිකුත් කරනවා.බොරු නම් නිවරදි කරන්න.

**සභාපතිතුමා :-**
අතුරලිය මන්ත්‍රිතුමා පාර්ලිමේනතවේ කතා කරන්න ඒවා, ඔබතුමන්ලගේ මන්ත්‍රිවරු ඉන්නවනේ පාර්ලිමේන්තුවේ.ඒ ගොල්ලෝ අහන් නැත්නම් ඔබතුමාලවත් කියලා දාන්න.ඇත්තටම මෙතන අයවැය කතන්දර වැඩක් නැනේ.ඔබතුමන්ලගේ පක්ෂයේ මන්ත්‍රිවරු එතනට ගිහින් තියෙනවනේ.මෙතන කාලය යනව විතරයි.පාර්ලිමේන්තුවේ අයවැයක් මෙතන කතා කරන එක මං හිතන්නෑ කාලෝචිතයි කියලා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
මං ඒකෙන් අදහස් කළේ, දැන් අපේ අයවැය එනවා ඉස්සරහට.

**සභාපතිතුමා :-**
අපේ අයවැය ගැන කතා කරමු.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
අපේ අය වැය යෝජනා කාලෝචිත විදිහට ඉදිරිපත් කරලා වැය කරන වැය ශීර්ෂවලට මුදල් වියදම් කරන්න කියලා.බොහොම ස්තුතියි අවස්ථාව ලබාදුන්නට.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, කාලය ගැන අපි හැමෝම හිතන්න ඔන තමයි.අපිට තියෙන සභා රීතිවල තියෙනවා, කල්දී ඇති යෝජනාවල 20- (1) හා 20-(4). මේකෙ තියෙනවා සභාවේ න්‍යාය පත්‍රය සඳහා ඇතුළත් කරන සෑම යෝජනාවක් ම සභාවකට තිරනය දීමට බලය දුන් සභා යෝජනාවක් විය යුතුයි.ඒ නිසා අපි ගරු සභාව විදිමත්ව පවත්වාගෙන යා යුතුයි.ඒ නිසා අපි සභා රිතිවලට අනුව මේ සභාව පවත්වාගෙන යන්න යෝජනා කරනවා අපි සියලුම මනත්‍රිවරන්ට අදාළව.

අනිත් එක තමයි, මාධ්‍ය තියෙන නිසා බොරු යන්න බෑ.මාධ්‍ය කරන්නේ වාර්තා කරණය. මාධ්‍ය දන්නෑ, ඇත්ත ද බොරුද දන්නෙ නෑ. නමුත් අපි මන්ත්‍රිවරු හැටියට අපි අපේ අයිතිය පාවිච්චි කරලා අපි, අසත්‍ය සමාජගත කරනව නම්, සභිකයෝ මෙතන කතා කරන දේ තමා වාර්තා කරන්නේ.මාධ්‍ය බලන් නෑ ඒක ඇත්ත ද නැත්ත ද කියලා.මන්ත්‍රිවරුන්ගේ වගකීමක් තියෙනවා, ජනතාව නොමඟ නැති විදිහට මෙතන අදහස් දක්වන්න.වාහනවලට බද්දක් ගහලා තියෙනව කිවුවා,ඒක ඇත්තටම බොරුවක්.විකිණීමෙදී තමා ඒක තිබුණේ.කලිනුත් ඒ බද්ද තිබුණා.මගෙ අවස්ථාව දෙන්නකො.

අනික තමයි ප්‍රජා ශක්ති කියන්නේ මේ ආණ්ඩුවේ.පොහොසත් රටක් ලස්සන ජීවිතයක් හදන්න ආපු ආණ්ඩුවේ, අපි හදා ගත්ත ආණ්ඩුවේ, දුප්පත්කමතුරන් කිරීමේ වැඩසටහන.ඇත්තටම මේකට පත් කර ගන්න ඕනේ අවංකව අවමනාවක් තියෙන අය.ඒ චක්‍රලේඛයේ තියෙනවා, කිසිම පුද්ගලයෙකු නොසලකා හරින් නැතුව සම්බන්ධ කර ගන්නවා කියලා.අපේ වසමේ වෙන පක්ෂයකින් ඡන්දෙ ඉල්ලපු අයත් මං කමිටුවට දා ගත්තා සාමාජිකයෝ හැටියට.කමිටු සාමාජිකයෝ හැටියට සහභාගි වෙන්න පුළුවන් ඕනෙම කෙනෙක්ට.එතන ඒ වැඩේට සද්භාවයෙන් දායක වෙනව නම්.සභාපතිවරු නම් කරන්නේ අනිවාර්යෙන ම ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවේ සභාපතිවරයාගේ නියෝජිතයා, ඒ නිසා.එහෙම තමා ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තුළ සංවර්ධන ව්‍යාපෘති අපි 40 කට වැඩි ප්‍රමාණයක් කරලා තියෙනවා.ඊටත් වැඩියි.වසන්ත මන්ත්‍රිතුමාට කියන්න බැරි එකක්, කලින් දේශපාලන සංස්කෘතිවල තිබුණා, මෙයාගේ යෝජනාව පරිදි, මෙයාගේ යෝජනාව පරිදි. මෙයාගේ අදහස පරිදි ,කියලා සෑහෙන ලොකු බෝර්ඩ් එකකුත් ගහනවා.අපි ඔය කිසිම පාරක, පාරක් වෙන්න පුළුවන්. නිවාසයක් හදල දුන්න එකක් වෙන්න පුළුවන්, හැම එකකම අපි බෝර්ඩ් එකක් ගහන් නෑ.කිසිම මන්ත්‍රිකෙනෙක්ගේ නමක් දාලා බෝර්ඩ් එකක් ගහන් නෑ.මේවා ඇත්තට ම ජනතා මුදලින් කරන දේවල්.මම ඇත්තටම පහුගිය සභාවලදි කිවුවා, ආදාහනාගාරය හදපු එකේ මං කිවුවා මගේ නමත් බෝර්ඩ් එකෙන් අයින් කරන්න කියලා.ගිහින් බලන්න.ආදාහනාගාරය විවෘත කරන ඵලකයේ මගේ නම නෑ.මම කියලා තමා අහක් කර ගත්තේ.අපි මේ යෝජනා දාන්නේ ජනතාවගේ මුදල්වලින්.කොයිකටද මේක

පරිහරණය කරන්නේ,කොයිකටද මේක යොදවන්නේ කියන එක ගැන තිරණය කරන්න තමයි අපි මෙතනට ඇවිල්ලා තියෙන්නේ.ඒනිසා මේ මුදල් ගෙදරන් අරන් ආපුවා නෙමේ.

අනික තමා නගර සංවර්ධනය සඳහාඅපිට විශාල මුදලක්, මං කලින් වතාවේදිත් කිවුවා, රටේම නගර 10 ක් වෙන්වෙද්දී ඇහැලියගොඩත් ප්‍රධාන නගරක් හැටියට අරගෙන මේක අපිට ලොකු ප්‍රමුඛතාවක් අරන් දීලා තියෙන තීණ්දුවක්.ඒකියන්නේ අපිට ලබන අවුරුද්ද වැඩ වර්ෂයක්.අපි ඒකට සූදානම් වෙන්න ඕනේ.අපි යෝජනාත් හදමු.මේවා ඇත්තටම තම රට සංවර්ධනය වෙනවට කැමති අයට මේවට ඉතාම සතුටු වෙන්න පුලුවන්.එහෙම නොවන කෙනෙක්ට මේවා ඇත්තටම කනගාටුවක් ඇතිවෙන දේවල්.

අනිත් එක අය වැයකින් වෙන් වෙන මුදල්, වෙන් කරන්නේ , ඒවා වියදම් කරන්නේ, රාජය නිලධාරීනුත් ඒකට මැදිහත් වෙනවා.ඇහැලියගොඩ සමෘර්ධි සංවර්ධන අයට තමා ලක්ෂ 140 ක් විතර ආවා.ඒකෙන් වියදම් කරලා තියෙන්නේ, කෝටි නමයක් විතර.හරියටම ගාණ දන් නැති නිසා, දල අදහසක් එකතු කළේ.රජයේ නිලධාරීන් පවා(පැහැදිලි නෑ) අනිත් එක තමා පොලිසිය ගැන එක මන්ත්‍රිවරයෙක් කිවුවා බොරුවක්.ඇත්තටම අපි සතුටු වෙන්න ඕනේ, ජනතාව හැටියට අපි සතුටු වෙන්න ඕනේ, වැරද්ද කරන්නේ කවුද කියන එක, කොයි පක්ෂෙද කියන එක නැතුව වැරැද්ද කරන කෙනාට දඩුවම් දෙන රටක් දැන් හැදිලා තියෙනවා.ඒක නිසා අපිට අදාල නෑ එයා මොන පක්ෂයේ ද, එයා පක්ෂයේ ඉහලද පහල ද, සාමාජිකයෙක්ද නැද්ද, ඒ කිසිම දෙයක් බලන්නේ නෑ, රටේ නීතිය දැන් හැමෝටම සාදාරනව ක්‍රියාත්මක වෙනවා.අපි බලාපොරොත්තු වුණේ ඒ රට, මේ සාජ ක්‍රමය මේ ආර්ථික ක්‍රමය, මේ දේශපාලන ක්‍රමය තමා ඉස්සරහට යන්නේ.හැමෝටම පුලුවන් මේකට උදව් කරන්න.මගේ කෙටි දඅහස් දැක්වීම මෙතනින් නවත්තනවා.බොහොම ස්තුතියි.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මත්ද්‍රව්‍යවලට විශාල කතා බහක් ඇති වෙලා තියෙනවා.ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය විකුණන අය. බොන අය, ඉවත් කරනවා කියලා අපි බලාපොරොත්තු වෙනවා.ඒ වගේම අපි ගරු සභාපතිතුමා මත් ද්‍රව්‍ය හා සමාන ගැටලුවක් තියෙනවා මේ ප්‍රදේශයේ විවාත වෙමින් පවතින ස්පා හල්.මේකේ විශේෂ ගැටලුවක් තියෙනවා.ඒ ගැටලුව තමා කාර්යාලවල සාප්පුවල වැඩකරන්න ඉන්න ඒ ගැහැණු ළමයි ඒ ශ්‍රම බලකාය අපෙන් ඉවත් වෙනවා.සාමාන්‍යයෙන් සාප්පුවක වැඩ කරන ගැහැණු ළමයෙකුට රුපියල් 25,000.00 ක් 30,000.00 ක් වගේ ප්‍රමාණයක් තමා මුදල් ලැබෙන්නේ.එතකොට මේ ස්පා ආයතන විවෘත විමෙන් ඒ පිරිස,ඇහැලියගොඩ අය විතරක් යනව කියනවා නෙමෙයි, හැබැයි ලංකාව පුරා මේ අය මාරුවෙන් මාරුවට වැඩ කරන්න යනවා.එතකොට ලංකාවේ 2024 එයාලගේ සංගමයක් තියෙනවා, ඒ සංගමයේ තියෙනවා ලක්ෂ 6 ක පිරිසක් මේ කාන්තාවෝ මේවගේ වැඩ කරනවා කියලා.එතකොට ඒක විශාල ගැටලුවක්.ඔබතුමා කීල්ස් එකෙන් අහලා බලන්න. කාගීල්ස් එකෙන් අහල බලන්න, ගැහැණු ළමයි නෑ.මේ කාර්යාලවල ගැහැණු ළමයි හිඟයක් තියෙනවා.අද අපි අලුතින් ගැසට් කරනවා, බලපත්‍ර ගාස්තු, හැබැයි එතකොට මේකට බෙදෙන විශේෂ බලපත්‍ර ගාස්තුවක් නෑ.හැබැයි අපට පුලුවන් නම් ඉදිරි අවුරුද්දේ ඒ බලපත්‍ර ලබා නොදී ඉන්න හරි, ඒක සභාපතිතුමා හිටපු සම්බන්දිකරණ කමිටුවෙ දීත් කතා වුණා.ඇහැලිගොඩ මේ ආයතන විශාල වශයෙන් මේ ආයතන විවෘත වීගෙන යනවා.ඇහැලියගොඩ සීමාවේ තමා මේ ප්‍රදේශයේ වැඩිම ප්‍රමාණයක් තියෙන්නේ.මේක විශාල සමාජයේ ගැටලුවක්.මේකෙන් ප්‍රදේශය තුළ අනවශ්‍ය මත් ද්‍රව්‍ය විකුණනවා.සභාව විදිහට මේක නවත්වන්න අපිට තියෙන ක්‍රමය තමා අර බලපත්‍රය ලබා නොදීම.මම සභාපතිතුමාට යෝජනා කරනවා අපි සභාවේ යෝජනාවක් ගමු ඊළඟ සභාවේ හරි මේ බලපත්‍රය අපි නිසි විදිහකට, අපි අතුරු ව්‍යවස්ථාවක් හදලා හරි, මේකට අපි ක්‍රියාමාර්ගයක් ගන්න.

ඊළඟ දේ තමා ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ 2002 -2006 කාලේදී තීන්දුවක් ගත්තා පෝය දවසට කඩසාප්පු වහන්න.එතකොට ඒකෙන් බලාපොරොත්තු වුණේ, කඩසාප්පුවල වැඩ කරන සේවකයන්ට නිවාඩු දිනයක් ලබා දෙන්න.ඒකේ ප්‍රධානම දේ තමා අල්ලපු කඩේ ඇරලා තියෙනකොට මේ කඩේ වහන්න බෑ, වෙළදාම කැඩෙනවා.ඔය හින්දා තමා 2002-2006 මම නිවරදි නම්, රත්නායක සභාපතිතුමා හිටපු කාළේ තමා මේ තීන්දුව ගත්තේ.හැබැයි දැන් අපි දැක තියෙනවා කඩ විශාල ප්‍රමාණයක් පෝයට අරිනවා.කාගිල්ස් ෆුඩ්සිටිය වැහුවේ නෑ.ඒ කාගිල්ස් ෆඩ්සිටියත් ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා, ලේකම්තුමා, මන්ත්‍රිවරු ගිහිල්ලා, වහන්න එයාල එකඟ කරගත්තා හැබැයි පොඩි ක්‍රියාමාර්ග ටිකක් ගන්න වුණා.හැබැයි අපි දැන් දකිනවා ප්‍රදේශයේ නැවතත් ඒ කඩටික අරින්න පටන් අරන් තියෙනවා.සේවකයන් අපිට කියලා තියෙනවා ඉස්සෙල්ල අපිට තිබුණ මාසෙකට දුන්න නිවාඩුව දැන් නෑ,එයාල වැඩ කරන සේවකයොයි හිමිකරුවෝ එදාට නිවාඩු ගන්නවා ඒ කාලයේ.ඉතින් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, නැවත පොඩ්ඩක් කල්පනා කරලා ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්න කියලා.

ඊට පස්සේ සම්බන්දිකරණ කමිටුව සම්බන්ධයෙන් කතා වුණා.විපක්ෂයේ මන්ත්‍රිවරු දෙන්නටයි චක්‍රෙල්ඛය අනුව යන්න තියෙන්නේ.ඒකෙ ගැටලුවක් නෑ.හැබැයි ගරු සභාපතිතුමා ඔබතුමා කිවුවා වත්සලා මන්ත්‍රිතුමිය කිවුවහම, තියෙන ප්‍රශ්න ටික ඔක්කොටම, යන දෙන්නට දෙන්න, එතකොට ගිහිල්ලා කතා කරයි කියලා.හැබැයි එතන කතා කරන්න අවස්ථාව දෙනවද කියලා එතන පොඩි ගැටලුවක් තියෙනවා.එතන අපේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රිවරුත් 7 දෙනෙක් හිටියා.සභාපතිතුමනි සම්බන්දිකරණේදී ඔබතුමා කිවුවා, දෙන්නෙක් යන්න කිසිම ගැටලුවක් නෑ.ඊටපස්සේ වත්සලා මන්ත්‍රිතුමිය ඊට පස්සේ යෝජනා කළා සම අවස්ථාව දෙන්න කියලා.ඔබතුමා දුන්නු පිළිතුර තමා සියලු දෙනාගේ ප්‍රශ්න යන දෙන්නට ඉදිරිපත් කරන්න කියලා.හැබැයි එතන කතා කිරීමට අවස්ථාව පොඩ්ඩක් මදි කියලා ඔබතුමාටත් තේරෙන්න ඇති.ඔබතුමාලගේ ආරියදාස මන්ත්‍රිතුමාවවත් වාඩි කෙරෙවුවා.විනය සම්බන්ධ ගැටලු නෑ.ගරු සභාපතිතුමා දැනුවත් කරන්න අපි පක්ෂ 7 කින්, දැන් 6 ද දන්නෙත් නෑ, හයකින් මන්ත්‍රිවරු 16 දෙනෙක් නියෝජනය කරල ඉන්නේ .මේ 16 දෙනාගේ තියෙන ගැටලු දෙන්නෙක් ඉදිරිපත් කරනකොට දෙන්නා බෙදාගෙන ඉදිරිපත් කරන කොට එක්කෙනෙක්ට 8 පාරක් අවම එක්කෙනෙක්ට නැගිටින්න වෙනවා.ඒ සම්බන්ධව එතුමා දැනුවත් කරන්න කියලත් ඉල්ලා සිටිනවා.

ඒ වගේම මෙවර අයවැයෙන් ගරු ජනාධිපතිතුමා ඇහැලියගොඩ නගරය ඇතුළු නගර 10 ක් සංවර්ධනය කරන්න මුදල් වෙන් කරන්න තීන්දු කළා.ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.මේ තීන්දුව 2014 වසරේත්

ඇහැලියගොඩ එවකට හිටපු සංවිධායක වරිය ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිතුමියගෙ මැදිහත් වීමෙනුත් ලැබුණා.හැබැයි ඒ අවස්ථාව ඉස්සරහට යන්න වුන් නෑ, මොකද ආණ්ඩු පෙරලියත් එක්ක.මම ඔබතුමාලට සුභ පතනවා, ඒ යෝජනාව ඒ විදිහට ගෙනියන්න, ඔබතුමාලගේ ආණ්ඩුව නෙපෙරලී ඉස්සරහට ගිහිල්ලා, පෙරලන්නෑ, ඉස්සරහට ගෙනියන්න ලැබේවා කියලා.

**සභාපතිතුමා :-**
විශේෂයෙන් ම පෝය දවසේ කඩ වහන්න, අපි ඒක තනි තීරණයක් ගන්නේ නෑ.මගෙනම් පුද්ගලික අදහස තමා අපි බෞද්ධයො නම් වහලා දාලා යන්න පුළුවන්.ඒක බල කරන්න අවශ්‍යතාවයක් නෑ.මුස්ලිම් අය බලන්නකෝ.ඒ අය හරියට 12 ට වහනවා.කවුරුවත් කියලා නෙමේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.ඒකෙ යෝජනා වුණේ පොයට පන්සල් යන්න නෙමෙයි.ඒකෙ තිබුණේ වැඩ කරන සේවකයන්ට සහ හිමිකරුවන්ට නිවාඩු ගන්න.ඒක තමා ඒ දවස්වල තිබුණු තීරනය.ඒකට තොර ගත්ත ලේසි දිනය තමා පෝය දවස.මං දන්නෑ වෙළඳ සංගමය මොන දෙයක් කරනවද කියලා.ඒ දවස්වල හිටපු, ඔබතුමා ඒ දවස්වල හිටපු අයගෙන් හොයලා බලන්න.ඒක තමා ඒ දවස්වල තිබුණු අවශ්‍යතාවය.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මමත් ඔබතුමාට කියනවා.මේක ඇත්තටම සභාවට කරන අපකීර්තියක්.එක්කො අපි සභාවෙන් තීරණයක් අරගෙන, අපි කියමු කඩවල් ටික අරින්න කියලා.එහෙම නැත්නම් කියමු වහන්න කියලා.

**සභාපතිතුමා :-**
මොකද ඒ.මොකද අපි තීරණ ගන්නේ.එයාලට ස්වයං අයිතියක් තියනවනේ.මගෙ කඩේ මං වහනවා.සේවකයින්ට නිවාඩු දෙන්නෙ මම.ඒව අපි බලෙන් දාන්න ඕන් නෑ.මොකද අපි ආගම් බලෙන් දාන්නේ.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
සභාවෙන් නීතියක් දැම්මනේ කඩවල් වහන්න කියලා.

**සභාපතිතුමා :-**
අපි නීති දැම්මෙ නෑ.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
කලින් තිබ්බ සභාවකින්.

**සභාපතිතුමා :-**
මට නම් ඒවා හොයාගන්නත් බෑ.මම නම් හිතන් නෑ එහෙම ගන්න පුළුවන් කියලා.මම හිටපු ලේකම්තුමාට තමා මං කෝල් එක ගත්තේ.එහෙම නීතියක් තාම හොයා ගන්න බැරි වුණා කිවුවා.මොකටද අපි නීති දාන්නේ.හිතනවද ලක්ෂ කියක්, අපි ගණන් බැලුවා කෝටි 30 ක් 40 ක් පුමාණයක් යනවා, කුරුවිටට හරි අවිස්සාවේල්ලට හරි.එකක් ඒක. අනික තමා වහනව නම් අපි ලංකාවම වහමු.මුළු රටම වහමු.ඇහැලියගොඩ විතරක් වැහුවහම ඇහැලියගොඩින් යනවා පනවල පැත්තට යන්න කවුරු හරි. ඒ කෙනෙකුට අඩුම ගානේ තේ එකක් බොන්න.මේක ප්‍රයෝගික නෑ.මේක එක එක්කෙනාගේ, හිතුමනාපෙ අපි සාමාන්‍යයෙන් තීන්දු තීරණ ගන්නේ නෑ.මොකද අපි බලලා කතා කරලා,වෙළඳ සංලමය එක්ක එක තැනකට ඇවිල්ලා,වෙළඳ සංගම් ගොඩක් තැන්වල කියලා තියෙනවා,සමහර තැන්වලින් ඉන්නවා කුරුණෑගලින් ඇවිල්ලා.ඒ කට්ටිය කියනවා දවසක් වැවුවහම ඒ කට්ටිය කුරුණෑගල ආපිට යන්න වෙනවා.එතන ලොකු මුදලක් වැය කරන්න සිද්ධ වෙනවා.කෝටි 30 ක් 40 ක් වෙන නගරයකට යනවා කියන්නේ අපේ වෙළෙන්දොන්ට කරන හරි අසාධාරණයක්.(ඝෝෂාව)

මෙතින් මතුවුණු තවත් කාරණයක්.පළාත් සභා මැතිවරණය ගැන කිවුවා.එන අවුරුද්දෙ පළාත් සභා මැතිවරණය තියන්න ප්‍රමාද වෙනව නම් අපි උද්ඝෝෂණය කරමු.මොකද අපිටත් මේ පළාත් සභාව ඕනේ.එතකොට අපිට පෙන්නන්න පුළුවන් කොහොම ද රටේ තියෙන ප්‍රගතිය කොහොමද කියලා.ඇත්තටම අපි ඉන්නේ එතන.පළාත් සභා අනිවාර්යෙන් ම තියන්න ඕනේ.අපිට අන්න එදාට බලා ගන්න පුළුවන්, පවතින රජයට කැමතිද, අකමැතිද කියලා.අනිවාර්යෙන් ම පළාත් සභා තියෙන තැන එකෙන් ම ඉන්නවා.ඒ ගැන බයවෙන්න එපා.

ඒවගේම වැලිගම ප්‍රාදේශිය සභාව ගැන කිවුවාතඒකට මං හිතන්නේ උත්තරෙත් දුන්නා.පාතාල, වෙඩිතැබීමේ සංයුතිය.එක ඉස්සරහට කියන්න ගියොත් එහෙම නම් වැලක් ප්‍රාදේශිය සභාවේ. මේ තංගල්ලේ සභාපති ඉදන් මට කියන්න ගියොත් එහෙම පැය ගානක් යයි.ඒක හින්දා දවස් තුනක් ගියෙ නෑ මන්ත්‍රීතුමා, දෙක හමාරයි ගියේ.අවශ්‍ය කෙනා අල්ලලා හිරේ දාලත් ඉවරයි.ඒ හින්දා ඒ බරින් අපි කරනවා. මේක මේ කුඩු අල්ලන වැඩේ, පාතාලය මර්දනය කරන වැඩේ,මේක රටේ විතරක් නෙමේනේ,අපි මේක කවුරුත් දන්නවා.අන්තර්ජාලයක් තියෙන සම්බන්ධතාවයක් තියෙන්නේ.ඒකට ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව භාර ධූර කරතව්‍යක් භාර අරන් තියෙනවා.ඒක ජාතික ජනබලවේගයද, යූ.ඇම්.පී. ද ශ්‍රී ලංකාද කියලා අපිට අදාළ නෑ.වැරදි තියෙන්න පුලුවන් පෘතජන මිනිස්සු අතරේ.හැබැයි අපි පහුගිය කාළේ ඔබතුමන්ලා දැක්ක නේද? ගුවනින් ගිහිල්ලා කුඩු කාරයෝ බදා ගන්න සීන්, අපි ළඟ නෑ.ජාතික ජනබලවේගයෙ ද කිසිම ප්‍රශ්නයක් නෑ, අත්තඩංගුවට ගන්න ඕන්නනම් අත්තඩංගුවට ගන්න ඕනේ.

ඊළඟට ප්‍රජා ශක්ති, තොරන්නේ, සභාපතිකම දරන්නේ, ප්‍රාදේශිය සම්බන්ධිකරණයේ සභාපති.එයා තමා තොරන්නේ මේකෙ සභාපතිවරයා කවුද කියලා.අපිට ඒකට මෙතනදී තිරණයක් ගන්න බෑ.

ඒවගේම අතුරලිය මන්ත්‍රීතුමා කිවුවා, ආදාහනාගාරයේ මුදල අඩු කරන්න කියලා.කිසිසේත්ම මම පුද්ගලිකවත් මම ඒක අඩු කරන්න කැමති වෙන් නෑ.මොකද අපිට සභාවට මුදල් ඕනේ.කුරුවිට ප්‍රාදේශිය සභාවෙන් ඔබතුමා

දැන් කතා කරලා අහන්න, ඒ ගොල්ලෝ මට යෝජනා කළා 16,000.00 ක් කරන්න.අපි 15,000.00 ක් කරනවා කියලා මේ පාර.මම කිවුවා අපි 15,000.00 ම තමා කරන්නෙ, අපි වැඩි කරන්නෙ නැ කියලා මම කිවුවා.ඒගොල්ලො 12,000.00 කිවුවා ඔබතුමා හරි.හැබැයි ඊළඟ අය වැයේදී ඒගොල්ලො 15,000.00 කරන්න යෝජනා කළා මොක ද? ඇත්තටම අපිට ප්‍රාදශේය සභාවේ මොකක් හරි සංවර්ධන වැඩක් කරන්න තියෙනව නම්, අපිට මුදල් අවශ්‍යයි.ඉතින් මේ අපිට ලැබෙන මුදල් අඩු කරන්න, මං නම් හිතන් නෑ අපිට ඒක සුදුසු ක්‍රියාමාර්ගයක් කියලා.

ඒවගේම දම්මුල්ල ටොයිලට් ගැන ඔබතුමා කිවුවා.මේ වෙන කොට අපි ටෙන්ඩර් එකක් දීලා, ටොයිලට් ටික හදාගෙන යනවා.ඒවගේම ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අයත් පුස්තකාලය තියෙනවා ටවුමේ.එතනත් අපි ටෙයිලට් දෙකක් හදන්න අපි, කවුරු හරි ඉන්නව නම් අපි ටෙන්ඩර් නිකුත් කරලා තියෙන්නේ.ටෙන්ඩර් ගත්තට පස්සෙ එතනත් තව ටොයිලට් දෙකක් හැදෙනවා.ඔය ටික තමා උත්තර දෙන්න ඕන කාරණා ටික විදිහට තියෙන්නේ.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ සභාවේ මන්ත්‍රිවරුන්ට සාමවිනිසුරු තනතුර ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියලා මම මතක් කරනවා.මොකද මේ වෙනකන් සාමවිනිසුරු පත්වීම් නෑ.ඒ සඳහා දිවුරුම් දීමට අවශ්‍ය කටයුතු සිදුකරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා :-**
ඕක මං හරියට දන්නෙ නෑ.අධිකරණ නීතිඥවරයෙක් හෝ නීතිඥවරියක් ඉදිරියේ දිවුරුම් දිමක් තමා සිදු කරන්නේ.ඔබතුමාගේ අදහස හොඳයි.ඒ ක්‍රමය ගැන මාත් හරියටම අවබොධයක් නෑ.මම ඒ වැඩේට එච්චර කැමති නැති හින්දා.අනිත් අයත් පොඩ්ඩක් බලන්න ඒ නීති රාමුව තුළ අපිට මේ වැඩේ කරන්න පුළුවන් වෙයිද කියලා.

එහෙනම් අපි සභාවේ වැඩ කටයුතු අවසන් කරමු.සියලු දෙනාටම බොහොමත් ම ස්තුතියි.දැන් වේලාව ප.ව 3.10 යි.

බන්ධුලසේන දූණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2025 ක් වූ..................................මස...........දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.